**වෂර් 2022 ක් වූ අගෝස්තු මස 09 වන දින පෙ.ව. 10.00 ට සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**

**මතුගම ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාතර්ාව**

සහභාගිත්වය :- සභිකවරු

01. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
02. ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
03. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. කසුන් හිරෝෂන මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
08. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ. ප්‍රියන්කා දමයන්ති ගුණවධර්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
11. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. එච්.ඩී. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
15. සූරියආරච්චිගේ සුජීව නිමර්ාන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
17. ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. කේ.ඩබ්. නිලූකා දශර්නී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභාමන්ත්‍රිනි
23. දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නොපැමිණි සභිකවරු :-

01. වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
02. අධිකාරිවත්තගේ ප්‍රියන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. දේන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
04. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**07.**තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**08.**මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

නිලධාරින් **:-**

**01.**ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය - ලේකම් (වැ.බ.)
**02.**ජී.ඩී දුලානි සෙනෙවිරත්න මිය - සංවධර්න නිලධාරී (සභා කටයුතු)
**03.**එම්.ෙක්.ඩී.සී.අවන්ති මෙනවිය - සංවධර්න නිලධාරී (සභා කටයුතු)
**04.** ඩබ්.ඒ සුනිල් ප්‍රසන්න මහතා - ආදායම් පරීක්ෂක

මෙදින පෙ.ව. **10.00** ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ. පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්, නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**1.2022.07.12** වන දින පැවති මහ සභා රැස්වීමේ වාතර්ාව සහා අනුමැතිය සලකා බැලීම.

ඉහත සභා වාතර්ාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

මම මුලින්ම කියන්න කැමතියි ලලිත් රණසිංහ එළියෙත් එකයි ඇතුලෙත් එකයි කියන එක. මේ පසුගිය වාතර්ාවේ සභාපතිතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙලා තියෙනවා අර සහරාන් ගම්මානය සම්බන්ධව, ඒක අනුමත කර ගන්න සභාපතිතුමාට මුදල් දෙන්න ඒ වගේ ම යකඩ නැවක් දෙන්න කතා කළා කියලා.

සභාපතිතුමා එදා වාතර්ාවට සඳහන් කළේ පකඩ පැකට් එකකුයි බූන්දිද මොනවද රස කැවිල්ලකුයි ගෙනාව කියලා.හැබැයි එදා ඒක කිව්ව නම් අපි මේක අනුමත කරපු විදිහ වැරදියි කියලා කියනවා.අපි සද්ද නැතුව හිටියා.මොකද දැන් අපට වැටහෙනවා මේක අනුමත කරගෙන තියෙන්නේ සල්ලි ම දීල කියල.ඒ ආයතනයට විරුද්ධ ව මම මගේ කටයුතු කරනවා.ලබන සභාවට නීත්‍යානුකූල ව යෝජනාවක් දාන බව ප්‍රකාශ කරමින් ඒ පිලිබඳව වාතර්ාවේ සඳහන් කිරීම පිළිබඳවත් මාගේ ස්තූතිය පුද කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මේ ෙගාඩනැඟිල්ල ඉඩම් එකේ අනුමත කරල නෑ නේද?.යූ.ඩී. එකෙන් අනුමත කරල නෑනේ.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා

එතකොට සභාපතිතුමා ඒක අනුමත කරල නැත්තම් කොහොමද සභාවෙන් වීදි ලාම්පු හයි කරන්නේ?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මම දැනුවත්ව නම් සභාවෙන් හයි කරල නෑ.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
සභාපතිතුමා නොදැනුවත්ව වෙන දේවල් තමයි ප්‍රශ්නෙ තියෙන්නෙ.අර අපි එදත් කතා කළා හොරවල බිල්ඩින් එක සම්බන්ධ ව. ඒකට ගත්ත ක්‍රියාමාගර්ය මොකක් ද? දැන් මාස තුනකට වැඩිය ඇදෙනවා මේ එක ප්‍රශ්නයක්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ප්‍රාදේශීය ලේකම් තොරතුරු ටික දුන්නහම තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
දැන් මාස තුනක් වෙනවනෙ සභාපතිතුමා ඒකට.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඔබතුමා ළඟට එවන්නද ඒ ගොනුව දැනුවත් වෙන්න.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
ඒකට ගත්තු ක්‍රියාමාගර්යක් තියෙන්න ඕන.මං දැනගන්න කැමති පළවෙනියන්ම අපි ගිය සභාවෙදි කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව එදා කතා කරා.ඒකේ වංචාවක් සිදු වෙලා තියෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මන්ත්‍රීතුමා
ඒක නෙමේ සභා වාතර්ාවේ මොකුත් තියෙනවද දැනගන්න.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මන්ත්‍රීතුමා
ඒක තමයි, සභාව පටන් ගන්න කළින් මම ඒ ගැන දැනගන්න කැමතියි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මන්ත්‍රීතුමා
නෑ මම කියන්නේ න්‍යාය පත්‍රය අනුව යන්න ඕනා.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
න්‍යාය පත්‍රය අනුව ගිහිල්ල හැමදාම ඕක කතා කරන්න වෙන්නෙ නෑ.ඒකයි වෙලා තියෙන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සභාවෙ අපි යෝජනාවක් ගෙනාවා ගිය සභාවෙ කතා කරපුවගෙ සාරාංශය කතා කරන්න අවස්ථාවක් දෙන්න.ඒකටත් අවස්ථාවක් දෙනවා.

ගරු හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
මේකේ ඉඳන් අපි මේ හොරකම් අල්ලන්න කතා කරනවා. ඒකට ගත්ත ක්‍රියාමාගර්යක් නැති වෙනකොට අපි කරන දේවල්වල වැඩක් නැනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
න්‍යාය පත්‍රයේ දැන් තියෙන්නෙ සභා වාතර්ාවෙ දෝශ නම් ඒක කතා කරන්න.ඒකයි යන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමි
සභාපතිතුමා,සහරාන් ගම්මානය සම්බන්ධව උත්තරයක් දෙන්න ඕනා.මොකද මම නියෝජනය කරන කොට්ඨාශයේ තියෙන්නේ .මං හිතන්නෙ මීට පෙර වාතර්ාවෙ සඳහන් වෙච්ච ප්‍රකාශයක් සහ දැන් මේ වාතර්ාවෙ සඳහන් වෙලා තියෙන ප්‍රකාශයක් සම්බන්ධ ව උප සභාපතිතුමා පෙන්වා දුන්නෙ.ඇත්තටම මගෙ කොට්ඨාශෙ මං දැනුවත්ව නම් එහෙම වීදි ලාම්පු හයි කරල නෑ.මගේ පිටින් ගියාද කියල මං දන්නෑ.එහෙම නම් ඒක ප්‍රශ්නයක්. කොට්ඨාශෙ මන්ත්‍රීතුමා හරි සභාපතිතුමා හරි දන්නැතුව එහෙම වෙලා තියෙනවනම් ඒක ප්‍රශ්නයක්.ඒක හොයන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා
මම මේක ඒ වෙලාවෙත් කථා කළා.ඒ වෙලාවේ මෙතුමා හිටියේ නෑ.ඒ වෙලාවේ අපි ඒකට උත්තරය දුන්නා.2012 අනුමත කරල තියෙන්නේ.ඒ වෙලාවේ සභාපතිතුමා හිටියෙ නෑ.හිටපු ලේකම්තුමා සම්බන්ධ කරගෙන ඒ දවස්වල අපි වීදි ලාම්පු දෙකක් දැම්මා.එතකොට සභාපතිතුමා සම්බන්ධ නෑ ඒවට.ඒ වෙලාවෙ අපි ඒකට මේ සභාවට ආපු ගමන් උත්තරය දුන්නා. වීදි ලාම්පු ගෙනත් හයි කරන්න මැදිහත් වෙලා මං ඒක කරල දුන්නා.ඒකට මම තමා මැදිහත් වුණේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂන මුණසිංහ මහතා
මේ සම්බන්ධයෙන් කතා නොකර බෑ. මොකද ඒ වෙලාවේ කාන්ත මන්ත්‍රීතුමාත් මමත්,නිශාන්ත මන්ත්‍රීතුමාත් මට මතක විදිහට උපසභාපතිතුමාත් අපි එතනට ගියා.ඒ ගිය වෙලාවෙ කිව්වෙ, "සභාවෙන් තමයි ලයිට් දාල දුන්නෙ" කියලා. ඒ ගෙවල් තිබ්බ හැටි දැක්ක නම් අනුමත කරේ කොහොමද කියන එකයි ප්‍රශ්නේ. මං ළඟ දැනුත් වීඩියෝ තියෙනවා.මට ඒව දෙන්න පුළුවන්.ඒ මිනිස්සු කරපු ප්‍රකාශ මං ගාව තියෙනවා.

2.ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදන -

නිවේදන යටතේ මම දැනුම් දෙනවා පසුගිය දිනවල අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රී ධූරන්ධර බොන්දුපිටියේ නාගතිස්ස නායක ස්වාමීන්වහන්සේ අපවත් වුණා.ඒකට අපේ සභාවේ නායක ස්වාමීන්වහන්සේ, අපේ උප සභාපතිතුමා ,මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සම්බන්ධ වුණා;කොට්ඨාශේ මන්ත්‍රීවරු සම්බන්ධ වුණා. නාගතිස්ස නායක ස්වාමීන් වහන්සේ මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. මම අවස්ථාව දෙනවා උන් වහන්සේගේ අභාවය වෙනුවෙන් ඒ අවමංගල උත්සවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න.ඒ සඳහා පසුව සභාවක

හෝ නැතිනම් මේ සභාවේ අපේ න්‍යාය පත්‍රයේ ටික අවසන් වුණා ම හරි අවස්ථාවක් දෙනවා.ඒක මම මේ මොහොතේ මතක් කරනවා. උන් වහන්සේගේ අභාවය සම්බන්ධයෙන් ප්‍රෙද්ශවාසීන්ගේ විශාල සංවේගයක් තිබුණා.අපි ඒ අවමංගල උත්සවයේ කටයුතු හොඳින් කරා කියන එක මතක් කරනවා.අපට කරන්න පුළුවන් දේවල් අපේ සභාවේ සේවකයින් යොදවල කරා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි
ගරු සභාපතිතුමනි,මං ඉල්ලා සිටිනවා ගරු සභාවෙන්, පසුවට ෙනමෙයි මුලින් ම ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාවක් දෙන්න කියලා.මන්ත්‍රීතුමන්ලගේ අදහස් දක්වල සභාව මඟින් දැනට විහාරස්ථානයේ වැඩ කටයුතු කරන ඒ ස්වාමීන් වහන්සේට ශෝක ප්‍රකාශයක් ලිඛිත ව ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

3.නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා -
3.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ටෙක්ලා ෆ්ලෝරී මහත්මිය
3.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි තුසිතා ප්‍රියංගනී මහත්මිය
3.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා
3.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න නාකන්දල මහතා

අද දින සභාවට නොපැමිණෙන බව දන්වන ලදී.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මීළඟට තියෙන්නේ යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. ඊට පෙර සංදේශ හා පෙත්සම් යටතේ අවස්ථාව දෙනවා බොන්දුපිටියේ නාගතිස්ස ස්වාමීන්වහන්සේගේ අභාවය පිළිබඳ ව ශෝක යෝජනාවක් ගෙනල්ලා ඒ ගැන කෙටියෙන් අදහස් පල කරන්න.

ගරු උප සභාපති ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා
බොන්දුපිටියේ නාගතිස්ස නායක ස්වාමීන් වහන්සේ අපේ ප්‍රාදේශීය සභාව නියෝජනය කළා. ඒ පමණක් නෙමේ ආගමික පැත්ත විතරක් නෙමේ සමාජීය පැත්ත හොඳට ම බලපු කෙනෙක්.මං දන්න ඉතා ම හොඳ කරුණක් තියෙනවා. ස්වාමීන් වහන්සේ සභාවට එනවා නම් පන්සලේ මොනව හරි තියෙනවා නම් ඒවා මේ ඉන්න හැමෝටම ගෙනල්ලා බෙදනවා.ඒ වගේම සියලු දෙනා එක්ක ම කතාබහ කරලා කටයුතු කරපු කෙනෙක්.සභාවේ සේවකයෙක් දැක්කම කතා කරන කෙනෙක්.ඒ වගේ ම සභාව සංවිධානාත්මක ව ගමනක් යද්දි ඒ සම්බන්ධව මූලිකත්වය ගත්ත කෙනෙක්.මට මතකයි අපි මැලේසියාවේ ගිය වෙලාවෙ අසනීපයක් වුණා ම අපිටත් ඉස්සෙල්ල උදේ ම ගිහිල්ල ඒ අයව බැලුවෙ උන් වහන්සේ .ඒ අවශ්‍ය කරන සියල්ල උන් වහන්සේ ගෙනිහිල්ලා තිබුණා.ඒ වගේ ම ඇත්තට ම කිව්වොත් පන්සලේදි ආගමික පැත්ත කරන ගමන් මේ සභාවට ආපුවාම සභාවෙදි දේශපාලනික කටයුතු කළා. ප්‍රශ්නයක් වුණා ම වුණත් සභාවට සියලු දෙනාව ම ඒකරාශී කරගෙන කටයුතු කරා.අපි ඇත්තටම කණගාටු වෙනවා මේ තරම් ඉක්මනින් හාමුදුරුවෝ අපවත් වීම ගැන.මොකද අසනීප තත්වෙන් හිටියත් ඒ අවසාන දවස් කිහිපයේත් උන් වහන්සේ ඒ චරිතය ම රඟපෑවා. ගමේ මිනිසුන්ට කතා කළා.ලේකම්තුමිය මං හිතන්නෙ දන්ෙන නෑ.කලින් හිටිය ලේකම්වරු සියලු දෙනාම දන්නවා.සියලු දෙනා ම

නාගතිස්ස හාමුදුරුවෝ ගැන බොහොම ආඩම්බරයෙන් කතා කරනවා.මං විශේෂයෙන් ම ස්තූතිවන්ත වනවා සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු කාර්‍ය මණ්ඩලයට. අවශ්‍ය කරන සියල්ල ඉල්ලපු මොහොතේ ම ලබා දුන්නා.අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම සහභාගී වුණා.ප්‍රියංකා මන්ත්‍රීතුමිය,නිමාලක මන්ත්‍රීතුමාත් විශේෂයෙන් ම සහයෝගය දුන්නා. ඒ තරම් ආදාහන උත්සවයක මුළු බර කරට ගත්ත ගමක් මම දැක්කෙ නෑ මම මේ අනෙක් ගම්වලට අපහාස කරනවා නෙමේ.ඒ ගමේ අයට ස්තූතිවන්ත වනවා දේහය පන්සලට වඩම්මනකොට නාගතිස්ස හාමුදුරුවෝ කරපු සේවය මතක්වීම පිළිබඳ ව.එහෙම සෙනඟක් මහ නායක හාමුදුරුවෝ කෙනෙකුටවත් හිටියෙ නෑ.වයසක අම්මල මේ දේහය පිටිපස්සෙ අඬ අඬා ගියේ. ආදාහනය වෙලාවෙ කවුරුවත් කෙටි පාරෙ ගියේ නෑ.ඒ ගමේ මිනිස්සුන්ට මං ස්තූතිවන්ත වෙනවා කවුරුවත් කෙටි පාරෙ නොගිහින් පයින් ම ඒ දේහය පසුපස ගමන් කිරීම පිළිබඳ ව.ඒ ගමේ මන්ත්‍රීතුමන්ලටත් මං කියනව,ඔබතුමන්ලා ඉන්නේ බොහොම වාසනාවන්ත ගමක කියල.හාමුදුරුවෝ ඒ කරපු සමාජ සේවය,ආගමික සේවය මුළු ගම ම අගය කළා.මං මගේ ප්‍රණාමය පුද කරනව ඒ ජනතාවට. ඒ ජනතාවගේ හැසිරීම පිළිබඳ ව සහ දක්වපු ආදශර්ය පිළිබඳ ව. මේ ගමේ මන්ත්‍රීතුමන්ලටත් මං කියනව, ඔබ තුමන්ලා ජනතා සේවකයෝ.ජනතාව ක්‍රියා කළ හැටි ඔබ තුමන්ලා දැක්ක නම්, හරි පහසුයි මේ ගමේ ජනතාව සංවිධානය කරන එක.ඉතින් ස්වාමීන් වහන්සේ අපට ගුරුහරුකම් දුන්නා.අපට උපදෙස් දුන්නා අවශ්‍ය තැන්වල රැක බලා ගත්තා. අපේ ගෙදරක උවමනාවක් කිව්වම මුලින් ම අහන්නෙ මොනවද මගෙන් කෙරෙන්න ඕනා කියලා. අපේ හාමුදුරුවෝ පිළිබඳ ව මගේ ශෝකය පල කරනවා.වෙල්ගම ඇමතිතුමා කිව්ව වගේ නිවන් සුව අත් වේවා කියල මමත් කියන්නේ නෑ.අප අතර නැවත ඉපදේවා කියල මමත් කියන්නෙ.ඇත්තට ම සභාපතිතුමා ඇතුළු ඔබ දෙපළටත්, ඔබ දෙපළ කළ සේවය පිළිබඳවත්,නායක හාමුදුරුවෝ කළ සේවය පිළිබඳවත්,සේවක මණ්ඩලය කළ සේවය පිළිබඳවත් උප සභාපතිවරයා හැටියට මාගේ ප්‍රණාමය පුද කරනවා.නිවන් සුව ම අත් වේවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාගතිස්ස ස්වාමීන් වහන්සේට ප්‍රථමයෙන් ම නිවන් සුව ප්‍රාථර්නා කරනවා!,මොකද උන් වහන්ෙස් අපේ ප්‍රදේශයට ආගමික වශයෙනුත්,සමාජීය වශයෙනුත් සැහෙන්න වැඩ කොටසක් කරපු ස්වාමීන් වහන්සේ නමක්. ප්‍රදේශයේ ජනතාවට දැන් ඇත්තට ම ලොකු අඩු පාඩුවක් වෙනවා. ප්‍රථමයෙන් ම මම කියන්න ඕන සභාව වශයෙන් ඒ අවමංගල්‍ය කමිටුවේ හිටපු ප්‍රධාන සංවිධායක විදියට සභාවෙන් අපට ලොකු සේවයක් වුණා. ඒ ආදාහන කටයුතුවලදි උප සභාපතිතුමාත්,අපේ ස්වාමීන් වහන්සේත්,ලේකම්තුමියගේත් මැදිහත් වීම මත අපට අවශ්‍ය කරන සියලු පහසුකම් සලසලා සභාවෙන් කරන්න පුළුවන් උපරිම සේවය ඒ අවමංගල්‍ය උත්සවය වෙනුවෙන් කරල දුන්නා.ඒ වගේ ම අවශ්‍ය තණකොළ කැපීම්,ගස්වල අතු කැපීම්,යාන වාහන,වතුර සැපයීම් ආදී සියලු ම දේ සභාවෙන් අපට කරල දුන්නා.ඒ වෙනුවෙන් විශේෂයෙන් ම ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම සභාපතිතුමාට, උප සභාපතිතුමාට,අපේ ස්වාමීන් වහන්සේටත්,ලේකම්තුමිය ඇතුලු කාර්‍ය මණ්ඩලයේ සියලු දෙනාටමත් ඒ කටයුතු අපට සාථර්ක ව කර ගන්න අවශ්‍ය සියලු පහසුකම් සලසා දීම සම්බන්ධව අවසාන වශයෙන් ස්තූතිය පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා
බොන්දුපිටිය ප්‍රදේශය වෙනුවෙන් මෙම ප්‍රාදේශීය සභාවට දෙවතාවක් ම පත්වුණ බොන්දුපිටිය නාගතිස්ස ස්වාමීන් වහන්සේ අපි අතරින් ගිය සතියේ සමු ගත්තා.මම පළමු කොට උන්

වහන්සේට නිවන් සුව පතනවා.ඒ වගේ ම ස්වාමීන් වහන්සේ පිළිබඳ ව වචන කිහිපයක් කතා කරනවා නම් මම පාසල් කාලයේ පටන් දීඝර් කාලීන ව ඇසුරු කළ කෙනෙක්. ඒ ස්වාමීන් වහනසේ තමන් ගාව කිසි දෙයක් තියා ගන්නෙ නැතුව මිනිස්සු වෙනුවෙන් දීපු කෙනෙක්. දේශපාලනික වශයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී භූමිකාව හැසිරුව උන් වහන්සේ අපවත් වෙන තෙක් ම පක්ෂයේ කළුතර දිස්ත්‍රික් ලේකම් ධූරය දැරුවා.ප්‍රදේශය වෙනුවෙන් ලොකු මෙහෙවරක් ඉටු කළා.අධිවේගී මාගර්ය ඉදි වෙනකොට එහි සම්බන්ධීකරණ කටයුතු කරමින් බොන්දුපිටිය ප්‍රදේශයට විශාල රැකියා ප්‍රමාණයක් ගෙන ගියා.තමාගේ ගම,ප්‍රදේශය, එහි ජනතාව වෙනුවෙන් කැප වුණ ජීවිතයක් ගත කළේ.තව දිගු කාලයක් මේ රට වෙනුවෙන් සේවය කරන්න පුළුවන් වුණා නම් බොන්දුපිටිය ප්‍රදේශයට ඒක විශාල ශක්තියක් වෙනවා.මේ ප්‍රදේශය මටත් කිට්ටු නිසා ඒ ජනතාවත් මට බොහොම සමීපයි. මමත් ආදාහන කටයුත්තට ස්වාමීන් වහන්සේ අපවත් වූ දින සිට ම ඒ පන්සලට ආව ගියා.ඒ ප්‍රදේශයේ ජනතාවගේ සාමූහික හැඟීම සහ කැප කිරීම විශේෂයෙන් ම සඳහන් කරන අතර ඒ ජනතාවට විශේෂ ස්තූතියක් පුද කරනවා.ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු කායර් මණ්ඩලයට විශේෂ ස්තූතියක් පුද කරන්න ඕන ඒ ආදාහන කමිටුව ඉල්ලා සිටි සියලුම දේවල් පුළුවන් ආකාරයෙන් ඉෂ්ට කිරිම පිළිබඳ ව.ඒ වෙනුවෙන් මන්ත්‍රීවරයෙක් වශයෙන් සභාවේ ගෞරවය ලබා දීම පිළිබඳ ව  ස්තූතිය පුද කරනවා.ඒ වගේ ම පුළුවන් මන්ත්‍රිවරු හැමෝ ම වගේ සහභාගි වුණා.ඒ මන්ත්‍රීවරුන්ටත් විශේෂ ස්තූතිය පුද කරන්න ඕන. ඒ ඉතා සද්ගුණවත් ගතිගුණ තිබූ උන් වහන්සේට අජරාමර නිවන් සුව ප්‍රාථර්නා කරමින් නැවත වතාවක්  බොන්දුපිටිය ප්‍රදේශවාසීන් වෙනුවෙන් සහ සහභාගි වූ සියලු දෙනා වෙනුවෙන් ගෞරවය පුද කරමින් මම නිහඬ ෙවනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   විජිත ද සිල්වා මහතා

මං මුලින් ම අපේ ප්‍රදේශවාසීන් වෙනුවෙන් ගෞරවණීය වූ උන් වහන්සේට නිවන් සුව ප්‍රාථර්නා කරනවා.ස්වාමීන් වහන්සේ සම්බන්ධයෙන් කියනවා නම්,බොන්දුපිටිය ප්‍රදේශයේ විහාරස්ථානයේ චෛත්‍ය හදල කොත් පැලැන්දුවා මේ ළඟදි.මමත් ඒ වැඩසටහන්වලට සහභාගි වෙලා පූජාවන් කිහිපයක් කළා ඒ පන්සලේ. චෛත්‍යයක් ඉදි කළාට පස්සේ ඒ පන්සල මහා විහාරයක් බවට පත් වෙනවා. උන් වහන්සේගේ කැප වීම මත අද බොන්දුපිටිය පන්සල මහා විහාරයක් බවට පත් වෙලා තියෙනවා.ඒ වගේ ම මේ ස්වාමීන් වහන්සේගේ ලෙන්ගතුකම මේ ගමට විශාල හයියක් වෙලා තිබුණා.උන් වහන්සේ වෙලාවකට අපට උපදෙස් දෙනවා, වෙලාවකට බනිනවා, වෙලාවකට දැඩි තීන්දු තීරණ ගන්නවා.අපි දැක්ක නාගතිස්ස ස්වාමීන් වහන්සේ දේශපාලනය කරන කාලෙදි ගමේ ඉන්න තරුණ තරුණියන්ට වගේ ම සමාජෙ ඉන්න සියලු දෙනාට උදව් උපකාර කළා.උන් වහන්සේ මේ පක්ෂය ගොඩ නැගීම වෙනුවෙන් විශාල කැපවීමක් දරල මැති ඇමතිවරුන්ට පවා උපදෙස් දුන්නා.ඔවුන් ව ගමත් එක්ක එකතු කර ගත්තා.අපි මැලේසියාවෙ ගිය වෙලාවෙ උන් වහන්සෙත් සහභාගි වුණා ඒ ගමනට.එතකොට මායි උප සභාපතිතුමායි,හාමුදුරුවොයි එක කාමරේ හිටියෙ.එතකොට පාන්දර තේ එක පවා හදල දීල අවශ්‍ය සියලු ම දේවල් දීල හාමුදුරුවෝ තමයි අපි ව බලා ගත්තෙ.අපේ අම්මා තාත්තා දුප්පත් නිසා ඉගෙන ගන්න පොත්පත් ටිකවත් ගන්න බැරි අතීතයක් තිබුණා.හාමුදුරුවෝ ගාවට ගියාට පස්සේ පොත්පත් පෑන් පැන්සල් ටික දුන්නා.ඇඳුම් ගන්න සල්ලි දුන්නා.මං ඕක හැම තැනම කියනවා.මොකද අපි කොතන හිටියත් උන් වහන්සේගෙ තිබුණා ලොකු ලෙන්ගතුකමක්.මගේ පෙරහැර එද්දි මුළු ගම ම පිරිසිදු කරල,ලයිට් ටික දාල තියන්නේ ඒ මිනිස්සුන්ගෙත් ලොකු බැඳීමක් තිබුණා අපිට.ඒකට හේතුව තමයි එතන ඉන්න නායකත්වය.මහ ජනතාවගේ නායකයා හැටියට කෙළින් තීන්දු තීරණ ගැනීමේ හැකියාව,උනන්දුව,සියලු ජනතාවට එක ලෙස සැලකීමේ ගුණාංගය උන් වහන්සේට තිබුණා.ඒ නිසා ම බොන්දුපිටිය අද මහා විහාරයක් බවට පත් කරල

උන් වහන්සේ අපෙන් සමු අරගෙන ගිහින්.මට එන්න බැරි වුණා.මං බදුලු බණ්ඩාරවෙල ඉඳල ඊයෙ පාන්දර ආවෙ.ඒ ඇවිත් මම දෙපාරක් ම පන්සලට ගිහින් වැඳල ආවෙ.උන් වහන්සේගේ අභාවය අපි හැමෝටම දේශපාලනික,සමාජීය වශයෙන් ලොකු පාඩුවක්. උන් වහන්සේ ආගමික වශයෙනුත් වැරැද්දක් දුටු තැන කතා කරනවා.ක්‍රිස්තියානි ආගම පතුරවන්න ආපු අයව බස් එකෙන් බස්සලා ගැහුවා මට මතකයි.උන් වහන්සේට මේ දහම සම්බන්ධයෙනුත් විශාල අවබෝධයක් තිබුණා.මේ හාමුදුරුවන්ගේ අපවත් වීම අපට, රටට, සමාජයට විශාල පාඩුවක් කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා.ඒ වගේම දැනට පන්සලේ වැඩ වාසය කරන ත්‍රිපිටකවේදී සුමනවංශ හාමුදුරුවන්ගෙන් ධමර් දේශනාවක් අහන එකත් ඇති සමාජයට.ඒ ත්‍රිපිටකයෙන් ධමර්ය දේශනා කරන මට්ටමට ගෙනාවෙ උන් වහන්සේ. උන් වහන්සේ අපිත් එක්ක නොයෙක් ප්‍රදේශවල මේ වගේ බොහෝ දේවල් කළා.මේ දුක්ඛිත සසරේ තවත් ආත්මයක ඉපදුනත් වැඩක් නෑ.ඒ නිසා උන් වහන්සේට අජරාමර නිවන් සුව ලැබෙන්න කියල මගේ ගම්වාසීන් වෙනුවෙන් ප්‍රාථර්නා කරනවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හින්ටන් මද්දගේ මහතා

බොන්දුපිටිය නාගතිස්ස නායක උන් වහන්සේ එඩිතර ස්වාමීන් වහන්සේ නමක් හැටියට අසාධාරණයක් වෙච්ච හැම අවස්ථාවක ම ප්‍රශ්නය නිරාකරණය කර ගන්න එඩිතර ව හැම කෙනාට ම උදව් උපකාර කළ කෙනෙක්.අපි මැලේසියාවෙ ගිය වෙලාවෙදිත් උන් වහන්සේ අපිත් එක්ක වැඩම කළා.අපට අවශ්‍ය හැම දේම සපයලා දීලා පුදුම විදිහට උදව් උපකාර කළ හිමිනමක්. ඇත්තටම ඒ ගමේ පන්සල දශර්නීය විදිහට දැකගන්න ලැබුණාම සතුටක්. අපි ගිය මාසෙදි ඒ පන්සලේ උත්සවයකට සහභාගි වුණා.ඒ ගියාමත් අපට ගොඩක් අනුශාසනා කළා.උන් වහන්සේට අනුන්ගේ හිත් ඇද ගැනීමේ ශක්තියට පුදුම දක්ෂතාවක් තියෙන්නේ.ඒ නිසා ගමට ආවොත් ගෙයින් ගෙට ගිහිල්ල හැමෝට ම කතාබහ කරනවා. උන් වහන්සේගේ වැඩ පිළිවෙල හරි ම පුදුමාකාරයි.මම අපේ කණ්ඩායම,ප්‍රදේශය සහ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් උන් වහන්සේට නිවන් සුව ප්‍රාථර්නා කරනවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ. ප්‍රියන්කා දමයන්ති ගුණවධර්න මිය

අපවත් වී වදාල හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බොන්දුපිටියේ නාගතිස්ස ස්වාමීන් වහන්සේ වෙනුවෙන් ඇත්තට ම ප්‍රථමයෙන් ම ස්තූතිවන්ත වෙන්න ඕනා, ඒ ආදාහන උත්සවය සාථර්ක කර ගැනීමට මේ සභාවේ මාගර්,විදුලි,ජල සැපයුම් සහ අනෙකුත් සියලු ම අංශ මැදිහත් වෙලා ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ,ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලය දක්වපු සහයෝගය සම්බන්ධ ව. ඒ වගේ ම ගරුතර ස්වාමීන් වහන්සේ මෙහි දී මූලිකත්වය අරගෙන කටයුතු කලා. මොකද උන් වහන්සේගේ දෙමව්පියෝ දෙන්න නැති වුණා හා සමානයි උන් වහන්සේට ඇති වුණ දුක.ඒත් එක්ක ම ආදාහනය සිදු වූ අවස්ථාවේ සිට ම වරින් වර පැමිණ ඒ ගැන සොයා බැලීම් කළ ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා,ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තූතියි.ගරු නිමාලක මන්ත්‍රීතුමාගේ මැදිහත්වීමෙන් ඒ සංවිධාන කටයුතු සිදු කෙරුණා.මම මෙහි දී එක් කරුණක් මතක් කරනවා.මගේ අසල්වැසි නිවසේ ඥාතිවරයෙක් උන් වහන්සේ. උන් වහන්සේ සසුන්ගත වෙලා තියෙන්නේ වයස අවුරුදු එකොළහෙදි වුණාට වයස අවුරුදු නමය,දහයෙදි අම්මගේ රෙදි ගොන්නක් ළිඳ ළඟට ගිනිහින් හෝදනවා.ඇත්තටම ඒකට හේතුව නායකත්වය කියන ගුණාංගය.අපි හැමෝම අද නායකයො වෙන්න යනවා,නායකයන් පස්සේ යනවා.නමුත් අවශ්‍ය පසුබිම,අත්තිවාරම ශක්තිමත් වෙන්න ඕන හැමෝගෙම. නාගතිස්ස ස්වාමීන් වහන්සේ අපට නායකයෙක් වෙනවා නම් දැක පුරුද්ද,කළ පුරුද්ද,පොත පත පරිශීලනය සහ පණ්ඩිතයින් ඇසුරු කිරීම ආදී ගුණාංග උන් වහන්සේ සතුයි.අද සමාජයේ උගතුන් පිළිබඳ ප්‍රශ්නයක් සහිත කාලයකදි උගත් හැමෝ ම බුද්ධිමත් ද කියන එකට හොඳ පිළිතුරක් වශයෙන් උන් වහන්සේ

පෙන්වා දිය හැකි.මුඛරිභාවයකින් හෙබි පණ්ඩිත ස්වරූපයෙන් තමයි උන් වහන්සේ ධර්මය දේශනා කළේ. උන් වහන්සේගේ අභාවය ගමට,රටට,අපට මහත් පාඩුවක්.අපි ඉදිරියේදි කෙනෙක් වෙනුවෙන් පෙනී සිටිය නම් උන් වහන්සේ කෙළින් ම ඒ ප්‍රතිරූපය ගොඩ නඟන්න පෙනී සිටියා.ආදශර්මත් කෙනෙක් වූ උන් වහන්සේ අපට සිදු වූ කලබගැනිවලදි සොයා බැලීම් සිදු කළා.සිංහලයා වෙනුවෙන් ලොකුවට ම පෙනී සිටි උන් වහන්සේ රට වෙනුවෙන් මහත් කැප කිරීම් කොට ධමර් දේශනා පැවැත්වීම සඳහා යුධ පෙරමුණට පවා වැඩිය හිමිනමක්.ඉතින් ඒ නිසා උන් වහන්සේගේ සේවය අවශ්‍ය ම කාලයක මේ අභාවය සිදු වූයේ.උන් වහන්සේට අජරාමර නිවන් සුව ප්‍රාථර්නා කරනවා.ඒත් එක්කම කොඩි කණු සැපයීම් හා අනෙකුත් දායකත්ව සැපයීමෙන් සහයෝගය දැක් වූ වෙනත් ප්‍රාදේශීය සභාවලටත් මේ අවස්ථාවේ දී ස්තූතිය පුද කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා
මං හිතන්නේ බොන්දුපිටිය දීපාරාමයෙහි ස්වාමීන් වහන්සේ හැටියට නාගතිස්ස නායක උන් වහන්සේ ගැන කතා කරන කොට අපිට විශේෂයෙන් ම ආගමික පැත්තෙන් ගොඩක් සම්බන්ධතාවයක් තියෙනවා.ඒ වගේ ම මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට උන් වහන්සේව අපට සිහිපත් වෙනවා.මොකද අපිත් එක්ක සම්බන්ධ වුණේ මේ දේශපාලනය නිසා.ඒ දවස්වල අපි ව පක්ෂ ප්‍රතිසංස්කරණ කටයුතුවලට දුර බැහැර ප්‍රදේශවලට යැව්වමත් පන්සලක නතර වෙන්න පුළුවන්කම තියෙද්දි අපට තියෙන හිතවත්කම නිසා උන් වහන්සේ නතර වුණේ අපිත් එක්කමයි.ඒ වගේ ම මට මතකයි අපි මැලේසියාවෙ ගිය වෙලාවෙ ප්‍රශ්නයක් වුණා අපි කිහිප දෙනෙක් ව දාල ගිහිල්ල.පස්සේ මේ කිසි කෙනෙක් අපේ ළඟට ආවෙ නෑ.උන් වහන්සේ වැඩම කරලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි අපිත් එක්ක කතා බහ කරල ඒක සාමදාන කළා.ඒ වගේ ම මට මතකයි උන් වහන්සේ කෙළින් කතා කරන කෙනෙක්. ගිය ජනාධිපතිවරණයක් වෙලාවෙදි අරලියගහ මන්දිරයට ගිය අවස්ථාවක"මේවට තමුන් වග කියන්න ඕන කියල" නාමල් රාජපක්ෂ මහත්තයට කෙළින් ම කිව්ව.දවසක් අපි ගමනක් ගිහින් එද්දි හාමුදුරුවන්ට එක මනුස්සයෙක් රුපියල් ලක්ෂ තුනක් දුන්න.ඒක අසරණයින්ට බෙදල ආපහු පන්සලට එද්දි රුපියල් තුන්දාහයි ඉතිරි වුණේ.ඒ වගේ දුප්පතුන්ට උපකාර කරන හිමිනමක්.දේශපාලන පැත්තෙන් හොඳ කථිකයෙක්.මේ අවස්ථාවේ උන් වහන්සේට අජරාමර නිවන් සුව ලැබේවායි ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා
බොන්දුපිටිය නාගතිස්ස ස්වාමීන් වහන්සේ ගැන කතා කිරීමේ දී විශේෂයෙන් ම මේ සභාවෙ දැනට සිටින සියලු ම මන්ත්‍රීවරු සමඟ හිටපු කෙනෙක් මම.මේ හාමුදුරුවෝ අපිත් එක්ක දේශපාලනයට සම්බන්ධ වෙලා අවුරුදු හතරක් මේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රී ධූරයක් දරා ගෙන කටයුතු කළා. නිශාන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි ළඟ ඉද්දි නාමල් මන්ත්‍රීතුමාට කිව්ව කතාවට මමත් සාක්ෂියක් තමයි.කියන්න තියෙන දේ ඒ අදාළ කෙනාට ම ප්‍රකාශ කරීමේ හොඳ ගති ගුණයක් උන් වහන්සේට තිබුණා. අපිත් එක්ක මැලේසියානු සංචාරයක යෙදුන අවස්ථාව පිලිබඳව මං දකින්නෙ ඔබ තුමාලා දැක්ක පැත්තෙන් නෙමේ. මොකද උන් වහන්සේ ඒ සංචාරයට සහභාගි වුණා ම උන් වහන්සේ තමයි එතන අපේ උපදේශකයා වශයෙන් කටයුතු කළේ. උන් වහන්සේ සභාවෙ සහ ගමේ ඉන්න විදිහ අරන් බැලුව ම එහෙදි පුදුම සංවරකමකින් අපි ව හැසිරුවෙ.ඉතින් මට උන් වහන්සේ ව අමතක කරන්න බෑ.අද උන් වහන්සේ ගැන ගුණකථන ගොඩක් කළා.මම වැඩිදුර කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ. උන් වහන්සේට නිවන් සුව අත් වේවා කියල මං ප්‍රාථර්නා කරනවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාලංචිදුරගේ මිත්‍රානන්ද මහතා

නාගතිස්ස ස්වාමීන් වහන්සේ සම්බන්ධයෙන් මම විශේෂයෙන් ම ගුණ කථනයක් කරන්න ඕන කෙනෙක්.මොකද උන් වහන්සේ මාව පරද්දල තමයි සභාවට ආවෙ.මොකද එතකොට තිබුණේ කොට්ඨාශ ක්‍රමයක් නෙමේ.නමුත් කිසිදු අවස්ථාවක උන් වහන්සේයි මායි අතර කිසිදු අමනාපයක් තිබුනේ නෑ.ඕන ම වෙලාවක අපි හම්බෙලා කතාබහ කරල ගියා. බෙහෝ ම සුහද ව කටයුතු කළා.උන් වහන්සේ දානෙ වළදන අවස්ථාවක පන්සලට කවුරුහරි ඇවිත් ගියොත් අනිත් කෙනාටත් සංග්‍රහ කරන ගතිගුණයක් උන් වහන්සේට තිබුණා.මේ හාමුදුරුවෝ බොන්දුපිටිය ගමට යම් දියුණුවක් ඇති කරන්න සැළකිය යුතු මෙහෙයක් ඉටු කළ කෙනෙක්.විශේෂයෙන් ම විහාරස්ථානය නගා සිටුවල මහා විහාරයක් බවට පත් කළා.ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට විශාල සේවාවක් ඉටු කළ ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ දේශපාලන ගමන වෙනුවෙනුත් විශාල කැප වීමක් කළ හිමි නමක්.ගමට, ප්‍රදේශයට, සියලු දෙනාට සේවය කරමින් ඕනෑ ම අවස්ථාවක ආරාධනාවක් කිරීමටත් පෙර මිනිසුන්ගේ මළගෙවල්වලට,දානෙට වැඩම කරා.උන් වහන්සේගේ ඒ ගති ගුණ පිළිබඳ ව අපි සතුටු වෙනවා.එ මෙන් ම උන් වහන්සේ අප අතරින් සමු ගැනීම පිළිබඳ ව මාගේ ශෝකය ප්‍රකාශ කරනවා.මට හැකි පමණින් මම අවමංගල්‍ය කටයුතු පිළිබඳ ව සොයා බැලුවා. නමුත් අසනීපෙන් සිටි නිසා ආදාහන උත්සවයට සහභාගී වීමට නොහැකි වුණා. ඒ වුණත් ඉතා හොඳින් ආදාහන උත්සවය සංවිධානය කිරීම සම්බන්ධ ව ඒ ගමේ උදවියටත්,ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමාට සහ මන්ත්‍රීතුමියටත් ස්තූතිවන්ත වෙනවා මේ හාමුදුරුවන්ට දෙන්න පුළුවන් උපරිම ගෞරවය ලබාදීම පිළිබඳ ව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

අපවත් වී වදාළ මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අපේ බොන්දුපිටියේ නාගතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට උතුම් නිවන් සම්පත් ලැබේවා කියල විශේෂයෙන් ප්‍රාථර්නා කරනවා.බොහෝ කරුණු කාරණා කතා බහ කළ නිසා උන් වහන්සේ පිළිබඳ ව දිසර් ව කතා කරන්නේ නෑ.උන් වහන්සේ වෙනුවෙන් අපේ ශෝකය ප්‍රකාශ කරන අතර ම මගේ දේශපාලන ගුරුවරයා තමයි උන් වහන්සේ.ඒකට හේතුව 2011 වෂර්යේ උන් වහන්සේගේ මැතිවරණයට මම සහාය දුන්නා. උන් වහන්සේ තමයි භික්ෂූන් වහන්සේ කෙනෙක් හැටියට මේ කළුතර දිස්ත්‍රික්කයේ ම මන්ත්‍රී හිමිනමක් හැටියට කටයුතු කළේ.උන් වහන්සේ සිමෙන්ති සංස්ථාවේ විධායක අධ්‍යක්ෂකවරයෙක් සහ අධිවේගී මාගර්යේ මහජන ගැටළු උපදේශකවරයෙක් හැටියට කටයුතු කළා.අපි උන් වහන්සේගේ මැතිවරණයට සහයෝගය ලබලා දුන්නා.ඊ ළඟ මැතිවරණය වෙලාවෙ උන් වහන්සේ ඉල්ලුවෙ නෑ,මට ඉල්ලන්න අවස්ථාව ලැබුණා.උන් වහන්සේ ගොඩක් අවස්ථාවල දී අපට දේශපාලනය සම්බන්ධ ව බොහෝ දේවල් කියල දුන්න.මේ ලෝකෙ කවුරුවත් සවර් සම්පූණර් නෑ.නරක ගති අයින් කරල අපි මිනිස්සුන්ගේ හොඳ ගති ගුණ අපේ ජීවිතයට ගන්න ඕනා. නාගතිස්ස නායක ස්වාමීන් වහන්සේගේ ජීවිතයේත් වැරදි දේවල් මොනව හරි තිබුණා නම් ඒව අයින් කරල උන් වහන්සේගේ හොඳ දේවල් තමයි අපි ගන්න ඕනා.ඉතින් උන් වහන්සේට අවසන් ගෞරවය දක්වන අවස්ථාවේ සභාවක් හැටියට පුදුම තරම් කැප කිරීම් කරල සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට දෙන්න පුළුවන් ඉහළ ම ගෞරවය සභාපතිතුමා,ලේකම්තුමිය,සියලු කායර් මණ්ඩලයත් ලබලා දුන්නා.අවමංගල කමිටුවෙ හිටිය ප්‍රධාන සංවිධායක හිමිනමක් හැටියට සභාපතිතුමා,ලේකම්තුමිය,සියලු කායර් මණ්ඩලයත් කළ මෙහෙය පිළිබඳ ව මේ මොහොතේ කියන්න ඕනා.මන්ත්‍රීවරු හැටියට කොට්ඨාශ නියෝජනය කරන ප්‍රියංකා මන්ත්‍රීතුමියත්,නිමාලක මන්ත්‍රීතුමාත් මේ ආදාහන උත්සවය

වෙනුවෙන් තමන්ගේ පෞද්ගලික ධනය පවා ලබා දීලා එම අවශ්‍ය කටයුතු කළා. අවශ්‍ය අවස්ථාවලදී දොඩංගොඩ ප්‍රාදේශීය සභාවත් ජල සැපයීම් ආදිය සිදු කළ නිසා දොඩංගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාවත් සිහිපත් කරනවා.සියලු මන්ත්‍රීවරුත් සහභාගි වෙලා දායකත්වය ලබලා දුන්නා.ඒ වෙනුවෙන් මන්ත්‍රීතුමාලටත් අපේ පුණ්‍යානුමෝදනාව සිද්ධ කරනවා.අවසාන වශයෙන් කියන්න කැමති ඉතා ප්‍රතිපත්තිගරුක ව කටයුතු කළ උන් වහන්සේගේ අපවත් වීම මුළු මහත් සමාජයටත්,බුද්ධ ශාසනයටත්,බොන්දුපිටිය ප්‍රදේශවාසීන්ටත්,අපටත් මහත් පාඩුවක් ලෙස අප දකිනවා. උන් වහන්සේ වැඩ වාසය කරන පන්සලේ ස්වාමීන් වහන්සේට මතුගම ප්‍රාදේශීය සභාවේ ශෝක පණිවිඩයක් යොමු කරන හැටියටත් සිහිපත් කරමින් මගේ ශෝක ප්‍රකාශය මෙතනින් අවසන් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඩබ්. නිලූකා දශර්නී සිල්වා මිය

මම හිතන්නේ අපේ ගෞරවනීය නාගතිස්ස ස්වාමීන් වහන්සේ පිළිබඳ ව මන්ත්‍රීතුමන්ලා ගොඩක් දේ කතා කළා.මං මන්ත්‍රීතුමියක් වෙන්න කළින් ප්‍රජා ශාලාවක් හදන්න බොන්දුපිටිය ප්‍රදේශයට ගියා.ඒ වෙලාවෙදි ගරු  ස්වාමීන් වහන්සේ මාව හම්බ වෙන්න එතනට ආවා.''බොහොම හොඳයි නෝනා.මගෙන් මොනවද කෙරෙන්න ඕන'' කියල අහල මට ආශිවර්ාදත් කරල ගියේ.පසු ව ඒ ප්‍රජා ශාලාව හදල නිම කරලා ඒක විවෘත කරන අවස්ථාවෙදිත් උන් වහන්සේ පැමිණියා.පසු කාලයේ මම මන්ත්‍රීතුමියක් වෙලා උන් වහන්සේගේ පන්සලට ගිය වෙලාවෙ''එන්න මන්ත්‍රීතුමිය''කියල මට කතා කරලා,තේ හදල දීලා පිරිත් නූලක් ගැටගහලා ආශිවර්ාද කළා.ඇත්ත වශයෙන් ම මගේ ප්‍රදේශයේ කිහිප දෙනෙකුට  ම රැකියාවක් ගන්න ගියපු සෑම අවස්ථාවක ම උන් වහන්සේ ලිපියක් දුන්නා.අවසාන වශයෙන් විශාල කැපවීමකින් සංග්‍රහ කටයුතු කිරීම පිළිබඳ ව අපේ මන්ත්‍රීතුමියටත්,කොට්ඨාශෙ භාර ව ඉන්න මන්ත්‍රිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාවේ ඉන්න මන්ත්‍රිවරු දෙපළගේත්,සියලු ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල දේශපාලකතුමන්ලාගේත් කණගාටුව මම මේ අවස්ථාවේ දි ප්‍රකාශ කරනවා.උන් වහන්සේට නිවන් සුව ලැබේවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා

අපවත් වී වදාළ මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බොන්දුපිටියේ නාගතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිළිබඳ ව ශෝක ප්‍රකාශ පල කරන මේ අවස්ථාවේ දී අපි ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට ජනතා විමුක්ති පෙරමුණේ සාතිශය සංවේගය උන් වහන්සේ වෙත පුද කරනවා.උන් වහන්සේ එක්ක අපි වැඩ කරලා නෑ.නවක මන්ත්‍රීවරු දෙදෙනෙක් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන්නේ.අපි අහලා තියෙනවා අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ කාල වකවානුවල නාගතිස්ස හාමුදුරුවන් සමඟ දේශපාලනික වශයෙන් මේ සභාවෙ පක්ෂ නියෝජනය කළ මන්ත්‍රීවරුන් හැටියට එකට කටයුතු කළ බව.උන් වහන්සේ ඉතා දක්ෂ කථිකයෙක් හැටියට මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කළ බව,හොඳ සමාජ සේවකයෙක් හැටියට ප්‍රදේශය නියෝජනය කළ ධමර්ානුකූල ජීවිතයක් ගත කළ හිමිනමක් බව. උන් වහන්සේ පිළිබඳ පෞද්ගලික ආශ්‍රයක් නැතත් උන් වහන්සේ සමඟ දේශපාලන සම්බන්දතා නැති වුණත් අපි මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියටත් උන් වහන්සේගේ

සමාජ සේවය පිළිබඳවත් ජනතා විමුක්ති පෙරමුණේ අපගේ සාතිශය සංවේගය මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

අපවත් වී වදාළ ගරු බොන්දුපිටියේ විහාරාධිපති නාගතිස්ස ස්වාමීන් වහන්සේ පිළිබද අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබද ව ඉතාමත් ම සතුටුයි. ''බොන්දුපිටිය''මගේ ඥාති ගමක්.ඒ වගේ ම මේ ස්වාමීන් වහන්සේගේ ළග ම ඥාතිවරයෙක් හැටියටත් මේ ලැබුන අවස්ථාව පිළිබඳ සතුටුයි.විශේෂයෙන් ම උන් වහන්සේ යටදොළ ගම වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාගර්ය ඉදි කරන අවස්ථාවේ දී ප්‍රදේශයේ තරුණ තරුණියන් වෙනුවෙන් විශාල රැකියා ප්‍රමාණයක් ලබා දී තරුණ පිරිස යහ මඟට ගැනීමට මූලික අඩිතාලම තැබුවා.ඒ හරහා විවිධ ක්ෂේත්‍රවලට යොමු කරමින් ඉහළ ආථර්ික ශක්තියක් ලබා දීමට උන් වහන්සේ කටයුතු කළා.අපි ආදාහන උත්සවයට සහභාගි වුනත් යටදොළ ගම වෙනුවෙන් ශෝකයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව නොලැබුණත් මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් යටදොළ ගමේත්,සියලු ජනතාවගේත් සහ විහාරස්ථානයේත් අප සියලු දෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.ඒ වගේ ම තමයි උන් වහස්සේ මගේ මැතිවරණ වෙලාවෙදිත් මට විශාල උපදෙස් ප්‍රමාණයක් ලබලා දුන්නා. උන් වහන්සේට අජරාමර නිවන් සුව අත් වේවා කියල මං ප්‍රාථර්නා කරනවා!

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මිය

අපවත් වී වදාළ ගරු බොන්දුපිටියේ විහාරාධිපති නාගතිස්ස ස්වාමීන් වහන්සේට අජරාමර නිවන් සුව අත් වේවායි ප්‍රාථර්නා කරන අතර මං හිතන්නේ අපි එදා උන් වහන්සේගේ දේහය අවසන් කටයුතු කරන දවසේ එතනට සහභාගි වුණා. උන් වහන්සේගේ දේශපාලන ජීවිතය තුළ උන් වහන්සේ ව ළඟින් ඇසුරු නොකරත් එදා උන් වහන්සේගේ අවසන් කටයුතු සිදු වන මොහොතේ ඒ ක්‍රීඩා පිට්ටනියට අතුරු සිඳුරු නැතුව ඇවිත් හිටපු ජනකායෙන් අපි දැක්කා උන් වහන්සේ ඒ ගමට,ප්‍රදේශයට ලොකු සේවාවක් කරපු හිමිනමක් බව. උන් වහන්සේගේ ඒ සේවාව මහ ජනතාවගේ ඇස්වලින් අපි දැක්කා. ඔවුන් කඳුළු වැගිරුවේ හඬා වැළපුනේ උන් වහන්සේගේ සේවාව නිසා.එ වන් මහජන සේවයක් සිදු කළ ගෞරවනීය නායක ස්වාමීන් වහන්සේට උතුම් නිවන් සුව අත්වේවා! කියලා ප්‍රාථර්නා කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

එහෙනම් අපි නාගතිස්ස ස්වාමීන් වහන්සේගේ විහාරස්ථානයේ නායක හාමුදුරුවන්ට අපේ ශෝක යෝජනාව යවනවා. ඒ වගේම උන් වහන්සේගේ මව ඇතුළු පවුලේ ඥාතීන්ටත් යවන්න කටයුතු කරනවා.ශෝකය පළකළ සියලු දෙනාට ස්තූතිවන්ත වෙනවා.

4.සංදේශ හා පෙත්සම් -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් වික්‍රමාරච්චි මැතිතුමා විදේශගතවී ඇති බැවින්, එතුමාගේ නිවාඩු අනුමත කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් තිබෙනවාද?

ඊළඟට වැලිවත්ත බෞද්ධ කටයුතු හා සමාජ සේවා සමිතියෙන් ලිපියක් ලැබී තිබෙනවා. එය ඉදිරිපත් කර තිබෙන්නේ රජයට අයත් කොටසකින් සුසාන භූමියක් සඳහා කොටසක් වෙන්කරවා ගැනීමටයි. මේ කොට්ඨාශයට ඒ අඩුපාඩුව තිබෙනවා කියලා සමිතියේ සාමාජිකයෝ සියළුදෙනා

දැණුම් දී තිබෙනවා. අපි මෙය සභාගත කරලා ඒ ඉදිරි කටයුතු කොට්ඨාශයේ මන්ත්‍රී තුමාලත් සමග සාකච්ඡා කරලා වෝගන් වත්ත කිට්ටුව සුදුසු භූමියක් තෝරා ගැනීමට සාකච්ඡා කරමු.

**5.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න -**

**5.1.1 මෙම සභාවෙන් අනුමත නොකරන ලද ගෙවීම් සිදු කරන්නේ කෙසේද?**

පිලිතුරු ලබා දී ඇත.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**5.1.1 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, සුජීව නිමර්ාන මැතිතුමා විසින් මෙම සභාවෙන් අනුමත නොකරන ලද ගෙවීමක් සිදුකරන්නේ කෙසේද යන්න පිළිබඳව විමසා තිබෙනවා. ඒ PE 6914 කැබ් රථයේ අළුත්වැඩියා වියදම සම්බන්ධව. එතුමාට ලේකම් තුමිය කරුණු පැහැදිලි කළා නේද? කැබ් රථයේ ගෙවීම් පිළිබඳව ලිඛිතව විස්තර දීලා තියෙනවා. එතුමාට අදහස් දක්වන්නත් පුලුවන්.**

**6. යථා පරිදි කල්දී ඇති යෝජනා :-**

**6.1 ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:**

**6.1.1 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත්ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.06.01 දින සිට 2022.06.30 දින දක්වා, කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.**

| අනු අංකය | නම | වව්චර් අංකය | විස්තරය | මුදල |
|---|---|---|---|---|
| | 2022.06.03 | | | |
| 1 | පී.ඩී.එස්.පෙරේරා | 1 | මාගර් ආරක්ෂණ ඇප තැන්පත් ආපසු ගෙවීම | 50,000.00 |
| 2 | එස්.එම්.ඩී.කරුණාරත්න | 2 | ඉදිගස්තුඩුව මාගර්ය තාර දැමීම ගල් රෝලට දින 2 1/2 ක් සඳහා කුලිය 2 1/2x17500 = 43750.00 සභාවෙන් සපයන ලද ඩීසල් ලීටර් 50 ක් සඳහා රු. 14450.00 ක් අඩු කර ඉතිරි මුදල් ගෙවීම | 29,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| 3 | ගෑස්ටෙක් එනජරී ලංකා | 3 | ආදාහනාගාරයට 37 1/2 ගෑස් සිලින්ඩර් 05 ක් ලබා ගැනීම 18293x5 | 91,465.00 |
| | 2022.06.06 | | | |
| 4 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජී | 4 | ඩුප්ලෝ යන්ත්‍රයට තීන්ත 01 ක් මිලදී ගැනීම | 8,456.00 |
| | 2022.06.07 | | | |
| 5 | ශ්‍රී ලංකා ඉඩම් සංවධර්නය කිරීමේ සංස්ථාව | 5 | යෝජිත රථවාහන නැවතුම්පල ඉඩමේ ඇල මාගර් කාණු පද්ධති සකස් කර ගැනීම සඳහා අදාල සැලසුම් සකස් කිරීමට කේෂ්ත්‍ර පරීක්ෂණය වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම. | 500,000.00 |
| | 2022.06.08 | | | |
| 6 | සී/ස මතුගම විශේෂ සේවා සමුපකාර සමිතිය | 6 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම 01 | 108,890.11 |
| | 2022.06.09 | | | |
| 7 | ජයලත් එන්ටප්‍රර්යිසස් , වැලිපැන්න | 7 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම 02 | 44,500.00 |
| | 2022.06.10 | | | |
| 8 | මුදල් භාරකරු | 8 | 2022 ජුනි හොරවල උප කායර්ාලයේ වැටුප් අත්තිකාරම් ගෙවීම. | 1,500.00 |
| 9 | මුදල් භාරකරු | 9 | 2022 ජුනි වැලිපැන්න උප කායර්ාලයේ වැටුප් අත්තිකාරම් ගෙවීම. | 1,000.00 |
| 10 | මුදල් භාරකරු | 10 | 2022 ජුනි මතුගම ප්‍රධාන කායර්ාලයේ වැටුප් අත්තිකාරම් ගෙවීම. | 14,600.00 |
| 11 | නන්දසේන ලියනගේ | 11 | මහජන සම්බන්ධතා නිලධාරි දීමනා 2022 මැයි | 14,000.00 |
| 12 | මුදල් භාරකරු | 12 | 2022 මැයි දෛනික වැටුප් හොරවල උප කායර්ාලය | 78,160.91 |
| 13 | මුදල් භාරකරු | 13 | 2022 මැයි ව්‍යාපෘති වැටුප් හොරවල උප කායර්ාලය | 193,213.62 |
| 14 | මුදල් භාරකරු | 14 | 2022 මැයි දෛනික වැටුප් වැලිපැන්න උප කායර්ාලය | 97,899.40 |
| 15 | මුදල් භාරකරු | 15 | 2022 මැයි ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උප කායර්ාලය | 62,230.26 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | මුදල් භාරකරු | 16 | 2022 දෛනික වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 217,780.26 |
| 17 | මුදල් භාරකරු | 17 | 2022 ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 385,811.91 |
| 18 | මුදල් භාරකරු | 18 | 2022 ඩෙංගු මධර්න වැඩසටහන වැටුප් ගෙවීම | 264,592.10 |
| 19 | මුදල් භාරකරු | 19 | 2022 මැයි විෂබීජහරණ වැඩ සටහන වැටුප් ගෙවීම | 185,214.33 |
| 20 | ඒ.එස්.කේ.ලියනගේ | 20 | ආදාහනාගාරය ඉදිකිරීමට යෝජිත රිටිකැටිය සුසාන භූමිය පවරාදීම සඳහා මැනුම් කිරීමේ ගාස්තු LRC | 55,400.00 |
| | 2022.06.15 | | | |
| 21 | අජර්ුන කිරිඇල්ල | 21 | 2022 ජූනි මහ සභා සංග්‍රහ අත්තිකාරම් පියවීම. | 10,000.00 |
| 22 | මුදල් භාරකරු | 22 | මෙරිල් මුණසිංහ ඇතුළු 30 ක් සඳහා සභික ගමන් වියදම් ගෙවීම 2022 මැයි මාසය සඳහා | 75,000.00 |
| 23 | මුදල් භාරකරු | 23 | මෙරිල් මුණසිංහ ඇතුළු 33 ක් සඳහා සභික දීමනා ගෙවීම 2022 ජූනි මාසය සඳහා | 510,000.00 |
| 24 | එස්.ඊ.කරවිට | 24 | 2022.01.01 සිට 2022.03.31 දක්වා සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය | 5,730.58 |
| 25 | කේ.පී.එන්. ද සිල්වා | 25 | 2022.01.09 සිට 2022.02.08 දක්වා සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය | 1,747.02 |
| 26 | ඩී.එස්.එල්.ජයවධර්න | 26 | 2022.01.20 සිට 2022.03.31 දක්වා සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය | 1,308.22 |
| 27 | ඩී.එල්. මුණසිංහ | 27 | 2022.02.20 සිට 2022.03.19 දක්වා සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය | 771.06 |
| 28 | ෆැමිලි එන්ටර් ප්‍රයිසස් | 28 | ආදාහනාගාරයට 37 1/2 ලාෆ් ගෑස් සිලින්ඩර් 20 ක් ලබා ගැනීම 20675.00 x20 | 413,500.00 |
| 29 | වි.සේ.ස. සමිතිය, මතුගම | 29 | ඉන්ධන බිල්පත් ගෙවීම. ඇමුණුම 03 | 336,049.20 |
| | 2022.06.17 | | | |

| | | | | |
|---|---|---|---|---|
| 30 | අරුණ බුද්ධික ජිනදාස | 30 | වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීම,යෝග්‍යතා හා දුම් සහතික සඳහා අත්තිකාරම් Ц-9413, ABP 5504, ABP 5527 | 11,190.00 |
| 31 | ලංකා විදුලි බල මණ්ඩලය | 31 | සභාව සතු ආයතන 32 ක් සඳහා විදුලි බිල්පත් ගෙවීම | 113,517.35 |
| | 2022.06.20 | | | |
| 32 | ආර්.එම්.සන්දනායක | 32 | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - 2022 මැයි මාසයේ අතිකාල දීමනා ගෙවීම | 14,456.00 |
| 33 | සංජය එරික් ලසන්ත | 33 | මුරකරු - 2022 මැයි මාසයේ අතිකාල දීමනා ගෙවීම | 11,776.80 |
| 34 | එම්.කේ.එස්.ජානක | 34 | රියදුරු - 2022 මැයි මාසයේ අතිකාල දීමනා ගෙවීම | 8,280.80 |
| 35 | යූ.කේ.ඩී. සුමිත් | 35 | කාර්යාල කාර්ය සහායක - 2022 මැයි මාසයේ අතිකාල දීමනා ගෙවීම | 9,075.91 |
| 36 | ඊ.එම්.නුවන් චතුරංග | 36 | මුරකරු - 2022 අප්‍රේල් මාසයේ අතිකාල දීමනා ගෙවීම | 6,516.36 |
| 37 | එච්.ඩබ්.ඩී.ඉන්දිකා ප්‍රියදර්ශනී | 37 | කාර්යාල කාර්ය සහායක - 2022 මැයි මාසයේ අතිකාල දීමනා ගෙවීම | 3,917.53 |
| 38 | පී.ඒ. ඩී.වී.සී. ගුණතිලක | 38 | 2022/04 අතිකාල ක.සේ.නි | 2,169.44 |
| 39 | පී.ඒ. ඩී.වී.සී. ගුණතිලක | 39 | 2022/05 අතිකාල ක.සේ.නි | 1,084.65 |
| 40 | චමිලා ගුණවර්ධන | 40 | 2022/04 අතිකාල ක.සේ.නි | 919.51 |
| 41 | එස්.එම්. අයෝනා | 41 | 2022/05 අතිකාල කා.කා.ස. | 3,423.63 |
| 42 | ඊ.එම්.නුවන් චතුරංග | 42 | 2022/05 අතිකාල මුරකරු | 6,516.36 |
| 43 | ජී. චන්දන පුෂ්පකුමාර | 43 | 2022/05 අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 5,488.53 |
| 44 | ඩබ්.ඩී. රන්දික නදීෂාන් | 44 | 2022/05 අතිකාල පොදු වෙළඳ පොළ භාර. | 6,548.00 |
| 45 | කේ. දයාවති | 45 | 2022 අප්‍රේල් අතිකාල සෞඛ්‍ය කම්කරු | 2,617.68 |
| 46 | කේ.ඒ. ප්‍රියන්ති | 46 | 2022 අප්‍රේල් අතිකාල සෞඛ්‍ය කම්කරු | 908.08 |

| | | | | |
|---|---|---|---|---|
| 47 | ජයන්ත ද සිල්වා | 47 | 2022 මැයි අතිකාල ආදාහනාගාර ක්‍රියාකරු | 7,636.99 |
| 48 | නිරංග පුෂ්පකුමාර | 48 | 2022 මැයි අතිකාල ආදා. ක්‍රියා. සහායක | 3,033.13 |
| 49 | එම්.ජී. ප්‍රදීප් කුමාර | 49 | 2022 මැයි අතිකාල රියදුරු | 3,315.34 |
| 50 | සුමනාවතී මැණිකේ | 50 | 2022/04 අතිකාල සෞඛ්‍ය කම්කරු | 1,555.52 |
| 51 | සුමනාවතී මැණිකේ | 51 | 2022/05 අතිකාල සෞඛ්‍ය කම්කරු | 2,187.45 |
| 52 | බී.එස්. සුනේන්ද්‍ර | 52 | 2022/05 අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 6,902.62 |
| 53 | එස්.කේ. අතුකෝරල | 53 | 2022 අප්‍රේල් අතිකාල ව්‍යාපෘති කම්කරු | 4,265.97 |
| 54 | ටී.ඩී. අජිත් කුමාර | 54 | 2023 අප්‍රේල් අතිකාල ව්‍යාපෘති කම්කරු | 5,013.62 |
| 55 | ඩී.එච්. සිරිල් ජයන්ත | 55 | 2022 අප්‍රේල් අතිකාල ව්‍යාපෘති කම්කරු | 4,327.55 |
| 56 | කේ.ඒ. ලසන්ත කුමාර | 56 | 2022 මැයි අතිකාල ව්‍යාපෘති කම්කරු | 2,638.75 |
| 57 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 57 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 8,690.17 |
| 58 | ඩිලාන් ගුණරත්න | 58 | 2022 මැයි අතිකාල සෞඛ්‍ය කම්කරු | 5,055.22 |
| 59 | ඩී.එල්. ජයතුංග | 59 | 2022 අප්‍රේල් - මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 3,897.08 |
| 60 | බී.කේ. සුරාජ් | 60 | 2022 මැයි අතිකාල රියදුරු | 7,389.00 |
| 61 | එස්.ඒ.ඩී. රංගජීව | 61 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු මුර රාජකාරි | 9,722.00 |
| 62 | ඊ.ඒ. කසුන් | 62 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු මුර රාජකාරි | 11,222.40 |
| 63 | ජේ.ඩී. ප්‍රභාත් කුමාර | 63 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු මුර රාජකාරි | 7,854.84 |
| 64 | ඒ.කේ. කරුණාලාල් ඇපා | 64 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු මුර රාජකාරි | 17,729.45 |
| 65 | කේ.ඒ. සරත් | 65 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 3,233.16 |
| 66 | එම්.ඒ. සේනාරත්න | 66 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 11,750.40 |

| | | | | |
|---|---|---|---|---|
| 67 | උදාර සමරමාන්න | 67 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2,310.96 |
| 68 | එන්.ඩී. අජිත් | 68 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 727.74 |
| 69 | ප්‍රගීත් ඉන්දික කුමාර | 69 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2,777.76 |
| 70 | මිහිඳු චන්න කුමාර | 70 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 3,674.52 |
| 71 | එම්.එ. දමිත් | 71 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 4,291.65 |
| 72 | ජානක රුවන් දයාරත්න | 72 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 8,088.36 |
| 73 | සී.පී. මුණසිංහ | 73 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 11,666.40 |
| 74 | එල්.ඒ. ගාමිණි | 74 | 2022 මැයි අතිකාල වැඩ ක්ෂේත්‍ර කම්කරු | 10,200.80 |
| 75 | කේ.වී.ඩී.පී. හරිස්චන්ද්‍ර | 75 | 2022 /05 රාජකාරි ගමන් වියදම් | 700.00 |
| 76 | ගයාන් මදුශංක | 76 | 2022 /05 රාජකාරි ගමන් වියදම් | 1,400.00 |
| 77 | ඩබ්.ඩී.සුනිල් ශාන්ත | 77 | ආදායම් පරීක්ෂක 2022/05 වැඩ බැලීමේ දීමනාව | 4,523.33 |
| 78 | ආර්.පී.වරුණ ඉශාන්ත | 78 | 2022/05 නිවාඩු දින වැටුප් | 4,923.33 |
| 79 | ඩී.එස්.ගුණරත්න | 79 | රාජකාරි ගමන් වියදම් | 1,400.00 |
| 80 | ආර්.පී.වරුණ ඉශාන්ත | 80 | සෞඛ්‍ය පරිපාලක පරිවතරීත ගමන් වියදම්. 2022 මැයි | 1,500.00 |
| 81 | එච්.ජී.එන්. තනුජා ඇතුළු 5 ක් සඳහා | 81 | 2022/05 රාජකාරි දීමනා | 650.00 |
| 82 | ආර්.ඒ.ටී.ජී. රණවක | 82 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 2,100.00 |
| 83 | ජී.එම්.දිසානායක | 83 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 3,200.00 |
| 84 | ආර්.එම්.සන්දනායක | 84 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 800.00 |
| 85 | එම්.කේ.කළුතරගේ | 85 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 700.00 |
| 86 | එම්.ඩී.ආර්.තිලිණක | 86 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 2,100.00 |
| 87 | යු..එස්.මුණසිංහ | 87 | 2022/05 රාජකාරි ගමන් වියදම් | 700.00 |
| 88 | කා.හා.නි. හොරවල උප කායර්ාලය | 88 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය | 1,775.00 |

| | | | | |
|---|---|---|---|---|
| 89 | කා.හා.නි. හොරවල උප කායර්ාලය | 89 | සංග්‍රහ වියදම් ප්‍රතිපූණර්ය | 1,000.00 |
| 91 | ඩබ්ලිව්.ඩී.සුනිල් ශාන්ත | 91 | 2022/04 නිවාඩු දින වැටුප් ආදායම් පරීක්ෂක | 6,130.00 |
| 92 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශීය සභාව | 92 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූණර්ය | 8,000.00 |
| 93 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශීය සභාව | 93 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය | 22,888.88 |
| | 6/21/2022 | | | |
| 94 | පී.ජී සුලෝචනා මධුභාෂිනී | 97 | දිස්ත්‍රික් මිනින්දෝරු කායර්ාලයෙන් සැලසුම් පිටපත් ලබා ගැනීම සඳහා අත්තිකාරම් | 2,000.00 |
| | 6/22/2022 | | | |
| 95 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | 98 | ZA - 0452 JCB යන්ත්‍රයට ඔයිල් ෆිල්ටර් දැමීම | 64,400.00 |
| 96 | ගෑස්ටෙක් එනජරී ලංකා | 99 | 37.5kg ලිට්රෝ ගෑස් 05 ක් මිලට ගැනීම 18293.00 x 5 = 91465.00 | 91,465.00 |
| 97 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 100 | ශ්‍රවනාගාරය ජල බිල්පත් ගෙවීම 2022.04.01 සිට 2022.06.15 | 3,389.16 |
| 98 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 101 | දූරකථන ජාල බිල්පත් 2022.04.01 - 2022.04.30 | 26,245.53 |
| 99 | මොබිටෙල් පුද්ගලික සමාගම | 102 | ESMS සේවාව බිල්පත් 2022.04.25 - 2022.05.24 දක්වා | 61.30 |
| 100 | එරංග එන්ටප්‍රර්යිසස් | 103 | යටදොලවත්ත ක්‍රීඩාංගණය වහල අළුත්වැඩියාවට පලංචි කට්ටල 03 ක් දින 4 ක් සඳහා මිලට ගැනීම | 1,700.00 |
| 102 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | 104 | ZA - 0452 JCB යන්ත්‍රය සේවා කිරීම 2022.04.30 | 157,588.20 |
| 103 | සෙෂ් එයාර් ඔටෝ ඒ/සී | 105 | 53-4621 කැබ් රථයේ A/C පද්ධතිය සෑදීම | 33,700.00 |
| | 2022/06/24 | | | |
| 104 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 106 | ඉන්ධන බිල්පත් ඇමුණුම 04 | 78,009.00 |
| 105 | සී/ස මතුගම වි.ශේ.ස සමිතිය | 107 | ඉන්ධන බිල්පත් ඇමුණුම 05 | 80,000.00 |
| | 2022/06/28 | | | |

| | | | | |
|---|---|---|---|---|
| 106 | සී/ස මතුගම වි.ශේ.ස සමිතිය | 108 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම 06 | 234,474.00 |
| 107 | විදුහල්පති ආනන්ද ශ්‍රාස්තාලය, මතුගම | 109 | ශ්‍රවනාගාර තැන්පත් මුදල් ආපසු ගෙවීම | 3,000.00 |
| 108 | සිරිජය කොන්ක්‍රීට් වකර්ස් | 110 | හියුම් බට 03 ක් මිලට ගැනීම (කොස්වත්ත ගොඩ මාගර්ය හා සුදශර්න මාවත සම්බන්ධවන ස්ථාන සඳහා) | 49,500.00 |
| | 2022/06/29 | | | |
| 109 | ජී.දිව්‍යා සම්මානි සෙනවිරත්න | 111 | ගොඩවැලි කැනීම් තැන්පත් මුදල් ආපසු ගෙවීම | 50,000.00 |
| 110 | ටොයෝටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 112 | PE - 6914 කැබ් රථය සඳහා අමතර උපාංග යෙදීම හා පින්තාරු කිරීම 2022/02/24 | 510,726.85 |

**6.1.1 යටතේ දක්වලා තියෙන්නේ ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම්. ඒ පිළිබඳ අදහස් තියෙනවානම් ඉදිරිපත් කරන්න. ගෙවීම් ස්ථිර කරලා තියෙන්නේ. දැන් කථාකරන්න පුළුවන්.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවධර්න මහතා**

**අද දින ඔබ තුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 6.1.1 වන යෝජනාවේ සඳහන් ගෙවීම් සම්බන්ධයෙන් මේ වනවිට යම් ගැටළු සහගත තත්වයක් මතුවන බැවින්, යෝජනාව සංශෝධනය කළ යුතු යැයි මම සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කරනවා. මම හිතනවා මාත් එක්ක තවත් මන්ත්‍රීවරු කීප දෙනෙක් සම්බන්ධ වෙයි කියලා. අපි ලිඛිත සංශෝධන යෝජනාවක් භාරදීමට බලාපොරොත්තු වෙනවා.**

**මේ යටතේ අනු අංක 5, අනුඅංක 102, 103, 108, 110 වශයෙන් දක්වා ඇති ගෙවීම් පිළිබඳව අපට සැකයක් පවතිනවා. විශේෂයෙන්ම අනු අංක 110 යටතේ සඳහන් කරන කැබ් රථයේ ගෙවීම් සම්බන්ධව වන යෝජනාව සම්බන්ධව මට මීට පෙර විවාදයකට සම්බන්ධ වෙන්න බැරි වුනා. නමුත් අද දින මා විසින් ලබාගෙන තිබෙන තොරතුරු අනුව මෙම ගෙවීම් දැනටත් කරලා ඉවරයි. ගෙවීම කරලා ඉවරවෙලා සභාවට යෝජනාවක් දානවා ගෙවන්න කියලා. මම අහන්නේ මොකක්ද මේකේ තිබෙන පදනම. අපට මෙම යෝජනාව සම්බන්ධයෙන් එකඟවෙන්න පුළුවන් තත්වයක් ඇත්තේම නැහැ. ඉතින් එවැනි තත්වයක් උඩ සභාපති තුමා ඉදිරිපත් කරන ගෙවීම් සම්බන්ධව අපි වගකීමෙන් සළකා බලන්න ඕනි. අපි බොහෝ වෙලාවට සභාවට ඉදිරිපත් කරන ගෙවීම් සම්බන්ධ ව විශ්වාසයෙන් කටයුතු කරනවා. ඔබතුමා කෙරෙහි උප සභාපතිතුමා කෙරෙහි යම් විශ්වාසයක් තියාගෙන කටයුතු කළා. සභාවේ පරිපාලනයට නිලධාරීන්ගේ පැත්තෙන් ලේකම්තුමියත්, නිලධාරීන් හා මේ තනතුරු පිළිබඳවත් අපි දැඩි විශ්වාසයෙන් කටයුතු කළත්, තවදුරටත් මේ විශ්වාසය අපි තුළ තියාගන්න පුළුන්ද කියන එක පිළිබඳ ගැටළුව අද අපිට මතුවෙලා තිබෙනවා.**

**මේ සභාවේ සිදුවන යම් යම් කරුණු කාරණා එක්ක සළකා බැලුවාම මේ සභාවේ යම් යම් දූෂණ අක්‍රමිකතා නොවැළැක්විය හැකි තරම් ම පේන්න තිබෙනවා. මම හිතන්නේ මේ සභාවේ අවසාන**

කාලය මේ යන්නේ. අවසාන කාලයේවත් මේවා නිවැරදි විය යුතුයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වගේ අවස්ථාවක මේවා අනුමත කරන්න එකතු වුන මන්ත්‍රීවරුන් හැටියට අපිට එන චෝදනාවෙන් හරි අපි ගැලවෙන්න ඕනෑ.

එබැවින් අද දින මෙම කියපු කාරණා පදනම් කරගෙන ඉහත තත්වය පිළිබඳවත්, මේ සභාවේ මුදල් පරිහරණය පිළිබඳවත් තෘප්තිමත් විය නොහැකි බැවින්, ඒ සම්බන්ධ ව නිසි විමශර්නයක් සිදුකර අවසන් වනතුරු සභාවේ දූෂණ අක්‍රමිකතා සිදුවන බව යන හේතුව මත සභාව සම්බන්ධයෙන් විශ්වාසය පළුදු වී ඇති බවට කළ සංශෝධන යෝජනාවක් මා විසින් සභාවට ඉදිරිපත් කරනවා. මේකට මාත් එක්ක තව මන්ත්‍රීවරු අත්සන් කර තිබෙනවා. තමුන්නාන්සේලාට අදහස් ඉදිරිපත් කරන්න පුලුවන්. වංචාදූෂණවලට විරුද්ධ මන්ත්‍රීවරයෙක් හැටියට මම තනියෙන් හරි මගේ අදහස දක්වනවා.මගේ සාහෝදර මන්ත්‍රීවරයා මේ යෝජනාව ස්ථිර කරයි. මේක සභා රීති අංක 14 යටතේ සඳහන් වන සංශෝධනයක් වශයෙන් ඉදිරිපත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා
මම මෙම යෝජනාව ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි
මම මේ මොහොතේ සභාවෙන් බැහැර වෙන්න අවශ්‍යයි. මින් ඉදිරියේ සභාවේ තව යෝජනා කීපයක් තියෙනවා. විශේෂයෙන් මස් කඩ යෝජනාවක් තිබෙනවා. ඒ නිසා ඒ ගැන කථා කරද්දී මම සභාවේ නොසිටි බවට වාතර්ා කරන්න. (පිටවූ වේලාව ෙප.ව.11.30)

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඉන්දික මන්ත්‍රීතුමාගේ විරෝධ යෝජනාවක් තිබෙනවා. ඒකට සුරේෂ් ජයසේකර මන්ත්‍රීතුමා, ලලිත් සිරිවධර්න, සුදේශ් ලක්මාල්, නිමාලක සුරංග, හින්ටන් මද්දගේ, නඳුන් ද සිල්වා, පුබුදු ජයනෙත්ති, රම්සාන් යන මන්ත්‍රී තුමන්ලා අත්සන් කරලා තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඔබතුමාලාගේ මේ ගෙවීම් සම්බන්ධව බෙදීමක් යටතේ යන්න වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික මහතා
ගෙවීම් විමශර්න නිලධාරියෙකු වෙත යොමුකරලා තීරණයක් දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මෙම අනු අංක 110 ගෙවීම සම්බන්ධයෙන් (කැබ් රථයේ) ටොයොටා කම්පැනියට මුදල් ගෙවීමට සභාවේ බෙදීමකින් අවසරයක් ලැබුනේ නැහැ. එතකොට කොහොමද මෙම මුදල් ගෙවීමට කටයුතු කළේ? මුදල් කමිටුවෙන් අනුමැතියක් ලබා දීලා තියෙනවාලු ගෙවන්න කියලා. අපට දී තිබෙන තොරතුරු අනුව මීට අඩුවෙන් ටෙන්ඩර් 3ක් කැඳවලා තිබුනා. ඒ තියෙද්දී රු.510000/- කට ටෙන්ඩරයකට ගිහින් තියෙනවා. එතකොට ඇයි මුදල් කමිටුවෙන් මෙම ටෙන්ඩරයට අවසරයක් දුන්නේ. මොකක්ද මේ ක්‍රමවේදය? මේක පිළිබඳව ප්‍රකාශයක් කරන්න කියලා ගරු සභාපති තුමාට කියනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒ වෙලාවේ මුදල් කමිටුව වෙත ටොයෝටා ආයතනය ඇතුළු පෞද්ගලික ආයතන 3 කින් ටෙන්ඩර් ඉදිරිපත් වුනා . මෙම වාහනයේ සියලුම නඩත්තු කටයුතු අදාළ සමාගමෙන් සිදුකරන නිසා එය වැඩිමුදලක් වුවත් එම ආයතනය ලවා ම අළුත්වැඩියාව සිදුකර ගැනීමට තීරණයක් ගත්තා. ඒක අපි දිගටම කරගෙන ආ ක්‍රියාවලියක්. මම කැමතියි මේක විමශර්න නිලධාරීන්ට යොමුකරලා තීරණයක් ගැනීමට. එහෙම නැත්නම් ප්‍රතික්ෂේප කරන්න. ඒකට මගේ විරුද්ධත්වයක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

අපට තියෙන ගැටළුව ඒක නොවේ. බිල් ටික සඳහා වටිනාකම අදාළ කම්පැනියට ගෙවලා තිබෙනවා. අපි තියෙන ගැටළුව ඇයි එහෙනම් ටෙන්ඩර් කැඳව්වේ? මම අහන ප්‍රශ්ණය ඒක, ඒකට විමශර්නයක් කරන්න දෙයක් නැහැ. තව ලක්ෂ 10 ක් කියලා දැම්මත් ඒකට මුදල් ගෙවන්න පුලුවන්. අපි අහන්නේ ඇයි එතනටම දුන්නේ කියන එක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා
ටෙන්ටර් කැඳවලා වැඩි මිළ ගණනට දෙන්න කමිටු තීරණයක් ගත්තා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
ටෙන්ඩර් කැඳවන වෙලාවේ මම එතන හිටියනේ . හැම එකක්ම තිබුනේ පොඩි මිල ගනන්. මේ ලක්ෂ 5 පොඩි ගනණක් නෙවේ. ඒකයි අහන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා
මට තියෙන ගැටළුව තමයි ලක්ෂ 5 කට හරි කසුන් මන්ත්‍රීතුමා කියන හැටියට ඒ වැරද්ද තුළ හරි වැඩි ටෙන්ඩරයකට හරි වැඩේ කරලා ඔබතුමාට ඉදිරිපත් කරලා තියෙනවා. අපිට දීපු ලිඛිත පිළිතුරේ තියෙනවා "ඒ අනුව පින්තාරුවට අදාළ ගෙවීම් 2022.04.20 වන දින මහා සභාවේදී ඉදිරිපත් කරන ලද නමුත්, එම මුදල් ගෙවීමට අනුමැතියට කරන ලද යෝජනාව සභා සම්මත නොවීය ".කියලා. සභාවේ මුදල් කිව්වාට සභා සම්මත උනේ නැහැනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ගෙවපු එක ආයෙත් වාතර්ාවට එනවනේ.

ගරු අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මන්ත්‍රීතුමා
මේ පිළිතුරු වල තියෙනවා " නමුත් ටොයොටා ලංකා සමාගම විසින් 2022.06.10 දින එවන ලද ලිපිය පරිදි අදාළ පින්තාරුවට මුදල් ගෙවා නො තිබුන වාතාවරණයක් උඩ නීතිමය පියවර ගන්නා බවට දන්වා තිබූ ලිපිය පරිදි ටොයොටා සමාගම කියනවා අපට සල්ලි ගෙවන්නේ නැත්නම් අපි උසාවි යනවා කියලා ".කිව්ව ගමන් මුදල් ගෙව්වා. අන්න ඒ නිසා මුදල් හා ප්‍රතිපත්ති සභාවට ඉදිරිපත් කරලා සල්ලි ගෙව්වා කියලා මම හිතන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සමාගම නීතිඥයෙක් මාගර්යෙන් ලිපියක් එවා තිබුනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා
මම කියන්නේ ඔබ තුමාගේ වරදක් නොවේ. ගෙවපු ක්‍රමයේ වරදක් වෙලා තියෙන්නේ.එතන නීතිඥයෙක් කියලා එව්වා නම් අපේ නීතිඥයෙක් මාගර්යෙන් අපට ඒකට උත්තරය යවන්න තිබුනා. නැතිනම් හදිසි සභාවක් කැඳවන්න ඕනේ. කැඳවලා හදිසි සභාවට දාලා මේ තත්වය පැහැදිලි කර ගන්න ඕනි. එහෙම කරේ නැහැනෙ.ඒ අවස්ථාව මගහැරලා තිබෙනවා. මෙම ක්‍රියා පරිපාටිය වැරදියි.

ගරු උප සභාපති ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා
තව එකක් කියන්න ඕනි. ටෙන්ඩර් කැඳවලා ටෙන්ඩර් එකේ අඩු ගණනට දෙන්න ඒ අයගේ විශ්වාසයක් නැතිනම් වැඩි එකට දෙන්න පුලුවන්. ඒක කමිටුව තීරණය කරන්න ඕනි. මීට පසු ඔබතුමන්ලා මොනවා හරි කියනවානම් මාව ගාවගන්න එපා. උප සභාපති වශයෙන් මටත් වගකියන්න වෙනවා මේවට. උසාවියේ නඩු 500 ක් දැම්මත් සභා තීරණයට හිස නමන්න වෙනවා. මෙතනදී සභාවේ මන්ත්‍රීවරුන්ගේ වැඩි කැමැත්ත හෑල්ලුවට ලක් කරලා තියෙනවා. ඒක හන්දා මේවා මේ විදයට කරනවා නම් මීට පස්සේ මේ සභාව ගෙනියන්න වෙන්නේ නැහැ. අපි බය නැතිව නැගිටිනවා. ඒක නිසා මේ විදියට කරන්න දෙන්න බැහැ. ටෙන්ඩර් කැඳවුවා නම් අඩු ටෙන්ඩර් එකට දෙන්න ඕනි. ටෙන්ඩර් කැඳවන්නේ නැතිව හිටියා නම් ඒ ආයතනයට දෙන්න. ඒක නිසා මේ වගකීම ලේකම්තුමිය මත විතරක් පටවන්න එපා. ආයතන ප්‍රධානියා හැටියට අණදෙනකොට නිසි නායකත්වය ලබාදෙන්න වගකීම භාරගන්න ඕනි. එසේ භාර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් මෙම ගෙවීම සම්බන්ධව මගේ සම්පූණර් විරෝධය පළකරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
දිගින් දිගටම සභාපතිතුමා ගන්නේ මේ සභාව අගෞරවයට ලක් වෙන තීන්දු තීරණ. ආණ්ඩු පක්ෂයේ අය අපි ගේන යෝජනාවලට සහයෝගය දැක්වීම සම්බන්ධ ව දැන් අපට සතුටුයි.මෙච්චර කාලෙකට මේ වැරදි කරගෙන ආවෙ ඒ දවස් වල අපි ගේනාව යෝජනාවලට සහයෝගය නොදුන් නිසායි. මේ වැරදි කරගෙන ඇවිත් දැන් මේ සභාවේ මන්ත්‍රීවරු අප්‍රසාදයට ලක් වෙන විදිහට දැන් මේ සභාව පත් කරලා ඉවරයි.අපි මොනව හරි වරදක් පෙන්වා දෙන කොට ඒ අදාළ අයට අවශ්‍ය මොහොතේ දඩුවම් දෙන්න ඔනා.එහෙම නැතුව මේ සභාවෙන් කරන්නේ වැරදි දේට නීත්‍යානුකූලභාවයක් හදල දෙන එක.සභාවෙ මන්ත්‍රීවරුන්ගේ වැඩි කැමැත්තෙන් ඒ ගෙවීම කරන්න එපා කියලා සම්මත කරල තියෙද්දි ඒ ගෙවීම කරනවා.සභාවෙ මන්ත්‍රීවරු එකතු වෙලා වංචා දූෂණයක් හොයල දුන්නට පස්සේ ඒකට නිසි විමෂර්ණයක් නෑ.මාස ගාණක් යනවා තීන්දුවක් තීරණයක් ගන්න.මම කතා කරල කිව්ව කොට්ඨාශෙ මිරිස් කුඩු මෝලක් සම්බන්ධ ව සිදු වෙලා තියෙන වරදක් සම්බන්ධ ව.ඒ වරද පෙන්නල දුන්නට පස්සෙවත් සභාවට යුතුකමක් තියෙනවා ඒ ගැන හොයන්න.වැරදි දේට අනුමැතියක් නොදී ඉන්න.මම හිතන්නේ සභාපතිතුමා අපි ගේන තොරතුරු වැරදිනම් ඒ බව සභාවට කියන්න ඔන.එහෙම නැතුව මේ දේවල් දිගටම කරගෙන යනව නම් අපි මේ සභාවෙ මන්ත්‍රීවරු හැටියට ඉඳල වැඩක් නෑ.එක්කො සභාපතිතුමා මේ සභාව හරි මාගර්යට ගන්න. නැත්නම් ඔබ තුමා ඉල්ලා අස්වෙලා මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවයවත් රැකලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා
මම හිතන්නේ මේ අනු අංක 110 යටතේ වන යෝජනාව අපි සභාවේ වැඩි ඡන්දයකින් සභා අනුමැතිය පරාජය කළ යෝජනාවක්.ඒ සම්බන්ධයෙන් මුදල් කමිටුවෙන් සාකච්ඡා කර නැවතත් මුදල් කමිටු අනුමැතිය සඳහා යොමු කරලා තියෙනවා. ඇත්තට ම මේ වගේ තීන්දු තීරණ ගන්න නම් මානසික මට්ටම අඩු වෙන්න ඕනා. උප සභාපතිතුමා ඇත්තටම මේක සම්බන්ධ ව හෘද සාක්ෂියට එකඟ ව කතා කළේ. මං අනික් මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා තමන්ට වැරැද්දක් පේනවා නම් හෘද සාක්ෂියට එකග ව කටයුතු කරන්න කියලා.අපි කවදාවත් මේ ඉන්න මන්ත්‍රීවරු හොරු කියල කියන්නේ නැහැ .හැබැයි දිගින් දිගට ම මේ ආයතනයේ වැඩ කරන අංශවල,ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල ඇතුලේ හොරකම් සිද්ද වෙනවා.අපි ගිය සභාවෙදි කොම්පෝස්ට් අංගනයේ වරදක් සම්බන්ධ ව ඒව ඔක්කොම හොයල දුන්නත් අදටත් ගත්ත තීරණයක් නැහැ.අඩුම තරමේ සභාපතිතුමාට යුතුකමක් තිබුණා ඒ කමිටුව කැඳවන්න.මොකක්ද වෙලා තියෙන්නේ කියලා හොයල බලන්න.මේ සභාවෙ සියලු ම අංශ ගත්තම හොරකම් කරන්න සහ අයතා විදිහට ගණුදෙනු කරන්න ඉඩ ඇරල සභාපතිතුමා මේ වගකීම්වලින් නිදහස් වෙලා තියෙනවා.මේ සභාවෙ ප්‍රධානියා වශයෙන් ඔබතුමාට සහ ලේකම්තුමියට මෙහි පරිපාලනය කරන්න බැරි නම් ඔබ දෙපළ අනිවායෙර්න් ම ඉල්ලා අස්වෙන්න.ඒ නිසා ඇත්තටම මේකෙ බෙදීමක් අවශ්‍යයි. මේකට රහස් ඡන්දයකින් බෙදීමක් ඉල්ලනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

එහෙනම් මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා. ගෙවීම් ඉල්ලා අස්කරගෙන විමශර්නයට ලක් කරලා ආපසු අය කිරීමක් කලොත් අපි ගෙවන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
මේකේ ආපසු ගෙවීමක් කරන්න බෑ. ඔබතුමා ඔක දැන ගෙන කරන්න. මේකේ තියෙන ප්‍රශ්නේ ඒක නෙමේ.ටෙන්ඩර් කැඳවලා වැඩි එකකට දුන්නේ ඇයි කියන එකයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා
දැන් මේ කැබ් රථයේ තීන්ත ගැහුවේ නෑ කියලා සැකයක් තියෙනවද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
එහෙම ප්‍රශ්නයක් නෙමේනේ, අපි මේ ඡන්දයකින් පැරද වූ යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා
මම මේ කාව වත් බේර ගන්න නෙමෙ කතා කරන්නේ. මේ සභාවට යෝජනාවක් දාලා මේක මුදල් කමිටුවෙන් අනුමත කරලා මේ වැඩේ කරලා තියෙන්නේ. වංචාවක් නෙවේ තියෙන්නේ, වැඩි ටෙන්ඩර් එකකට දුන්න එක කෙලින්ම ටොයෝටා කම්පැනියට මේක දෙන්න පුළුවන්. ටෙන්ඩර් එක නැති වුනත් ඒක හරියටම කරන කෙනෙකුට දෙන්න මේ සභාවට බලතල

තියෙනවා. මේක දැන් මුදල් කාරක සභාවේ කතා කරලා තියෙන්නේ, මේක වැඩි මුදලට ගිය එකයි ගැටළුව තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා
එහෙනම් ඇයි ටෙන්ඩර් කැඳ වන්නේ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා
කම්පැණියකින් වැඩේ කරන කොට ඒ බලන්න එන අයට පවා අය කරනවා. ඒක කම්පැණි වල ක්‍රමය. මේ සභාවේ අපි මෙතන කතා කරන කොට ඒකේ අනුමත ක්‍රමයක් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා
අතුල මන්ත්‍රීතුමා යම් දැනුවත් මන්ත්‍රීවරයෙක් හැටියට මේ ඉදිරිපත් කරපු කරනු දැක්වීම තුල යම් කිසි අඩුපාඩුවක් දැක්ක නිසයි මම මේ කරුණු දැක්වීම කරන්නේ. ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ගත්තේ ඔබ තුමාට චෝදනා කරන්න නෙමේ. අතුල මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට ටොයෝටා කම්පැණියේ ගාන හරි ඇති. ඒක නෙමේ ප්‍රශ්නේ අපි ඔක සභාවට දාලා අනුමැතියක් අරන් තියෙනවා ටොයෝටා කම්පැණියට දීලා වාහනේ සවරීස් ඒක කරන්න ඔන කියලා. ඊට පස්සේ මේ ලක්ෂ 5 ගෙවීම නොකල යුතුයි කියලා සභාව සම්මත කරලා මුදල් කමිටුව අනුමත කරාට ඒක ප්‍රමාණවත් නෑ කියලා ඔබතුමා දන්නවා නේ.මේ යෝජනාව ඉදිරිපත් කරලා මම ගන්න ස්ථාවරය තමයි සභාව විසින් ගෙවීම් නොකල යුතු යැයි සම්මත කරන ලද යෝජනාවක් තිබිය දී ඊට පිටින් ටොයෝටා සමාගම විසින් එවන ලද ලිපියක් පදනම් කර ගෙන සභාවේ විමසීමක් නොකර, මේ ගෙවීම් කිරීම.එතකොට මේ සභාව හැල්ලු වෙනවානේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රී තුමා කියන එක ඇත්ත. අපි ටොයෝටා කම්පැණියට දැනුම් දුන්නා මේකේ විෂමාචාරයක් වෙලා තියෙන නිසා අපට ගෙවන්න බෑ කියලා. ඒගොල්ලෝ දිගින් දිගටම ගෙවන්න ඉල්ලීම් කලා. පසුව ලේකම්තුමිය,විමශර්න නිලධාරිගෙන් උපදෙස් ගත්තා . ඉතින් මුදල් කමිටුවේ අනුමත වුනා. දැන් මේකේ ගෙවීම් වැරදි නම් අද සභාව ප්‍රතික්ෂේප කරන්න. එතකොට අපි මේක ගෙවන්න හරි වගකීම භාර ගන්නවා. මේ වාහන පෞද්ගලික ස්ථාන වලට ටෙන්ඩර් දීලා අඩුපාඩු තිබ්බොත් ප්‍රශ්න වලට මූන දෙන්න වෙනවා. මේක හරියට කරන්නයි මේ තීරණය ගත්තේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා
මේ සභාවේ අපේ තියෙන ගරුත්වය, මේ දේවල් අතික්‍රමණය කරලා යන්න පුළුවන් නම් මේ සභාව රැස් වෙලා වැඩක් නැනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා
මුදල් කමිටුවෙන් ගෙවීම අනුමත කරා නම්, බෙදීමක් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරන්න අපිට මේ සභාවේ අවසරයක් දුන්නේ ඇයි? ඔබතුමා කිව්වා මුදල් කමිටුව අනුමත කරපු නිසා ගෙවන්න පුළුවන් කියලා. එසේ නම් මේ සභාව අපේ ඡන්දය විමසලා හැල්ලු කලේ ඇයි? ඒ වගේ ම තමයි

අපි නම් කරපු 102,103,108,110 මේවාත් දැනටම ගෙවීම් කර අවසන්ද? මම හිතනවා ඒවත් ගෙවීම් කරලා අවසන් කියලා. ගෙවීම් කරලා අවසන් කරලා අපෙන් අනුමැතිය ඉල්ලලා මේ සභාවට දාන්නේ ඇයි? ඒ නිසා මේ ගෙවීම් පිළිබඳව කිසි ම විශ්වාසයක් මට නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මට ආවරණ අනුමැතියෙන් ලක්ෂ 5 ක් ලබා දීලා තියෙනවා ගෙවන්න. මේක අහෝසි කරන්න.මේක අපි ක්‍රියාත්මක නොකර සභාවට දාලා ගෙවීම් කරන්න, මම මේ සභාවට දැනුම් දෙනවා. මුදල් කමිටුවට පුළුවන් ලක්ෂ 10 ක් වෙනකම් රැස් වෙලා ගෙවීම් කරන්න. දැන් මේ ඉඩම් ගොඩ කරන්න අපි දැනුම් දීලා තියෙනවා. මං කියන්නම් ඒ ගෙවීම් ටිකත්. ඉඩම් ගොඩකිරීම් සඳහා ලක්ෂ 5 ක් ලිව්වා. ලේකම්තුමිය මේක නොගෙව ඉන්න කොට මං කිව්වා ගෙවන්න කියලා. නැබඩ පාරේ අපි අත්පත් කරගත් ඉඩමේ ගොඩ කරලා කාණු හදන්න ඉඩම් ගොඩ කිරීමේ සංවධර්න සංස්ථාවේ නිදෙර්ශය ඕන. ඒකට පවර්ස් 1 කට ලක්ෂ 2 ගානේ ගන්නවා. මේ කාලේ මේක නො කලොත් ඉදිරියේ දී ප්‍රශ්ණයක් වෙනවා. මාස 06 ක් තුල මේ ගෙවීම් ඉවර කරන්න.අපි නීතිඥතුමා එක්ක ගිවිසුම් ගත වෙලා තියෙනවා. අන්න ඒක එකක්, ජේ.සී.බී එකක රෙපෙයාර් එකක් තියෙනවා.ඒ අනිත් එක. මම මීට පස්සේ නො ගෙවා මේක සභාවට දාන්නම්.මේක දැන ගන්න එක හොඳයි නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා
ආවරණ අනුමැතිය කියන්නේ අපට දීල තියෙන ආභරණයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
දැන් සභාපතිතුමාට ඔය කියන හැටියට ලක්ෂ 5 ඇතුලෙ ගෙවීම් කරන්න පුළුවන් නම්, ඒක බොරුවට සභාවට දාන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා
ඇත්තටම ගිය සභාවෙදි අපි කොම්පෝස්ට් අංගනයේ වැරදි ටික පෙන්නල දුන්න.එතකොටත් සභාපතිතුමා කිව්වා මම මේකෙ ගෙවීම් ටික කරන්නම් කියලා. දැන් මේ ටෙන්ඩර් කැඳවීමෙත් වැරැද්දක් තියෙනවනේ.අඩු ටෙන්ඩරයට නොදී වැඩි ටෙන්ඩරයට දීල මේ වාහනේ තීන්ත ආලේපය කරපු තීන්දුව වැරදියි. එතකොට ඒකට අපි විමශර්නයක් ඉල්ලන කොට ඔබතුමා කියනවා විමශර්නය කරලා ඒ මුදල ගෙවන්න වුනොත් ගෙවන්නම් කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

නෑ ඉතින් නැත්නම් මම වැරදිකාරයා වෙනවනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා

ඔබ තුමා වැරදිකාරයා වෙලා ඉවරයි.කොම්පෝස්ට් අංගනයේ වරද සම්බන්ධයෙන් කතා කරද්දිත් කිව්වා මම ඕක ගෙවන්නම් කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මම කිව්වේ මගේ නමින් ගත්ත ටික ගෙවන්නම් කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා
සභාපතිතුමාගේ බලතල තියෙනවනම් ඕක ගෙවන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා
එහෙම කියන්න එපා.ඔබතුමාල මේ සභාවෙ අපේ බලතල හැල්ලුවට ලක් කරන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා
මෙතන වෙලා තියෙන්නෙ ටෙන්ඩර් කරලා වැඩි ගාණට දුන්න එක.ටෙන්ඩර් නොකර ඕක දුන්නනම් ඔච්චර ප්‍රශ්නයක් නෑ.දැන් නැඟිටලා 185 යෝජනාවක් දාන්න කියන්න.ඒකට අපේ අනුමැතිය තියෙනවා.ඕක දැන් විමශර්නයක් දාන්න කියන්න බලන්න.විමශර්නයෙන් බලල කියයි මේකෙ වංචාවක් වෙලා නෑ කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
දැන් කරුණාකරලා  අපි මේකේ ඡන්දයක් විමසනවද කියලා කියන්න.අපේ කාලය යනවනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග  විමලසූරිය මහතා
මේ අතුල මන්ත්‍රීතුමා,දැන් කොම්පෝස්ට් එකේ වරදක් වෙලා තියෙනවා.ඒක ඔබතුමා පිළිගන්නවා ද? අපි ඒ වරද පෙන්නපු ගමන් සභාපතිතුමා ඒ මුදල ගෙවනවා කිව්වා.දැන් එතකොට සභාවේ දෙයක් ප්‍රශ්න කරනකොට ම සභාපතිතුමා ඒකට ගෙවනවා.එහෙම කරල වැඩක් නැනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
නෑ මං ඒ හැම ඒවටම ගෙවන්න යන්නේ නෑ.මං කියන්නේ මේකේ මොකක් හරි අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් මං ඒක ගෙවන්නම් කියලා විතරයි.අපි ගෙවපු විදිහ හරි,මේකේ වැරදි තියෙනවා නම් දෙපාතර්මේන්තු ක්‍රමය තමයි මේක විමශර්නයක් කරන එක.මන්ත්‍රීතුමා කියන්නේ සභාවෙන් ගත්ත තීරණයට පටහැනි ව ක්‍රියා කළා කියලයි.ඉතින් අපි රීති අනුගමනය කරල නැත්නම් ඒක අපි දැනුම් දුන්න ම භාර ගන්නවා.මේක මීට ඉස්සෙල්ලා සභාවට ගියපු එකක්.දැන් නැවත දාන්නේ ඒ ගෙවීම් කරපු එක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග  විමලසූරිය මහතා
මේ සභාවෙන් කැඳවන එකම කමිටුව මුදල් කමිටුව විතර ද?අනිත් කමිටු එකක්වත් කැඳවල තියෙනවද?ඉතින් අනිත් කමිටුත් කැඳවල නිදෙර්ශය ගන්න එපැයි.මෙහෙමද සභාවක වැඩ කරන්නේ?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
එතකොට අපි මේක අයින් කර ගන්න ඡන්දයක් විමසන එකට කැමති නෑ නේ

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
ඡන්දයක් විමසන්න කැමති.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
මේකෙ ඡන්ද විමසීම්වලට ගිහිල්ලා අපි කැමති නෑ බොරුවට තව සැරයක් හැල්ලුවට ලක් වෙන්න.අපි ගිය පාරත් මේකේ බෙදීමට ගිහිල්ලා පැරදිල ඉවර වෙලත් ගත්තු තීරණයක් තියෙනවද.නැනේ. මුදල් ගෙව්වා.ඒ පැරදුන එකටත් ගෙව්වා.දැන් ආයෙ මේක පැරදුනත් දිනුවත් මුදල් ගෙවල ඉවරයි.ගෙවල ඉවර වෙච්ච එකට ආපහු මොකට ද ගෙවන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
මේ ගෙවීමට විරුද්ධ ව අපි බෙදීමක් ඉල්ලනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
අපි මේවගෙන් ඉල්ලා අස් වෙනවා.වැඩක් නෑ බෙදීමක් ඉල්ලලා.ඒ වෙන්නෙත් ඔච්චරමයි.මේවට නීති මාගර්යෙන් කටයුතු කරන්න ඕනා.මේ සභාවේ වංචා දූෂණ ගැන කතා කරාට එකක්වත් වැඩක් වෙන් නෑ.අපි මේ සභාව නිවැරදි තත්වෙට ගේන්න මොන හොරකම් ගැන කතා කළත් වැඩක් නෑ ඒව සභාපතිතුමයි ලේකම්තුමියයි වහනවා.බෙදීමක් ඉල්ලපු එකට මොකද වුණේ.ඒ යෝජනාවට සල්ලි ගෙව්වා.ආයෙත් බෙදීමක් ආවත් ඊ ළඟ සභා වාරෙදි ගෙවලා විමශර්නයක් කරන්න කියයි.
ඊට අමතර ව සභාපතිතුමා මට දැන ගන්න ඕන **12,13,14,15,16,17,18,19** මුදල් භාරකරු යටතේ මැයි මාසයේ දෛනික වැටුප් යටතේ මේ වැටුප් ගෙවන්නේ කාටද කියලා ලේඛනයක් ඕන.ඒ වෙන කොට රුපියල් ලක්ෂ **15**ක මුදලක් ගිහිල්ලා තියෙනවා. විෂබීජහරණ වැඩසටහන යටතේ ගෙවල තියෙනවා එක් ලක්ෂ අසූපන්දහස් දෙසීය දාහතරයි ශත විසි තුනක්.**(RS.1 85 214.23)**ඩෙංගු මදර්න එකේ ගෙවීම් කරල තියෙනවා **264592.00**ක්. යටදොළ වත්ත උප කායර්ාලයේ දෛනික වැටුප් ගන්න සේවකයෝ පස් දෙනයි ඉන්නේ.ඊට අමතර ව දැන් මේ දිනේ වෙද්දි සේවකයෝ හැටක් විතර ඉන්නවා. මේ යටතේ ලක්ෂ **15**ට ආසන්න මුදලක් කාටද ගෙවල තියෙන්නේ කොහාටද අනුයුක්ත කරල තියෙන්නේ මේ වෙද්දි කෙහෙද රාජකාරි කරන්නේ කියලා සඳහන් ලේඛනයක් අවශ්‍ය යි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ වැඩ කරපු තැන් සියල්ලේ ම ලේඛනයක් දෙන්න බලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා
කැබ් රථය සම්බන්ධ කාරණය අවසන් වෙලා ද දන් නෑ මං පොඞ්ඩක් එළියට ගියා.දැන් ඒ ගැන කතා කරන්න අවසරනම් මේකයි සිද්ධිය.මේ කැබ් රථය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් පවතින නිසා අපි සාවදාන ව කතා කරමු.විරෝධතාවයක් තියෙනවා නම් ඒක දැනුම්

දෙන්න.මන්ත්‍රීවරු සියලු දේ පිළිබඳ ව බොහොම උද්යෝගයෙන් ප්‍රශ්න කිරීමේ රටාවකට පැමිණීම පිළිබඳ ව මුලින් ම ස්තූතිවන්ත ෙවනවා.සංවාදයේ යෙදීම සිද්ධ වෙන්න ඕන.කැබ් රථය සම්බන්ධයෙන් කතා කරන විට උප සභාපතිතුමා කිව්ව ආකාරයට මේක දිගටම දුන්නේ ටොයොටා ලංකා කම්පැණියට නම් ටෙන්ඩර් දාල අළුතින් ගෙන්නන්න අවශ්‍ය නෑ.කළින් කම්පැණියට නම් දුන්නේ ඒ කම්පැණියට ම දෙන්න ඕනා.කාට හරි ප්‍රශ්නයක් තියෙනවා නම් මේ කම්පැණියට දීම තුළ ප්‍රශ්නයක් වෙලා තියෙනවා කියලා ඒක විමශර්නය කරන්න පුළුවන්.හැබැයි ඒ බෙදීම් ඉල්ලන වෙලාවෙ එතන වංචාවක් වෙලා තියෙනවා කියලා කවුරුත් කිව්වේ නෑ.ඔබතුමාලා කිව්වේ රටේ ප්‍රශ්නයක් සහ සභාවෙ මුදල් අබර්ුදයක් සහිත මේ කාල වකවානුවේ එවැනි දේට විශාල මුදලක් වැය කිරීම නුසුදුසු බව පමණයි.ඒ නිසා ගරු මුදල් කාරක සභාවට මොන යම් වෙලාවකවත් තීන්දුවක් දැම්මෙ නෑ ගෙවීම් සිදු කරන්න එපා කියලා.ඒ නිසා කරුණාකරලා කියනවා අපි කිව්වේ ගෙවීම් කරන්න එපා කියලා නෙමෙයි ගෙවීම් ප්‍රමාද කරන්න කියලායි.ටෙයොටා ආයතනය හා සිදු කළ ගණුදෙනුවේ වංචාවක් වුණා කියලා මේ සභාව තීරණය කළා නම් මුදල් කාරක සභාවට ගෙවන්න අයිතියක් නෑ.මේ මුදල් ගෙවීම්වලට විරුද්ධ වීමේ සදාචාරාත්මක අයිතියක් මන්ත්‍රීවරුන්ට තියෙනවා.
ඊ ළඟට මේ ගණුදෙනුව සම්බන්ධයෙන් ගෙවීම සිදු නොකලොත් අපට නඩු පවරනවා කියල ටොයෝටා එකෙන් ලිපියක් එවනවා.නමුත් මේ වන විට අපි වැඩේ කරලා අවසන්.ගෙවන්න විතරයි තියෙන්නේ.වැඩේ කරල ගෙවීම් නොකර ඉන්නව නම් නඩු පවරන්න පුළුවන්.ගිය සභාවෙදි මේ ගැන ප්‍රශ්නයක් තිබුනා නම් ගෙවීම නවත්තල විමශර්නයක් සඳහා දාන්න තිබුණා.
ටොයොටා සමාගම වගේ බහුජාතික සමාගම්වල ගෙවීම් ප්‍රමාද කළොත් ඊ ළඟට යන්නේ තානාපති කායර්ාලවලට.ඒ යන්නෙත් වංචාවක් සිදු කළා කියලා.නමුත් බලාගෙන ගියා ම වංචාවක් සිදු වෙලත් නෑ.මේ පිළිබඳ ව මුදල් කාරක සභාවෙදි සාකච්ඡා කරලා මේ අබර්ුදකාරී තත්වය උඩ තමයි ගෙවන්න තීරණය කළේ.ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගැන වංචාවක් දකිනවා නම් රජයේ විගණන දෙපාතර්මේන්තුවට ලියලා මේකට සම්පූණර් විමශර්නයක් කරලා ඒ වරද නිවැරදි කර ගන්න.යම් වංචාවක් වෙලා තියෙන බවට තොරතුරු ඇත්නම් ඒවත් යොමු කරලා සියලු මන්ත්‍රීවරුන්ට ඇවිත් සාක්ෂි දෙන්න කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
සභාපතිතුමා කියන හැටියට වැරැද්දක් සිද්ධ වෙලා නෑ.නමුත් මට පේන හැටියට පළමු වරද තමයි,මේ කැබ් රථය පින්තාරු කරන්න ඕන කියලා තත්ව පරීක්ෂණ වාතර්ාවක් ගත්තේ කොහෙන්ද ?මේ කැබ් රථය එච්චර අබලන් තත්වයේ තිබුණ ද?මේක අනතුරකට ලක් වෙලා ද සම්පූණර් පින්තාරුවක් කරන්න තරම්.මේකට මුදල් කමිටුවට අමතර ව කාගෙන් ද අවසරයක් ගත්තේ ?රියදුරුගේ ලියුමට විතරක් පුළුවන් ද වැඩ කරන්න.ඒකට මට මුලින් ම උත්තරයක් දෙන්නකෝ.ඒ වගේ අවිධිමත් විදිහට වැඩේ කරල ඊට පස්සේ ටෙන්ඩර් කැඳවනවා.ඒ කරලා අඩුම ටෙන්ඩරයට නොදී තමන් කැමති එකට දෙනවා.ඒ ඊළඟ වරද.ඊට පස්සේ මේකට මුදල් ගෙවන්න කතා කළා ම සභාවෙ සම්මත කරනවා ගෙවීම කරන්න එපා කියල.ඒ කිව්වට පස්සෙ ආයෙ ගෙවීම කරනවා.අපට දැන් සභාව නඩත්තු කරගෙන යන්නවත් නොහැකි කාලෙක මෙහෙම හිතුමනාපෙ වැඩ කරන්න පුළුවන් ද?ඕන ම වැඩක් කරන ක්‍රියා පිළිවෙලක්

තියෙනවා.වැරදි ටික මම පිළිවෙලට කිව්වා.මම කියනවා අපි අද මේ දේටත් විරුද්ධ යි.බෙදීමට ඡන්දයක් ඉල්ලනවා මේ සියලු දේට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා
ටොයොටා එක ලියුමක් එවපු බව ඔබතුමා දන්නවද ?ඒක සභාවට ඉදිරිපත් කරන්න ඕන ගිය සභාවෙදි.ඒ ලිපිය ඔබතුමා දැක්කද ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා
මුදල් කමිටුවේදී ලියුමක් ආවා කියලා ලේකම් මිස් කිව්වා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා

සභාපතිතුමා බලලා නම් මුදල් ගෙවන්න කියලා මම කිව්වා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා
අනික මේ මුදල් ගෙවීම් කරල තියෙන්නේ අප්‍රේල් මාසෙ,අපේ සභාවෙ යෝජනාව පැරැද්දුවේ මැයි මාසෙ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
මේක කවුරුවත් සභාගත කළේ නැත්තෙ ඇයි?මෙතුමා කියනවා දැක්කේ නෑ කියලා.මම මේ අවස්ථාවේ යෝජනා කරනවා මුදල් කමිටුව ඉල්ලා අස්වෙන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා

මේ සභාවෙ මූල්‍යමය විනය පිළිබඳ ව අපට විශ්වාසයක් නෑ.ඒක නිසා බෙදීමක් දෙනව නම් දෙන්න.නැති නම් ඒ සම්බන්ධ ව ප්‍රතිස්ථාවරත්වයක් ප්‍රකාශ කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
නම් කරපු අංක ටිකේ ගෙවීම් ද?සමස්ථ ගෙවීම් ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා
ඒවා සියල්ල පදනම් කරගෙන තමයි.මෑත කාලයේ ගොඩක් අක්‍රමිකතා තිබුණා.මේ සභාවේ මුදල් පාලනය පිළිබඳ විනිවිදභාවයක් නෑ.අපට කිසි ම විශ්වාසයකුත් නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ ගෙවීම් සභාවට දැම්ම ම මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් පිළිගන්නවා.මේ මන්ත්‍රීවරුන් ව අපහසුතාවයට පත් කරන්න මම සූදානම් නෑ.මං කැමති කොමසාරිස් පාලනයකට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා
දැන් අපට අවශ්‍ය වෙන්නේ හරි නායකයෙක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
ඕකට උත්තරයක් දෙනවා නම් මේ සභාපතිතුමාත්,ලේකම්මිසුත් ඉද්දි අපි කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව විමශර්නයක් කරලා ගිය සභාවට වාතර්ාවක් දුන්නා.ඒකෙ වංචාවක් වෙලා තියෙද්දිත් දැන් මොකක් ද ගත්ත ක්‍රියාමාගර්ය.අපි ව අදටත් ඒ ගැන දැනුවත් කරලා නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මන්ත්‍රීතමා කියන එක මම පිළිගන්නවා.මං ඒ වාතර්ාව ඉල්ලද්දි අද උදේ තමයි ඒක මට ලැබුණේ. මට සභාව පැත්තෙන් ගොනුවක් දෙන්න. කමිටුවෙන් ගත්ත තීරණ දුන්නාම තමයි මම ක්‍රියාත්මක වෙන්නේ.ඒ නැතුව මම මේක අධෛයර්මත් කරන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
වාතර්ාවේ දෙන්න දෙයක් තියෙනවද?අපි ඒකේ කොපියක් හැම කෙනා අතටම දුන්නා. අනුක්‍රමිකතා මෙච්චරක් තියෙනවා කියලා.අපි දැන් වාතර්ාව දීලත් මාසයක් වෙනවා.මේ දුන්න වාතර්ාවවත් ඔබතුමා හරියට කියවලා නෑ.වාතර්ාවක් දුන්න ම ඒක හරියට කියවන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒක සභාගත කරන්න දෙන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා
මේකේ අපි ඉද්දි සභාගත කරන්න දෙයක් තියෙනවාද.ඔබතුමා මේ සභාවේ සභාපති.අපි පත් කරල තියෙන්නෙ ඔබතුමාව.මම මේ කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් අහන්නෙ ඔයා එක දවසක් ඇහුවද මොකක්ද මේකෙ වෙලා තියෙන්නේ කියලා.සභාපතිතුමාගේ කිසි ම උදව්වක් නැතුව අපි මේක හොයාගතතේ.මේ සම්බන්ධව වාතර්ා කිරීම සම්බන්ධව මං බන්දු තඹවිට මහත්තයාට ස්තුතිවන්ත ෙවනවා.අපිට නොමිලේ දීපු කොම්පෝස්ට් වල ප්‍රශ්නයක් නෑ.කාට .ඊට අමතර ව වෙලා තියෙන වංචාවයි අපි පෙන්ලා දුන්නේ. සභාව ඇතුලේ කොම්පෝස්ට් එකේ ලියකියවිල්ලක් තැත්නම් තව මොකක්ද හොයන්න ඕනේ.අපි හොයලා ඉවර වෙලා තමයි දුන්නේ.තව හොයන්න දෙයක් නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

පාලිත මහත්තයා තමයි මේකෙ අභ්‍යන්තර විගණන නිලධාරී.එයාගෙන් ගත්ත වාතර්ාවක් තිබ්ල මං ගිය සභාවට ඉදිරිපත් කළා.එතකොට මේ වාතර්ාවත් හොයල බලලා ඒ සුදුසු අයට දඬුවම් දෙන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය
මේ සභාවේ ඇත්තට ම මේ සිදුවීම විතරක් නෙමෙ.අපි නම් දැවැන්ත ලෙස කළකිරීම් ගොඩක ඉන්නේ.අර දැන්වීම් පුවරු සිද්ධිය සම්බන්ධ ව මට තජර්නය කරපු සේවකයා සම්බන්ධයෙන් පියවරක් ගත්ත ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම සභාවට එනකොට කරව්ට මන්ත්‍රීතුමාගෙන් ඇහුවා,දැන් මොකක් ද වෙලා තියෙන්නෙ කියලා.ඔබතුමා මාව දැනුවත් කළා.ඊට පස්සේ මන්ත්‍රීතුමන්ලා විටින් විට රැස් වෙච්ච බව ඇත්ත.මම කිසි ම බධාවක් කළේ නෑ.මම එතනට ගිහින් වාඩි වෙන එක සුදුසු නෑ කියලයි මම හිතුවේ.ඊට පස්සේ මං වාතර්ාවක් ඉල්ලුවා,ඒක මට අද උදේ තමයි ලැබුණේ.ඒ ගැන මම ඉතාමත් ම කණගාටු වෙනවා.මං ඕන ම තීරණයක් ගන්න කැමතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරව්ට මහතා

මේ වාතර්ාව දැන් හරි ලැබුණ එක ගැන සතුටු යි.අතුල මන්ත්‍රීතුමා මේකෙ වංචාවක් වෙලා නෑ කියලා කිව්වත් මේකෙ වංචාවක් වෙලා තියෙනවා.අපිට සභාවෙන් දීපු වාතර්ාවේ එකතුවෙත් වැරැද්දක් තියෙනවා.අපි මේ වාතර්ාව පිළිගන්නෙත් නෑ.මං මේ සභාවට පස්සේ ඇවිත් කිව්ව මේ වාතර්ාව හදන්න,එකතු කරන්න පුළුවන් කෙනෙක් ව දාන්න කියලා.නැත් නම් අපි අපහසුතාවයට පත් වෙනවා.මේ සම්බන්ධව පත්තරේට වාතර්ා කරලා තිබුණේ කිසි ම ප්‍රශ්නයක් නැති ගාණට. ඒක සම්පූණර් වැරදියි.මාධ්‍යවේදීන් සභාවෙන් තොරතුරු ගන්න ඕන.දැන් මාසයක් යනකනුත් මේ පිළිබඳ ව සොයා බැලීමක් නොකරපු එක පිළිබඳ ව කණගාටු යි.මොකද මේ සභාවෙ මන්ත්‍රීවරු තමයි මේ ගැන හොයන්න අපි ව පත් කළේ සහ එහි සභාපතිවරයා වශයෙන් මාව පත්කළේ.අපි එකතු වෙලා හොයාගත්ත මේ වංචාවට සාධාරණයක් අවශ්‍ය යි.මේ ගැන දිගට ම කතා කළත් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැනේ.දැන් මාසෙකටත් වැඩියි.මේ කොම්පෝස්ට් එක හදන්න අපි ළඟ වැඩ පිළිවෙලක් තියෙනවා.ඒක දැනුවත් කරන්න අපිට අවස්ථාවක් දුන්නේ නෑ.මං කියන්නේ  අපේ මේ කමිටුව විසුරුවා හරින්න ,නැත් නම් ඉදිරි වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

වාතර්ාවක් නැතත්, අපි කරුණු වශයෙන් ඉදිරිපත් කලා. කමිටුවක් පත් කළේ, වංචා දූෂණ පිළිබඳව හොයන්න. සභාපතිතුමාට යුතුකමක් තිබුණා ඊට පහුවදාම මේ ගැන හොයලා බලලා කටයුතු කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඔබතුමාලාගේ කමිටුව ඉවර බව මම දන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මමත්, කරව්ට මන්ත්‍රීතුමත් මේ සම්බන්ධව මොකද කරන්නේ කියලා කතා කරා.  මමයි කිව්වේ මොකුත් කරන්න එපා කියලා. සභාපතිතුමා ගන්න තීරණය මොකක්ද කියලා අපි බැලුවේ, සභාපතිතුමා මාසයක් යනකන් කිසිම පියවරක් ගත්තේ නෑ. දැන් තමයි වාතර්ාව ලැබිලා තියෙන්නේ, ඉතින් මේ සභාවේ කොච්චර දේවල් කතා කලත් වැඩක් තියෙනවද, ඔබතුමාට පාලනය කර ගන්න බැරි සභාවක් මේක. මේක කොමසාරිස් පාලනයකට දාන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඊයේ දවසෙම මම මෙතන හිටියේ මේ ප්‍රශ්ණ වල ඉතුරු ටික හොයාගන්න බව ලේකම්තුමිය දන්නවා. අද උදේ කිව්වේ කමිටුව ඊයේ වෙනකන් තිබුණ කියලා. ඉතින් කමිටුව තිබුණම ඒ වාතර්ාව මට අරගෙන දෙන්න ඕන ලේකම්තුමිය. එතුමියටත් ලැබිලා තියෙන්නේ අද උදේ,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු ජයනෙත්ති මහතා

මම යෝජනාවක් කරනවා මේක කාරක සභාවක් කරලා වාතර්ාව දෙන්න ප්‍රමාද වුනේ ඇයි කියලා ලේකම්තුමියගෙන් අහන්න කියලා .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

මේ වාතර්ාව මාසයක් ප්‍රමාද කරපු එක වැරදියි. මේකේ වැරැද්දක් තියෙනවා. මේ වාතර්ාව දීලා තියෙන්නේ, මතුගම ප්‍රාදේශීය සභාවෙන්. මේකේ දත්ත දීලත් මේ පිළිබඳව ක්‍රියා නොකරපු එක පිළිබඳව මන්ත්‍රීවරු කැගන එක නවත්තන්න බෑ. මේකේ තියෙන දත්ත ටිකවත් නිවැරදි නැහැ. මේ වාතර්ාව අලුතින්ම හදලා දින **15** ක් තුළ දෙන්න ඕනා. එක පොහොර කිලෝ **1** ක් වත් මං අරගෙන ගියේ නෑ. මට මේකට සම්බන්ධ වෙන්න පුළුවන්.නමුත් මම කිසිම බලපෑමක් කරන්නේ නෑ. ඒ නිසා මේ සම්බන්ධව සම්පූණර් නිවැරදි වාතර්ාවක් ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

වාතර්ාව නැවත හදන්න. නමුත් තියෙන ටික ආයේ වෙනස් කරන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

අපට තියෙන ප්‍රශ්නය සභාපතිතුමා මෙතන ප්‍රධානියා විදිහට මොකක් හරි වංචාවක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කලාට පස්සේ ඔබතුමාට වගකීමක් තියෙනවා ඒ අදාළ කමිටුවට කතා කරලා විස්තර ටික අහ ගන්න. ඒ ඉදිරිපත් කරපු දේවල් හරිද වැරදිද කියලා හොයලා බලන්න. මේක පොඩි දෙයක් නෙමේ නේ, ඒකයි සභාපතුමාගෙන් වෙන්න ඕන කාරණය. ඒක වෙන්නැතිව දැන් සභාවේ දී අහන කොට තමයි සභාපතිතුමා අතට වාතර්ාව එන්නේ. හැමදාම කියන්නේ දේශපාලඥයෝ හොරකම් කරනවා කියලා. වරදක් කරනවා නම් කවුද කියන එක අදාළ නෑ . හැමෝටම දඬුවම් දෙන්න ඕනා. මෙතනින් ඒක අපි නිවැරදි කර ගන්න ඕනා . එහෙම නැතිව මේ දේවල් කල් අරිනවා කියන්නේ අපරාදයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් මහතා

කොම්පෝස්ට් අංගනයේ ගැටළුව සම්බන්ධව කතා කරන කොට අතුල මන්ත්‍රීතුමා කිව්වා තව මාසයක් කල් දෙන්න ඕන කියලා. නමුත් සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති මම පහුගිය දිනයක ඔය ගැටළු ගැන සාකච්ඡා කරන්න සභාවට ආවා. නිශාන්ත මන්ත්‍රීතුමාත් ප්‍රේමරත්න මන්ත්‍රීතුමාත් හිටියා. ලේකම්තුමියට මතක ඇති මේ විමශර්න කටයුතු කල් යන්නේ ඇයි කියලා මං ඇහුවා. ඒ සම්බන්ධව අදාළ කමිටු වාතර්ාව ලැබිලා නැති බවයි එදා කිව්වේ.නමුත් කමිටු වාතර්ාව ඒ වෙන කොටත් සභා ගත කරලා තිබ්බේ.අපි තකර් කරාම ලේකම්තුමිය ලියුමක් අත්සන් කර ගත්තා ඒ අදාළ වාතර්ාව විමශර්නයට යවනවා කියලා. මං ඉදිරියෙමයි අත්සන්

කළේ, එතකොට ලේකම්තුමිය දැන් මේ වෙනකොට දවස් විසි ගානක් විතර ගිහිල්ලා ඒ ලිපියට ලැබුණු ප්‍රතිචාරය මොකක්ද? ඒ අදාළ තැන් වලට යැව්වද, එතකොට තව සතියක් කල් දීම පිළිබඳවයි මං මේ කියන්නේ, ඇත්තටම මේ මන්ත්‍රීවරු හැල්ලුවීමක් මේ වෙලා තියෙන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මේ නිළධාරින්ගෙන් අහන්න පුලුවන් වෙන්න සභාව කාරක සභාවක් කරගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මම කාරක සභාවක් යෝජනා කරනවා. දැන් ලේකම්තුමිය උත්තර දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා

ඔබතුමාලා කමිටුවක් දාලා ඒකේ යම් පරීක්ෂණයක් කරලා කොම්පෝස්ට් ලැබීමේ අඩුවක් තියෙන බව හොයා ගත්තා. ගරු අතුල මන්ත්‍රීතුමා කිව්ව විදිහට අපි තවත් ඉදිරියට ගිහිල්ලා මෙයට අදාළ සියලුම සේවකයින්ගෙන් සෘජුවම ප්‍රශ්න කරමු. එතකොට ඒ අය සාක්ෂි දෙයිනේ, ඒ සාක්ෂි සටහන් කර ගන්න. එතකොට අපිට බලා ගන්න පුළුවන් වැරදි කවුද කියලා කවුද මේ පොහොර අරගෙන ගියේ කියලා. ඊට පස්සේ අදාළ අයට නිසි දඬුවම් දෙන්න කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

ධම්මික මන්ත්‍රීතුමාට මම ආයෙත් කියනවා මීට වැඩිය අවබෝධයෙන් කටයුතු කරන්න කියලා. කමිටුව ඔය හොයා ගන්න ඕන කරුණු ටික හොයලා තමයි දුන්නේ. මේ කමිටුවෙන් එදා අපි පැහැදිලි කලා කවුද ගත්තේ කියලා ඔයා සභාවෙන් 12 ටත් කලින් නැගිටලා ගිහිල්ලා 12 න් පස්සේ වෙන දේවල් දන්නේ නැනේ. මේ සභාව එදා උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. ඒ කමිටුව තමයි පත් වෙලා ඔය ටික හොයලා ගත්තේ, ඔබතුමා දන්නැත්නම් අහන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා

දැන් එදා ඒ කොම්පෝස්ට් ප්‍රශ්ණය පිළිබඳව විමශර්නයක් කලා නම්, මේ පොහොර ටික කවුද අරගෙන ගියේ කියලා හොයා ගෙන තියෙන්න ඕනා .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සූරංග විමලසූරිය මහතා

හොයා ගත්තා නෙමේ, කිලෝ 34000 ට වෙච්ච දෙයක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා

මේ කමිටුවේ සියලු මන්ත්‍රීවරුන්ට හොඳ උද්යෝගයක් තිබීම පිළිබඳව පරණ මන්ත්‍රීවරයෙක් විදිහට මම සතුටු වෙනවා.හැබැයි අද වෙනකම් මේකේ තීන්දුවක් ගත්තේ නැති එක ගැන කණගාටුයි. ඒ වගේම මන්ත්‍රීවරු කිව්වා මාසෙට ලක්ෂ 10 ක අදායමක් සභාවට ගන්න පුළුවන් කියලා. නැත්නම් මේකේ අපට වැඩක් වෙන්නේ නෑ. ඒ නිසා හොරු බේරන්න එපා කවදාවත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා

ඇත්තටම මේ ප්‍රශ්නය ගැන කතා කරන කොට සභාපතිතුමා අසරණයි. මේකේ තියෙන ප්‍රශ්ණ දිගටම මතු කලේ මම. දැන් මේකේ වුනත් තියෙනවා සංග්‍රහ වියදම් රු. 10000 /- ක් කියලා. රු.10000/- ක් යනවද මේ තේ එකක් දෙන්න. ඉතින් ඒ නිසා මේකේ මුල ඉඳන්ම හැම දේම වරදක් තියෙනවා. කොම්පෝස්ට් අංගනයේ වැඩසටහනට ඇත්තෙන් ම සභාපතිතුමා දායක වුනේ නෑ. ඔබතුමා හිතන්න එපා මේ මන්ත්‍රීවරු හතුරෝ කියලා. ඒ වගේම අපි ලේකම්තුමියට කිව්වා නගරයේ කසල වලින් මුදල් ගන්න ඕන අයගේ ලැයිස්තුවක් හදලා දෙන්න කියලා. අද වෙනකන් ඒ එකක්වත් ආවේ නෑ. පොලේ තියෙන ප්‍රශ්ණ ගැන කතා කරන්න ඒ වෙළෙන්දොත් ගේන්න අපි සැලසුම් කරලයි තිබුනේ. නමුත් මෙතන නිළධාරින්ගේ සහ ඔබතුමාගේ දැක්ම අනුව එතන අපි අසරණ වුනා. නැතිනම් එතනත් ආදායමක් ගන්න කතා කරලා තිබුනේ. ඒ වගේම 2021 ඉඳන් කසල ටික එතන තියෙනවා. ඒක අදායම් වලට පත් කරලා නිශ්පාදනය වැඩි කරන්න සියලු සැලසුම් තිබුණා. නමුත් ඔබතුමා නිළධාරින්ව බේර ගන්න ගිහින් ඒ එන දෙයින් ප්‍රයෝජනයක් ගත්තේ නෑ. ඔබතුමාට දෙයක් බලලා තේරුම් අරගෙන කරන්නත් බෑ. ඔබතුමා දැන් හරි තීරණයක් ගන්න. මේ නිළධාරින්ගෙන් කිසිම වාතර්‍ාවක් එන්නේ නෑ.හැමදාම වුනේ ඒකයි.මෙතන ඉන්න තරුණ මන්ත්‍රීවරුන්ට යමක් කිරිමේ අවස්ථාව ලැබෙන්නේ නෑ. අපි කියන්නේ ඒ අයට අවස්ථාව ලබා දෙන්න ඕනා. මේ මන්ත්‍රීවරුන් විශ්වාස කරන්න. නගරෙට ගිහිල්ලා පොලේ ගාස්තු වැඩි කරන්න ඕන දෙයක් කතා කරන්න අපට පුළුවන්, සභාවේ අයව දාලා රු.100/- ක් එකතු කර ගන්න එක ප්‍රායෝගික නෑ. රම්සාන් මන්ත්‍රීතුමා අද අලුත් යෝජනාවක් කරලා තියෙනවා. මේක දියුණු කරන්න අපට සහයෝගය දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂන මුණසිංහ මහතා

කොම්පොස්ට් ප්‍රශ්නය සම්බන්ධ ව වැඩි දුර හොයන්න දෙයක් නෑ. අපි දීලා තියෙන සාරාංශයයි, ඔය වාතර්‍ාවයි එකතු කරලා බලන්න. 2017 සිට 2018,2019,2020,2021, වෙනකන් අවුරුද්දෙන් අවුරුද්දට කොම්පොස්ට් වලට මොකක්ද වෙලා තියෙන්නේ කියලා ඔතන තියනවා. එතකොට ආයේ අමුතුවෙන් විමශර්නය කරන්න දෙයක් නෑ.බන්දු මහත්තයාගේ නම සඳහන් කළ නිසා මම මේකත් කියන්න ඕන.පත්තරේ තියෙන්නේ සභාපතිතුමා කියපු ටික.නැතුව බන්දු මහත්තයා හදල දාපු එකක් නෙමේ.මේ ගණන් මිනුම් සියල්ල පත්තරේ සඳහන් කරන්න බෑ.නමුත් නිලධාරීන්ෙග් වංචාවක් සිදු ව ඇති බව එතනින් සඳහන් වෙනවා.සභාපතිතුමා කියපු දේ වැරැද්දක් තියෙනවා.පත්තරේ දැම්මෙ ඒක තමයි.එතුමා කියපු දේ වැරදියි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඔව් ඉතින් මේක නීත්‍යානුකූල කරගෙන අය කර ගන්න ක්‍රියාත්මක කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

අපි සභාවේ ඇතුලේ තියෙන තොරතුරු ටිකෙන් තමයි මේ හොරකම් ටික හොයා ගත්තේ. ඒ 2017 සිට මේ වෙනකම් දුන්න ලියකියවිලි ටිකේ තමයි කිලෝ 34500 ගාණක හොරකමක් වෙලා තිබුනේ.අපට නො දුන් තොරතුරු තව කොපමණ ඇති ද?ඒවත් දුන්න නම් අපි මීට වඩා හොයලා දෙනවා.කොපමණ කොම්පෝස්ට් හැදුවද, කාටද දුන්නේ,කොපමණ දුන්නද කියල සටහනක් සභාවෙ නෑ.මොන වාහනේද අරගෙන ගියේ කියල සටහනක් නෑ.මේක කළිනුත් කිව්ව වගේ සභාපතිතුමාත්,ලේකම්තුමියත් හිතාමතා ම මඟ හැරලා තියෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

අවිධිමත්භාවයක් තියෙන පොහොර ප්‍රමාණය පිළිබඳවත්,මේ පොහොර ප්‍රමාණයන් වල වෙනසක් පවත්නා බවත් මං මේ වාතර්‍ාවෙන් දැන ගත්තා.මේ පොහොරවලට මොකක් ද වුණේ කියලා තව දුරටත් විමශර්නය කරලා මුදල් අය වෙන්න ඕන කාගෙන්ද කියලා හොයන්න ඕනා.මෙතන මගේ අඩුපාඩුවකුත් තියෙනවා.මම මාස ගාණකින් කොම්පෝස්ට් එකට ගියේ නෑ.මේකට කොළඹින් පිරිසක් එනවා කමිටුවක් තියන්න.ඒ කමිටුවෙන් තීන්දු තීරණ ගන්නවා. මම කිව්වා මේක විධිමත් කරන්න කියලා. අපි පත් වුණා ම තමයි මේ පොහොර අළෙවි මධ්‍යස්ථානය ආරම්භ කෙළේ.ඒක මම දැන් ආපහු කියන් නෑ.එතනින් මම මාසිකව ලැබෙන පොහොර සහ යවන පොහොර ප්‍රමාණය පිළිබඳ ව ගත්තා. දැන් මේ නාමල් මන්ත්‍රීතුමාත් පොහොර ටිකක් ගත්තා.දැන් පොහොරවල වැඩි නිශ්පාදනයකුත් තියෙනවා.පොහොර අංගනයේ ඉන්න නාමල්ගේ වැඩ මාසයක් නවත්තන්න කියලා මම ලේකම්තුමියට කිව්වා.මේක හොයා ගන්න ඕන නිසයි එහෙම කරන්නේ.මං නාමල්ගෙන් ඇහුවා “ඇයි මේ ගැන මාව දැනුවත් කරේ නැත්තේ” කියලා.” මගෙන් කිසි ප්‍රශ්නයක් ඇහුවේ නෑ සේවකයින්ගෙන් විතරයි ඇහුවේ කියලා ඔහු කිව්වා”.තාවකාලික ව එයා ව මෙහෙට ගන්න. එතකොට ඒ සේවකයින්ගේ තොරතුරු ටික අපට ලැබෙනවනේ.මට හංගන්න දෙයක් නෑ.මම පොහොරවලින් වංචාවක් කළේ නෑ.මම වරදක් කළා නොමිලේ පොහොර අරගෙන.හැබැයි ඒ ගත්ත ටිකත් ඉන්දිකා මහින් බෙදුවේ.එයාගෙනුත් දීපු ටිකේ තොරතුරක් එන්නේ නැහැ .අපි විශේෂයෙන් කරපු දෙයක් තමයි කහ වගාවට ගම්වලට පොහොර ගෙන්නුව එක.මං වරදක් හැටියට කියනවා නෙමෙයි.මාත් එන්නම් අපි මේක හොයමු.මම මේ කමිටුව විශ්වාස කරනවා.මේ කමිටුවෙන් ගේන තොරතුරු ටික අපිට කරන්න බැරි නම් විමශර්න නිලධාරියෙකුට හරි භාර දෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

දැන් මේකෙ වෙනසක් වෙලා තියෙනවා කියලා හොඳින් ම පේනවනේ.මේ කොම්පෝස්ට් එකේ ඉන්න නිලධාරීන් ව මාරු කරලා වෙන නිලධාරීන් ව ඒකට දාලා වෙනස පෙන්වන්න.එක මාසයක් එහෙම ගෙනියන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මමත් කියන්නේ වෙන කෙනෙක් දාලා එක මාසයක් පාලනය කළා ම වෙනස පේනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

එක මාසයක් අපට අවස්ථාවක් දෙන්න.මේකට අපේ කමිටුව ඇතුලේ වැඩ පිළිවෙලක් තියෙනවා කියලා මම කිව්වා.ඒක කරන්න අවස්ථාවක් දෙන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

දැන් මේ කමිටුවේ තියෙන වාතර්ා ටික අරගෙන නීත්‍යානුකූල ව මේ අය ව කැඳවන්න.මේක ලේකම්තුමියට කරන්න අපහසු නිසා පරිසර නිලධාරී මහත්තයා මේක කරන්න.දැන් සභාවෙන් ඒකට බලය දෙන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

ලේකම්තුමිය මේකට දැනට අරගෙන තියෙන ක්‍රියාමාගර් කියන්න.

ගරු ලේකම් අයිරාංගනී තෙන්නකෝන් මහත්මිය

ගිය සභාවෙදිත් කළේ මේ වාතර්ාව සභාගත කරන එක.සභා වාතර්ාව කියෙව්වා.මුද්‍රණය කර නොතිබූ නිසා පසු ව කමිටුවට ලබා දෙනවා කියලා කිව්වා.ඇත්තට ම ඒක ලැබුණේ නැහැ.ඒ ප්‍රමාදය තියෙන්නේ.මං ඊයෙ සංජේ මන්ත්‍රීතුමාට කිව්වා වාතර්ාව ලැබුණේ නෑ කියලා.දැන් මේක සභාගත කරල තියෙන්නේ.එ නිසා මට එකේ පිටපතක් දෙන්න කියලා.අද උදේ තමයි හම්බුණේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

සභාපතිතුමාට අද උදේ වාතර්ාව ලැබුණද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

නෑ,මට මේ දැන් ලැබුණේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

දැන් අපි මේ සභාවෙ දි කොම්පෝස්ට් එකේ ප්‍රශ්නයක් තියෙනවා කිව්වා.සභාපතිතුමා ඒ ප්‍රශ්නය හොයන එකයි කරන්න ඕන.දැන් දින කීයක් ඕන ද මේකට තීරණයක් දෙන්න.අපි වැඩ පිළිවෙලක් දුන්නා මේ විදිහට කරන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දශර්න ජයසේකර මහතා

අපි කමිටුවට කැඳවන්නේ නැතුව හිටියේ ඔබතුමන්ලා තීරණයක් ගන්නේ නැති හින්දා.ඊයේ හවස මගෙන් වාතර්ාව ඉල්ලද්දි මම කිව්වා.දැන් ගෙනාවේ නෑ.හෙට උදේට දෙන්නම් කියලා.ඒ නිසා දන්නැති කතාව කියන්න එපා.ඔබතුමන්ලා දැන ගන්න ඕන කළින් ඉල්ල ගන්න.අපි

බලාගෙන හිටියේ ඔබ දෙපළ මේකට ගන්න ක්‍රියාමාගර්ය මොකක් ද කියලා.අපි හිතුවේ මේ සභාවට එනකොටවත් වැඩ පිළිවෙලක් හදාගෙන එයි කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සංජීව මහත්තයා,ඕගොල්ලෝ මේ දේවල් පිළිබඳ ව කතා කරන්න මෙතනදි.කාරක සභාවට නිලධාරීන් ව ගෙන්නන්නේ ඒකට.

ප්‍රජා සංවධර්න නිලධාරී කේ.කේ.ඩී.ආර්.සංජීව මහතා

කොම්පෝස්ට් අංගනය විධිමත් කිරීමේ යෝජනාව අපට ලැබුණා.මමත් ඒ කමිටුවේ හිටියා.නොයෙක් වෙනස්කම් කොම්පෝස්ට් අංගනයේ වෙන්න ඕන කියලා එතන දි සාකච්ඡා කළා.ඒ අනුව අපි මේ වෙනකොට කොම්පෝස්ට් අංගනයේ වෙනස්කම් කරලා තියෙන්නේ.පොහොර අංගනයට කසළ ගේන කොට ඒ හැම එකට ම පොතක් දාන්න කිව්වා.හැම රියදුරා ම කසළ ගේන කොට ඒ දාල තියෙන පොතේ අත්සන් කරන්න ඕනා.මේ වෙනකොට ඒක කෙරෙනවා.ඒ වෙනස්කම කමිටු නිදෙර්ශයක් මත සිදු කළේ.ඒ වගේ ම කොම්පෝස්ට් හැලීම සඳුදා,බදාදා,සිකුරාදා දවස් තුන තුළ දී සිදු කරනවා.ඊට අමතර ව පොහොර ඇණවුමක් ආවොත් පොහොර ප්‍රමාණය මදි නම් අඟහරුවාදා,බ්‍රහස්පතින්දා දෙකේත් හලනවා.මේ දිනවල හලන්න යොමු කරලා තියෙන පොහොරවල පොලිතින් ගොඩාක් තියෙනවා.ඒ නිසා ඒවා ඉවත් කරලයි හලන්නේ.ඒ සඳහා පොඩි කාලයක් ගත වෙනවා.පොහොරවල ප්‍රමිතිය වැඩි වීම සඳහායි එසේ සිදු කරන්නේ.ඒ විදිහට පොහොර හැලීම සිදු කරනකොට සංවධර්න නිලධාරී රවිඳු මහතාව නිරීක්ෂණ කටයුතු සඳහා යොමු කරනවා.

පොහොර අළෙවි කිරීම යටතේ කිසි ම හේතුවක් මත කොම්පෝස්ට් අංගනයේ දී පොහොර කිසිවෙකුටවත් ලබා දෙන්නේ නෑ.සභාවේ වාහනේකට පමණයි එහි දී පොහොර ලබා දෙන්නේ.එයත් කමිටු තීරණයක්.පසු ගිය කාලයේ දී නොමිලේ පොහොර ලබා දීම වැඩි වශයෙන් සිදු කෙරුණත් මේ වෙනවිට එය නවතා තිබෙනවා.සභාවේ නිලධාරීන්ට සහ මන්ත්‍රී මණ්ඩලයට සහනදායී මිළක් යටතේ ලබා දෙනවා.පොහොර කොට්ටයක සාමාන්‍ය මිළ රු.800ක් වන අතර නිලධාරීන්ට සහ මන්ත්‍රී මණ්ඩලයට රු.500කට ලබා දෙනවා.ඒකත් මාසෙකට කොට්ට 5ක ප්‍රමාණයක් වැටෙන ලෙසටයි ලබා දෙන්නේ.එයත් කමිටු තීරණයක්.

නොදිරන ද්‍රව්‍ය අළෙවි කිරීම යටතේ එය සිදු වන අවස්ථාවේ දී මම එතන ඉඳන් අළෙවිය අවසාන වෙලා සල්ලි මෙහෙට ගෙනත් බඳිනවා.

මුරකරුවන් යෙදවීමේ දී කළින් තිබුනේ උදේ 6 සවස 4 දක්වා.දැන් ඒකට පූණර්කාලීන ව සේවකයෝ යොදවලා තියෙනවා.

බොබ් කැට් එකට සේවකයෙක් යොදවලා තියෙන්නේ.නාමල් ව එතනින් ඉවත් කරලා උදය නෙලුපුල් ව යොදවලා තියෙන්නේ. මේ වෙනස්කම් ටික මේ වෙනකොට කරලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

සංජීව මහත්තයා,අපි එදා කමිටුවේ යෝජනා කළා මෙම අංගනයේ පොහොර නිකුත් කරන්න නොහැකි වෙලාවට මෙතන හැම වෙලාවෙ ම යම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගන්න.රියදුරන්ට

වගකීමක් තියෙනවා එතනින් කොම්පෝස්ට් පොහොර නිකුත් කරනවා නම් දෙන ප්‍රමාණයට අත්සන් කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේක සක්‍රීය වෙන්නේ නෑ.මේක අළෙවි සැලෙන් ම දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා
අවම වශයෙන් කොට්ට 150ක ස්ටොක් එකක් තියාගන්න රවිඳු මහත්තයාට කියන්න.හවස කුණු එකතු කරන් එන වාහනේ ම දවසේ ස්ටොක් එක මෙතනට එවන්න.

ප්‍රජා සංවධර්න නිලධාරී කේ.කේ.ඩී.ආර්.සංජීව මහතා

ඒ වගේම නාමල් මන්ත්‍රීතුමා පොහොර ගත්ත වෙලාවෙ ගැටළුවක් ඇති වුණා. අපි ඒක විසඳීමට කටයුතු කරා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

කොම්පෝස්ට් අංගනය ඇත්තට ම ලොකු මුදලක් ගන්න පුළුවන් තැනක්.මේ කොම්පෝස්ට් හලන ක්‍රියාවලිය දිගට ම කරන්න.සේවකයෝ මදි නම් ක්ෂේත්‍ර කම්කරුවන් ඕන කෙනෙක් ව එතනට දාන්න.සේවකයින්ට වැටුපක් ගෙවන්නේ ඒකට.එක එක්කෙනාගේ ගෙවල්වල වැඩ කරන්න සේවකයෝ ගෙනියන්න එපා.දැන් මේක විධිමත් කරන වැඩ පිළිවෙලක් අපි හදලා තියෙනවනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
කැමරා එකක් හදන වැඩපිලිවෙල පිළිබඳ ව අදහස මොකක් ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

කැමරා හයි කරන්න ඕන නෑ.මේ තියෙන සම්පත්වලින් ප්‍රයෝජනයක් ගන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ආණ්ඩුවේ විගණනයෙන් මට කොට්ට 200ක් දාලා තිබුණා.මම නොමිලේ දුන්න එක මගේ නමට දාන්න කියලා මම කිව්වා.ඒ වගේ ම මේ හොයාගත්ත එකෙත් කොට්ට විශාල ප්‍රමාණයක් තියෙනවා.ඒකත් මගේ ගිණුමට ම දාලා.මම ඒකත් ගෙවන්නම්.මොකද මම පරීක්ෂණයට යන්න ඕන මේක නිරවුල් කරලා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඒක නෙමේ ගැටළුව.දැන් මේ කිලෝ 34 000ට කවුද ගෙවන්නේ?ඒ කෙනා කවුරු වුනත් මේක ගෙවන්න ඕනා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒක අපි හෙට ඔබතුමාලා මුණගැහිලා ඒ වගකීම ගන්න කෙනා හොයා ගෙන එයාට දෙමු ඒක ගෙවන්න කියලා. මන්ත්‍රීවරුන්ට මම දුන්න ලිස්ට් එක තියෙනවා.ඒක මම ගෙවන්නම්.කිලෝ 34 000ට මම ගෙවන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඔබතුමා ගෙවන්න ඕන නෑ මේකට.මේ කිලෝ 34 000 ඇතුලේ ඔය කියන එකක්වත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

දැන් මේ කොම්පෝස්ට් අංගනයෙන් වුණ පාඩුවට ඒ මුදල් කොහෙන් හරි ගෙවන්න ඕන කියලා මතයක ඉන්නවනේ.දැන් මං අහන්නේ අපි පොළේ ගණුදෙනුව රු.50000එක රු.ලක්ෂ තුනහමාර දක්වා වැඩි කරලා පෙන්නුවා.එතකොට ඊට පෙර ඒ වංචාවෙන් සභාවට පාඩු වෙච්ච මුදල කවුද ගෙවන්නේ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මම කියන්නේ ඕක තමයි.තව සතියක් විතර ගියාට පස්සේ ඔතනින් එහාට ඔය ප්‍රශ්නය යන්නේ ඔහොම තමයි.මම කියන්නේ මෙහෙම කරලා වැඩක් නෑ.ඒක නෙමේ වෙන්න ඕන.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා

ඒක තමයි ඒ දවස්වල අපි කිව්වේ රුපියලක් හොරකම් කළත් ඒක මැදිහත් වෙලා හොයන්න කියලා.ඒ දවස්වල යෝජනා එහෙම ගෙනාවම හැමෝම ඒක හොයලා බලන්නේ නැතුව සම්මත කරනවා.නමුත් ඒකෙන් හානියක් වෙන්න පුළුවන්නේ.එහෙම වුණා.එතකොට ඒ දවස්වල මේ නිලධාරීන්ගේ වංචා දූෂණ හොයන්න මැදිහත් වෙලා තිබුණා නම් අද මෙහෙම වෙන්නේ නැනේ.වැරදි කරපු අයට දඬුවම් දිය යුතු යි.මං හිතන්නේ අපි බය වෙන්න ඕන නෑ.අපට බලය පාවිච්චි කරන්න පුළුවන්.ඒ අනුව වැරදි කරන ඒවා නවත්තන්න පුළුවන්. දැන්වත් අපි කෙළින් වැඩ කරලා මේක හරි මඟට ගන්න කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මට මේකට මන්ත්‍රීවරු සියල්ල ම උත්තරයක් දෙන්න.අපි දැන් කමිටුවක් පත් කරලා කොම්පෝස්ට් අංගනය සම්බන්ධ ව වරදක් වෙලා තියෙනවා කියලා හොයා ගත්තා.එතකොට ඒ වරදට මාසයක් කල් දුන්නා,දැන් ඒ 34 000ට කාගෙන් ද අය කර ගන්නේ කියලාත් ප්‍රශ්නයක් තියෙනවා.හැබැයි,එදා ඉඳන් සිදු කළ නිශ්පාදනයන් පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමක් සිදු කර නැති නිසා මේ අය කර ගැනීම් කරන්න නිසි වැඩ පිළිවෙලක් හදන්න විදිහක් නෑ.එහෙන් මෙහෙන් හොයා ගෙන තොරතුරු දීලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

හෙට දිනේ වෙද්දි එතනට වෙන කෙනෙක් දාලා සතියක් යන්න කළින් අපට වාතර්ාවක් හදලා දෙන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මී ළඟට ශ්‍රවණාගාරයේ වාහන අංගනය පිළිබඳ කතා කළා.අපි එම තොරතුරුවල වාතර්‍ාවක් ශ්‍රවණාගාරයේ භාරකරු මඟින් ලබා ගත්තා.වාහන 20ක් සාමාන්‍ය වශයෙන් මෙහි ගාල් වන බව තහවුරු ව තියෙනවා.ඒ මුදල් බැඳලා තියෙන බවත් පේනවා.අපි මේ අය ව හඳුනා ගැනීමට නම,වාහන අංකය ආදී වශයෙන් පත්‍රිකාවක් මුද්‍රණය කළා.එහි තොරතුරුත් අධීක්ෂණයට ඔබට ලබා දෙන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය

පසු ගිය සභා වාරයේ දී කටවුට් ප්‍රශ්නය සම්බන්ධයෙන් සොයා බැලීමට මන්ත්‍රීවරු පස් දෙනෙක්ගෙන් යුතු කමිටුවක් පත් කරනු ලැබුවා.පුබුදු මන්ත්‍රීතුමා,සුරේෂ් මන්ත්‍රීතුමා,සුදේශ් මන්ත්‍රීතුමා,සීතා මන්ත්‍රීතුමිය සහ මම ඒ අතර වනවා.පුබුදු මන්ත්‍රීතුමා සහභාගි වුණේ එක් වාරයක් සඳහා පමණයි.ඒ නිසා කසුන් මන්ත්‍රීතුමා සහාය දැක්වූවා.ඒ කමිටු වාතර්‍ාව මේ සභාවට ලබා දීමට හැකියාවක් නැහැ.අපට දුන් තොරතුරු පරස්පර විරෝධී වුණා.එතන දී අපි අවසාන සාරාංශය සැකසීමට ලේඛනයක් ඉල්ලුවා.මේ සභාව සමඟ ගණුදෙනු කරන ඇඩ්වටයිසින් ආයතන 9ක් පිළිබඳ ව අපට වාතර්‍ාවක් දුන්නා.ඒ 9න් 5ක් ම සභාවේ සේවකයින් කරගෙන යන්නේ.ඒ කටවුට්වල පිහිටි ස්ථානය,කටවුට් ගණන,වගර් අඩි ප්‍රමාණය දැන ගැනීමට අවශ්‍ය නිසා අපි ඒ පිළිබඳ ව ඉලිලීමක් කර ලිපියක් දුන්නා.එහි මුල් පිටපත ලේකම්තුමියට දෙන්නම් කියලා RI මහත්තයා භාර ගත්තා.අපි මේ ලිපිය දුන්නේ අගෝස්තු 01 වැනිදා.අපි මේක ඉල්ලුවේ අගෝස්තු 8 වෙනිදාට.අපි ඊයේ රැස් වෙලා ඒ වාතර්‍ාව සකසන්න බලද්දි ලේකම්තුමියට ලිපිය ගිහින් නෑ.ඒ වෙලාවේ ලිපිය හැම තැන ම හෙව්වත් ලිපිය අස්ථානගත වෙලා.ඒ නිසා අවසාන සාරාංශයක් දෙන්න පුළුවන්කමක් නෑ.යටදොල වත්තේ සහ ගල්මත්තේ තොරතුරු ඇතුලත් විධිමත් ලේඛනයක් දුන්නත් මතුගම ප්‍රධාන කාය්‍ර්ාලයේ එ වැනි ලේඛනයක් නැහැ.ඒක නිසා අපට තොරතුරු ලබා දීමට නොහැකි බව පවසා අපි ඒ වෙලාවේ ලේකම්තුමිය ව දැනුවත් කළා.ලිපිය නොලැබීම පිළිබඳ ව එතුමිය අපෙන් සමාව ඉල්ලුවා.තව ද මේ පිළිබඳ ව තොරතුරු ලබා දීමට 20වෙනිදා වන තෙක් කාලය ඉල්ලුවා.තොරතුරු ලද පසු ව අපි ඒ වාතර්‍ාව සකස් කරන්න සූදානම්.

කටවුට් සම්බන්ධ ව ලොකු ප්‍රශ්නයක් තියෙනවා.දැනටමත් මතුගම බල ප්‍රදේශයේ පමණක් කටවුට් 54ක ලොකු මුදල් ප්‍රමාණයක් නො ලැබී තියෙනවා.අපි මේ පිළිබඳ ව ජුනි 15 සභාගත කිරීමත් සමඟ තමයි මුදල් ටිකක් ඇවිත් තිබුණේ.මේ කටවුට් ගැහුවේ 2021නොවැම්බර්. 2022 ජුනි වන තෙක් මේ මුදල් තිබුණේ කා ළඟ ද ?ඇයි සභාවට ගෙව්වේ නැත්තේ ?ඒ ගොල්ලෝ කිව්වේ සභාව අපෙන් සල්ලි ගන්නේ නෑ කියලා.

ඊ ළඟට 2022 මැයි මස 24 දා තමයි සභාවේ සේවකයෙක් මට මේ සම්බන්ධ ව කතා කරපු නිසා මරණීය තජර්න එල්ල කළේ.නමුත් මේ සභාවෙන් මට ඒ අසභ්‍ය ලෙස කතා කළ එක පිළිබඳ ව අහන්නවත් ඒ සේවකයාව එක දවසක්වත් කැඳෙව්වේ නෑ..මම මේ වංචාවට විරුද්ධ ව කතා කළ නිසා අද වන විට මේ සභාවට ලක්ෂ ගණනක මුදලක් ලැබී තියෙනවා. නමුත් මේ සභාව ක්‍රියා කළ ආකාරය පිළිබඳ ව මම දැඩි ලෙස හෙලා දකිනවා.කමිටුවේ සහෝදර මන්ත්‍රීවරු මේ පිළිබඳ ව වැඩි දුර සාකච්ඡා කරයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මෙ පමණ කලක් මේ මුදල් කොහොම එකතු කළා ද කියලා මට ගැටළුවක් පවතිනවා.මේ කාල සීමාව වන තුරුත් මේ කිසි ම බෝඩ් එකක් පිළිබඳ ව සඳහන් කිරීමක් නෑ.ඒ පිළබඳ ව වාතර්ාවක් ගන්න සති දෙකකටත් බැරි වුණා.මේක අවුරුදු ගාණක් තිස්සේ කරගෙන ආපු ව්‍යාපාරයක්.මේ බෝඩ්වලින් සභාවට මුදල් ආපු ක්‍රමවේදයක් තියෙනවා.අඩු ම තරමේ රාජ්‍ය ආයතනයක මුදල් භාවිතා කරන ආකාරයේවත් පිළිවෙලක් නැහැ.මේ සභාවේ මොන වැඩේ ගත්තත් හොරකමක් මිස සභාව පවතින්න හදපු ක්‍රමවේදයක් කොතනකවත් නැහැ.අඩු ම තරමේ සමහර ඇඩ්වටයිසින් බෝඩ්වල නම්බර් එකක්වත් නැහැ.අපි මේ කතා කරන්නේ සභාවට අහිමි වූ මුදලක් ලබා ගැනීමට යි.මේ පිළිබඳ ව කතා කරපු නිසා තව සල්ලි ලැබෙන්න තියෙද්දිත් මේ වනවිට ලක්ෂ 7යි ගාණක් ද කොහෙද සභාවට ලැබිලා තියෙනවා.එම සකස් කරන වාතර්ාවේ දී අපි ඉතුරු තොරතුරු ටික ලබා දෙන්නම්.මට දැන ගන්න ඕන මේක කරන වසන්තගෙන්, 2020,2021 වෂර්වල දී සල්ලි එකතු කළේ නැත්තේ ඇයි කියලා.

ඒ.කේ.පී.වසන්ත මහතා

මේ බෝඩ් ව්‍යාපාරය අපි තුන් දෙනෙක් එක්ක 2017 වෂර්යේ දී පටන් ගත්තේ.මේක පටන් අරන් යද්දි ගැටළු මතු වුණා.මේක අපි මතුගම නගරයේ ටියුෂන් ගුරුවරුන්ට හඳුන්වා දෙන්න ගියා ම ගුරුවරු තුන් දෙනෙක් මේකට හිනා වුණා.වෙන ගුරුවරු අපෙන් මේ බෝඩ් ගත්තා.අපි මේකට 2017දි සල්ලි ගෙව්වා.පසු ව මේක අපි තුන් දෙනාටත් කරගෙන යන්න බැරි වෙන කොට අපි මේ බෝඩ් 4 බැගින් බෙදා ගත්තා.එහෙම කරගෙන යද්දි මේ ගුරුවරු තුන් දෙනා අපේ බෝඩ් ඉවත් කරන්න උත්සාහ කළා.රුවන්දි මන්ත්‍රීතුමිය අවුරුදු 4ක් තිස්සේ මේ බෝඩ් සම්බන්ධ ප්‍රශ්නේ හෙව්වා.එතකොට මේ අපේ ව්‍යාපාරය කරගෙන යන්න බැරි තත්වයට පත් වුණා.මුලින් අපි බෝඩ් එකක් ගැහුවම පළමු සතියේ තමයි මුදල් ගන්නේ.මේ ගැටළුව විසඳෙන්නේ නැති නිසා අපට බෝඩ් දීගන්න බැරි වුණා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

විසඳෙන්නේ නෑ කියන්නේ,ඕගොල්ලෝ මුදල් නොගෙවපු එකයි ප්‍රශ්නේ වෙලා තියෙන්නේ.ඒකෙන් සභාවට අය වෙන්න ඕන මුදලක් අහිමි වෙලා තියෙන්නේ.එතකොට බෝඩ් කපන්න ඕන කියන තැනට අපි එන්නේ ඔයා සල්ලි නොගෙවීමත් එක්ක.ඔයා සල්ලි ගෙවපු බෝඩ් එකක් අපට කපන්න බෑනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

බෝඩ් එකක් සවි කළා ම ඒ බෝඩ්වල සල්ලි සභාවට එන්නේ කොහොම ද ?කවුද ඒ ගාන හදලා දෙන්නේ?

ඒ.කේ.පී.වසන්ත මහතා

අපි පෞද්ගලික ව බෝඩ් එකක් හයි කරලා ඒ සල්ලි ගන්න කියලා මෙහෙට බිලක් දුන්නා ම ඒ අදාළ අංශයෙන් තමයි හදලා දෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා**

**මේක සම්පූර්ණයෙන් ම වැරදියි.අතුරු ව්‍යවස්ථාව කියවලා නෑ.බෝඩ් හයි කරන ස්ථානයක් කිව්වාට පස්සේ පරීක්ෂණයක් කරන්න ඕනා.ඇත්තට ම මේ මුදල් ලැබිලා නෑ.ලියුමක් දීලා සභාවෙන් අවසරය ගන්න ඕනා.**

**ඒ.කේ.පී වසන්ත මහතා**

**සල්ලි දෙන්නේ නෑ.අවසානයේ තමයි සල්ලි දෙන්නේ.අපි 2018,2019 ගෙව්වා.2020,2021 කොරෝනා තත්වය මත මේ ව්‍යාපාරය කඩා වැටුණා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

**ඒ ගොල්ලෝ ඉල්ලීම් කරලා ලිඛිත ව භාර දෙනවා නම් මේ අතුරු ව්‍යවස්ථාවේ බලය තියෙනවා සභාපතිතුමාට.**

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

**සභාවෙන් අවසර ගන්න ඕනා මුලින් ම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

**මේ බෝඩ්වල දිග,පළල, දෙන්න ඕනා.පාවිච්චි කරන අවකාශය පිළිබඳ ව සඳහන් කරලා ඒ ස්ථානය සටහන් කරගන්න ඕනා.දැන් මේ බෝඩ් ටික ගහලනේ තියෙන්නේ.ඒත් මේ බෝඩ්වල මුදල් ලැබීමක් සිදු වෙලා නෑ.එතකොට ඔයා ඇයි මේකේ මුදල් ගෙව්වේ නැත්තේ?ඒ අවුරුදු දෙකේ සභාවෙන් සහනයක් දුන්නා ද?**

**ඒ.කේ.පී වසන්ත මහතා**

**ඉතුරු ටිකත් මම පැහැදිලි කරලා ඉන්නම්.ඒ තත්වය උඩ අපට බෝඩ් දීගන්න බැරි වුණා.එතකොට බෝඩ් 1 ප්‍රදශර්නය වෙලා මාසේ අන්තිමට තමයි අපට සල්ලි දෙන්නේ.ඒ තත්වෙට පත් වුණා.ඊට පස්සේ කොරෝනා ආවා,ඒත් එක්ක ම අපට වැඩ නැති වුණා.මේ ව්‍යාපාරය කඩාගෙන වැටුණා.සල්ලි බැන්දේ නැත්තේ මෙහෙන් මගෙන් සල්ලි අර ගත්තේ නැහැ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

**සභාපතිතුමා,ඕවා කොහේ හරි සටහන් කරගන්න.මෙහෙන් සල්ලි අරගෙන නෑ.**

**ඒ.කේ.පී.වසන්ත මහතා**

**මෙහෙන් සල්ලි අරගත්තේ නැති එක විතරක් නෙමෙයි මෙහෙන් බෝඩ් ගහන්න අවසර දුන්නේත් නෑ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

අවසර නොදුන්නා නම් මේ බෝඩ් ගහලා තියෙන්නේ කොහොම ද?කවුද අවසර දුන්නේ?

ඒ.කේ.පී වසන්ත මහතා

අපට දැන ගන්න ලැබුණා බෝඩ් එකක් ගහගන්න මෙහෙන් අවසර දෙන්නේ නෑ කියලා.2019,2020 බෝඩ් වැඩි වුණේ නෑ. දැන් මේ බෝඩ් වැඩි වුණේ 2022, කොරෝනා ඉවර වෙනවාත් එක්කමයි.මෙහේ විතරයි මේ ප්‍රශ්නය ඇති වුණේ.වෙන කොහේවත් මෙහෙම ගැටළුවක් ඇතිවෙලා නෑ.මේ මන්ත්‍රීතුමියත් එක්ක මගේ කිසිම තරහක් නෑ.මං හිතනවා මේ මන්ත්‍රීතුමියත් මගෙත් එක්ක තරහා නැතුව ඇති.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය

ඔයා මට අසභ්‍ය වචනයෙන් බැන්නේ ඒ නිසා ද?ඔයා පිළිගන්නවාද මට අසභ්‍ය වචනයෙන් බැන්නා කියලා.

ඒ.කේ.පී වසන්ත මහතා

මේ ගැටළුව සම්බන්ධ ව අවුරුදු 4ක් මම මන්ත්‍රීතුමියට එක වචනයක් කියලා නෑ.අහලාවත් නෑ ඒ ගැන.මගේ ව්‍යාපාරයක් මේක.මම මන්ත්‍රීතුමියට දූරකථන පණිවිඩයක් අරගෙන ඇහුවා,"රුවන්දි මන්ත්‍රීතුමිය,මොකක් ද මේකේ ගැටළුව? මේකේ මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා නම් කියන්න,අපි මේක කතාබහ කරලා විසඳගමු කියලා".කිව්වාම මන්ත්‍රීතුමිය කිව්වා, "ඔයා මේ බෝඩ් මාෆියාවක් ගෙනියන්නේ.ටියුෂන් ගුරුවරුන්ගෙන් මෙච්චර ලොකු මුදල් ප්‍රමාණයක් අරගෙන ප්‍රාදේශීය සභාවට සොච්චමක් බඳිනවා" කියලා.

මං කිව්වා, "මේක අපේ ව්‍යාපාරයක්.මම විතරක් නෙමේ ලංකාවේ සියලු ම තැන්වල කරන ව්‍යාපාරයක් මේක."කියලා.ඊට පස්සේ කිව්වා,"ගුරුවරුන්ට තර්ජනය කරනවා කියලා.'මම කිව්වා, "තර්ජනය කරනවානම් මට විරුද්ධ ව පොලීසියේ පැමිණිල්ලක් කරන්න කියලා.මන්ත්‍රීතුමිය ඇයි මාත් එක්ක මේ ප්‍රශ්නය කියලා."එකේ හේතුව මට පස්සේ දැනුනා.මං අර කලින් කිව්ව ගුරුවරු තිදෙනාගෙන් ප්‍රදීප් කියලා කෙනෙක් ඉන්නවා.එයා මේ මන්ත්‍රීතුමියට කියනවා මගේ බෝඩ් ටික,මේ නගරේ බෝඩ් තියෙන ස්ථාන ටික අරන් දෙන්න කියලා.එයාට අපේ බෝඩ් තියෙන තැන්වල එයාගේ බෝඩ් දාගන්න පුළුවන්නේ.

ඕන ගුරුවරයෙක්ට පුළුවන් සභාවට සල්ලි ගෙවලා ඕන තැනක බෝඩ් එකක් හයි කරගන්න.අපි බලෙන් මේක දෙන්නේ නෑ.කවුරුහරි අපට සල්ලි දුන්නොත් අපි මේක ගහන්න දෙනවා. ඒ ගුරුවරයාට පසු ව බෝඩ් සවි කරගන්න බැරි වුණා.ඊට පස්සේ රුවන්දි මන්ත්‍රීතුමියගේ ඡායාරූපයක් තියෙන බෝඩ් දාලා තැන් කීපයක ස්ථානගත කළා.දැන් එයාටත් බෝඩ් ටිකක් තියෙනවා.පසුව අපට ප්‍රශ්න ගෙනාවේ ඔය ගුරුවරයා.ඕක තමයි මේකේ ඇත්තම දේ. මන්ත්‍රීතුමිය මට කිව්වේ "මම ගුරුවරුන්ට තර්ජනය කරලා තියෙනවා "කියලා.මම කිව්වා "මම එහෙම තර්ජනය කරලා තියෙනවා නම් පොලීසි යන්න" කියලා.මම වැරැද්දක් කරලා නෑ.අවුරුදු 4ක් තිස්සේ මේ ප්‍රශ්නය යන්න හේතුව මොකක් ද කියලා මම ඇහුවා.

"ඔයා ගුරුවරුන්ගෙන් සල්ලි ගන්න මාෆියාවක් යන්නේ, ඒක කරන්න දෙන්න බෑ.අපි මේ ගුරුවරුන්ට ඒවා ගහන්න තැන් දෙන්න ඕන කියලා" මට බැන්නා."ඔයා දන්නවාද මම කවුද

කියලා?.මගේ බලතල ඔයා දන්නවාද? ඔහොමද මට කතා කරන්නේ?" කියලා කිව්වා.ඊට පස්සේ මන්ත්‍රීතුමියයි මමයි එකට එක කියා ගැනීමක් සිදු වුණා.මම ඒක නෑ කියන්නේ නෑ.ඒක එතනින්- ඉවරයි.ඊට පස්සේ මන්ත්‍රීතුමියගේ මහත්තයා ජංගම දූරකථනය අරගෙන "ඔයා කවුද?" කියලා ඇහුවා.මම නම කියලා, "මෙතන මේ වගේ ගැටළුවක් තියෙනවා" කියලා කිව්වා. "හරි මල්ලි අපි මේක කතා කරලා විසඳගමු" කියලා කිව්වා.මම ආයේ දෙපාරක් විතර ඔහුට කෝල් ගත්තත් ඇමතුමට ප්‍රතිචාර දැක්වූයේ නෑ.මම මේ මන්ත්‍රීතුමිය එක්ක තරහා නෑ, මන්ත්‍රීතුමියගේ හිතේ මොන දෙයක් තියෙනවාද මම දන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය

මගේ හිතේ කිසි දෙයක් නෑ.බෝඩ් එක්කයි මේ ප්‍රශ්නේ තියෙන්නේ.

ඒ.කේ.පී වසන්ත මහතා

මං හිතන්නේ මන්ත්‍රීතුමියට ඕන වුණේ අර ගුරුවරයාට උදව් කරන්න.මට ඕන මේ ව්‍යාපාරය දිගටම කරගෙන යන්න.මතුගම ප්‍රාදේශීය සභාවේ විතරයි මේ ගැටළුව වුණේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා

නෑ. ඔයා සභාවට සල්ලි ගෙවලා නෑ කියලා ඔප්පු වෙලා තියෙනවානේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

ප්‍රශ්නේ තියෙන්නේ මේකයි.සභාවේ මන්ත්‍රීවරියකට සභාවේ තියෙන දේවල් ගැන ප්‍රශ්න කරන්න පුළුවන්. මේ සභාවේ තියෙන දේවල් ගැන හොයා බලන්න එතුමියට අයිතියක් තියෙනවා.අනිත් එක ඔයා කතා කරන දේවල් ඔයා හොයා ගත්ත දේවල් මිස කොහේවත් තහවුරු වීමක් වුණ දේවල් නෙමේනේ.අනිත් එක ඔයාට අයිතියක් නෑ එහෙම කතා කරලා අහන්න.ඔයාට පුළුවන් සභාවේ ඒ අදාළ නිලධාරීන් එක්ක කතා කරන්න. මුලින් ම සභාපතිතුමාගෙන් ලිපියක් මඟින් අවසර ගන්න ඕනා.එතුමා අවසර දෙනවා නම් ඔයාට ඒක ගහන්න පුළුවන්.මන්ත්‍රීතුමිය එක්ක කතා කරලා විරසක වෙන්න අවශ්‍යතාවයක් ඇත්තේ ම නැහැ.මේ කතා කරන දේවල් සම්පූර්ණ වැරදියි.ඒක ඔයා පිළිගන්න ඕනා.ඕනම දෙයක පිළිවෙලක් තියෙනවානේ.ඒ පිළිවෙලට යන්න ඕනා.මේ කතා කරන දේවල්වලට ඔයා නීත්‍යානුකූල ව වැඩ කරලා තියෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.ඔයා ඒ මුදල් ගෙවලා තියෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.ඒ දේවල් හරියට නොකර ඔයාට බෑ මෙතුමියත් එක්ක පැටලෙන්න.සම්පූර්ණ වැරදි.ඒක පිළිගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඔයා හරියට වැඩේ කළා නම්,මේ මන්ත්‍රීතුමිය සභාවට එන්නේ 2018දී.ඊට කළින් ඔයා බෝඩ් ගහලා තියෙන්නේ.ඔයා හරියට සල්ලි ගෙවලා තිබුණා නම් ඔයට ගැටලුවක් වෙන්නේ නෑ.ඔයාගේ ක්‍රියාකාරීත්වයේ සහ ඔයා කතා කරපු ආකාරයේ තමයි ගැටළුව තියෙන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

දැන් ඔයාගේ බෝඩ් කීයක් තියෙනවා ද ?

**ඒ.කේ.පී වසන්ත මහතා**

**ඔක්කෝම නම් කීයද දන් නෑ.තව බෝඩ් වගයක් තියෙනවා පෞද්ගලික ඉඩම්වල.බෝඩ් 10ක් විතර ඇති.ඔක්කෝම 32ක්.ලොකු බෝඩ් 13ක් විතර තියෙනවා.**

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

**දැන් ඔයාට හිඟ මුදල් ගෙවන්න තියෙනවා ද ?මග හැරුණු ඒවා තියෙනවාද RI මහත්තයා ?**

**සුනිල් ප්‍රසන්න මහතා**

**ලේඛනවල හිඟයක් නෑ.පරණ ඒවා ගෙවලා තියෙන්නේ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා**

**හිඟයක් නැතිවෙන්න බෑනේ.මෙයා දැන් කිව්වා වසර දෙකක් ගෙව්වේ නෑ කියලා.ඔයාට කියන්න බෑ හිඟයක් නෑ කියලා.**

**ඒ.කේ.පී වසන්ත මහතා**

**අපට ගෙවන්න තත්වයක් තිබුණේ නෑ.අපට ලියුම් ආවෙ නෑ මේ රටේ තිබුණ තත්වෙත් එක්ක.**

**සුනිල් ප්‍රසන්න මහතා**

**මේ අවුරුද්දේ තව බෝඩ් 16ක විතර මුදල් ලැබෙන්න තියෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

**අද මේ 8 වන මාසේ වෙනකනුත් සල්ලි එකතු කරලා නැත්තේ ඇයි?එතකොට 2020 මාතර්ු 19 රට ලොක්ඩවුන් කළේ.ඕගොල්ලෝ බෝඩ් ගහන්නේ ඔක්තොම්බර් නැති නම් නොවැම්බර්.මාස 6 ක සල්ලි තියෙනවා.ඔයා ඒක මග හැරලා තියෙනවා.**

**ඒ.කේ.පී වසන්ත මහතා**

**අපේ ලොකු බෝඩ් 5ක් විතර 7වන මාසෙයි හයි කළේ.අළුත්ගම පාරේ 1ක්,අගලවත්ත පාරේ 2ක්,කළුතර පාරේ 2ක් තියෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා**

**මින් පස්සේ මේ බෝඩ් එක සවි කරන දිනේ දාන්න ඕනා.මේක මුදල් එකතු කරන්නත් ප්‍රශ්නයක් වෙනාවානේ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

ඔයා බෝඩ් එකක් ගහන්න ඉල්ලීමක් කරනවනේ.ඒ ඉල්ලීම් ලිපියේ තියෙන්න ඕනා කවදා ඉඳන් කවදා වෙනකන් ද කියලා.එතකොට මේ බෝඩ් සම්බන්ධ ව වාතර්ාවක් තියෙන්න ඕනා.ඕක තමයි පරිපාලනේ දුවර්ලයි කියන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා

මේ ව්‍යාපාරය පටන් ගත්තේ 2017දී.ඔයාගේ බෝඩ් 12ක් තිබුනණේ මතුගම.ඒකට ඔයා පළමු අවුරුද්දේ මුදල් ගෙව්වනේ.2019,2020 ගෙව්වේ නෑ.එතකොට ඒ බෝඩ් 12ටම ගෙවන්න කියලා සභාවෙන් ලිඛිත ඉල්ලීමක් කළා ද?එතන තමයි පළමු වැනි වැරැද්ද.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මේ ප්‍රශ්න මේ සභාවේ කතා කරන එක මන්ත්‍රීවරුන්ගේ වගකීමක්.මෙයා ඒ මන්ත්‍රීවරියට අසභ්‍ය වචනයෙන් බැනලා තියෙනවා.ඒකයි මෙයා කරලා තියෙන වරද.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

මෙයාගේ වරදක් තියෙනවා.මෙයා කොරෝනා කාලෙදි අපහසුතාවයට පත් වෙන්නැති.නමුත් බෝඩ්වලට අය කිරීම නතර කරන්න කියලා සභාවෙන් ඉල්ලීමක් කරන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් ජයසිංහ මහත්මිය

කමිටුවේ කෙනෙක් ලෙස මම වසන්තගෙන් අහන්න කැමතියි ඔබතුමා මේ ප්‍රාදේශීය සභාව ඇතුලේ කරන රාජකාරිය මොකක් ද?

ඒ.කේ.පී වසන්ත මහතා

වරිපනම් එකතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් ජයසිංහ මහත්මිය

දැන් ඔබතුමා තව ව්‍යාපාරයක් කරන්නේ මේ සභාව ඇතුලේමයි.සභාවේ ලොකු අඩු පාඩු තියෙනවා.ඔබතුමා වගේ මේ ආණ්ඩුවේ රාජකාරි කරන කෙනෙකුට රාජකාරි කරන ආයතනයක ව්‍යාපාරයක් කිරීමේ අයිතිය පැවරීම සම්බන්ධ ව.මම හිතන්නේ යම් කායර්යක් කරනකොට ක්‍රමානුකූල බවක් තියෙන්න ඕනා.ඒකට සභාවත් වගකිව යුතුයි.ඔබතුමාත් දැනුවත් විය යුතුයි.නමුත් මෙතන ප්‍රශ්නේ වෙලා තියෙන්නේ දෙපැත්තෙන් ම වෙච්ච අඩුපාඩු.ඉදිරියට අළුතින් බෝඩ් ගහන අධ්‍යාපන ආයතන ඉන්නවා නම් ඒකෙ මූලිකත්වය ගන්න කෙනාව කැඳවන්න. කැඳවලා අපට ඉල්ලීම් ලිපියක් දෙන්න කියන්න.ජනවාරි 1වැනිදාට කළින් මේක කරන්න ඕනා.එහි දී ඒ බෝඩ් එක ඕන ප්‍රමාණය,ඕන ස්ථානය ආදී දේ සඳහන් විය යුතු යි. එතකොට එයා දන්නවා බෝඩ් කීයක් තියෙනවා ද කියලා.සභාවත් දැනුවත් වෙන්න ඕනා.ඒ වගකීම අරගෙන මුදල් ප්‍රමාණය වෙන් කරලා ඒක කරන්න.මේ බෝඩ්වල වැඩ කරන්න වෙන ම නිලධාරී කෙනෙක් පත් කරලා මේ කායර්ය ක්‍රමානුකූල ව කරන්න.නැති නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය

මම වසන්ත මහත්මාගේ ප්‍රකාශයට උත්තරයක් දෙන්න ඕනා.ඔය කියන විදිහට ප්‍රදීප් කුමාර සර් බෝඩ් ගහන්න පටන් ගත්තේ 2021,2022 ඉඳන්.මේ දැන්වීම් පුවරු සම්බන්ධ ව නිරවුල් කරන්න කියලා මම යෝජනාව සභාවට දැම්මේ 2018 මැයි මාසේ.ඒකට කමිල් මන්ත්‍රීතුමා,කසුන් මන්ත්‍රීතුමා,කරවිට මන්ත්‍රීතුමාත් යෝජනාවක් දැම්මා.මෙයාට චෝදනා කරන්න බෑ.මම එක පුද්ගලයෙක් වෙනුවෙන් මේක කතා කරනවා කියලා.මම කතා කළේ 2018 ඉඳන්.හේතුව තමයි, ටියුෂන් ගුරුවරු විදිහට මමත් කවිරත්න සතර් ප්‍රාදේශීය සභාවට පත් වෙලා ඉන්නවා. කවිරත්න සර් මේ බෝඩ් මාෆියාවට එරෙහි ව බේරුවල ප්‍රාදේශීය සභාවේ හඬක් නඟලා ඒක ක්‍රමවත් කළා.එතුමා මට කතා කරලා බැන්නා,"ඔයාට සහෝදර ගුරුවරු වෙනුවෙන් මේ සභාවේ බෝඩ් මාෆියාවට එරෙහි ව හඬක් නඟන්න බැරි ද?" කියලා.එ නිසා යි මම 2018 මැයි යෝජනාවක් දැම්මේ.මම කොතනකවත් මෙයා ගැන පෞද්ගලික ව කතා කරන්නේ නෑ.මේ යෝජනාව දිගට ම ක්‍රියාත්මක නොවුණ නිසා ආපසු 2022 මැයි මාසෙ මේක කතා කළා.මම මේක සභාපතිතුමා එක්ක කතා කරන්න කළින් ප්‍රදීප් සර් සභාපතිතුමාව හමුවෙන්න ඇවිත් තිබුණා.බෝඩ් දාන්න ඇවිත් මෙයාත් එක්ක ගැටුමක් ඇති කරගෙන මරණීය තර්ජන කරපු නිසා යි සර් තනියෙන් බෝඩ් දාන්න ගියේ.එතකොට ඔබතුමා කිව්වා ඕන තැන් තීරණය කරගෙන මට කියන්න,ඕගොල්ලෝ සභාවට ගෙවලා බෝඩ් දාගන්න කියලා.එතකොට ප්‍රදීප් සර් මාව ඉත්තට තියලා බෝඩ් දාලා නෑ.එතුමා සභාපතිතුමා හමු වෙලා කතා කරලයි බෝඩ් දැම්මේ.ඒ බෝඩ් එකේ මගේ පෙරවරු පාසල ගැන දැන්වීමක් ගියා.ඒක මෙයාට අදාළ නෑ.ඒක මගේ වෘත්තිය.පස්සේ 2022 මැයි 24 කතා කරපු එකට තමයි මෙයා 2022 මැයි 25 කතා කරලා මට බැන්නේ.ගත්ත හැටියේ ම අසභ්‍ය වචනයෙන් කතා කළේ.ඒ කතා කරන වෙලාවේ මගේ මහත්තයා දුරකථනය උදුරලා ගත්තා.මෙයා මට ඇසිඩ් ගහනවා කියලා තර්ජනය කරලා තිබ්බා.ප්‍රදීප් කුමාර සටර්ත් කතා කරලා වාහනේ යට කරලා මරණවා කියලා තර්ජනය කරලා තිබුණා.මම ඒ සර් වෙනුවෙන් කතා කරනවා කියලා හිතලා ඒක නවත්තන්න කියලා ඒ සටර් කතා කරලා මරණීය තර්ජන කරනවා මට කියන්න කියලා.හෙට දවසේ මේ මන්ත්‍රීධුරය ගැළවුනත් මමත් ටියුෂන් ගුරුවරයෙක්.මම කතා කළේ මගේ වෘත්තිය සම්බන්ධ ව සාධාරණයක් දෙන්න ඕන නිසා.2018 ඉඳන් සමහර බෝඩ්වලට මුදල් අය කරගෙන නැහැ.ඒවාට නොගෙවා බෝඩ් ගහන්නේ කොහොමද?.සුරේෂ් මන්ත්‍රීතුමා කිව්ව වගේ අතුරු ව්‍යවස්ථාවේ තියෙනවා,බෝඩ් ගහන්න කළින් සභාවෙන් අවසර ගන්න ඕන කියලා.කවද්ද මේගොල්ලෝ බෝඩ් ගහන්න අවසර ගත්තේ?අනිත් බෝඩ් සම්බන්ධව කටයුතු කරන සේවකයන්ටත් මරණීය තර්ජන කරනවා.මේ බලය තමයි මෙයා පෙන්නුවේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මේ ප්‍රශ්න සියල්ල ඇතිවෙලා තියෙන්නේ සභාපතිතුමා සහ ලේකම්තුමිය අපි කතා කරන කිසි ම දේක වගකීමක් ගන්නේ නැති නිසා.2018,2019 අපි දාපු යෝජනාවලට ඒ දවස්වල හරියට උත්තර දුන්නා නම් අපි මේවා විසඳලා.පරිසර කමිටුව කැඳවලා ඒ කමිටුවෙන් වාතර්ා ටික දුන්නා නම් අද මේ ප්‍රශ්නේ නිලධාරීන්ටත් නෑ,මේ මිනිසුන්ටත් නෑ.ඔය දෙන්නා එකතු වෙලා මේ මිනිස්සුන් ව අමාරුවේ දාන්න එපා.ඒ නිසා ලේකම්තුමිය අස් වෙලා යන්න.ලේකම්තුමිය අපි ගේන යෝජනාවලට කතා කරන්නේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඊට ඉස්සෙල්ලා මම යෝජනාවක් ගෙනැල්ලා මේ ස්ථාන RI මහත්තයාට දැනුම් දුන්නා.මේ එකක්වත් කළේ නැති එක වරදක්.සභාපතිගේ බලය ලේකම් හරහා සෑම ක්ෂේත්‍රයකම ප්‍රධානීන්ට දීලා තියෙනවා.ක්‍රමය ඒකයි.මේ බෝඩ්වලට මම RI මහත්තයාට සහ රුවන්දි මන්ත්‍රීතුමියට දැනුම් දුන්නා අපේ බල ප්‍රදේශයේ බෝඩ් ටික ඡායාරූපගත කරන්න කියලා.ඕගොල්ලෝ ඒක කළේ නෑ.ඊට පස්සේ මේ බෝඩ්වල අඳින්න කිව්වා බලපත්‍රය පටන් ගත්ත සහ අවසන් වන දිනය.මේවා කළේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මේ දේවල් නොකරනවා නම් මේගොල්ලන්ට දඬුවම් දෙන්න ඕනා.

සුනිල් ප්‍රසන්න මහතා

බෝඩ් 79ක දින ලියලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

මෙයා ව්‍යාපාරයක් කරන්නේ.මට පේන හැටියට මේකේ වරදකරුවෝ වෙන්නේ මතුගම ප්‍රාදේශීය සභාව.නිසි ආකාරයෙන් තීරණයක් නොගැනීමයි ප්‍රශ්නේ.වසන්ත,දැන් ඔයා පිළිගන්නවා මෙතන වරදක් වුණා කියලා.මම හිතන්නේ මේක මෙතනින් ඉවර කර ගත්තම හරි.ඔයාගේ ව්‍යාපාරය කරගෙන යන්නත් ඕනා.මේ මන්ත්‍රීවරියගේ ගෞරවය රැකෙන විදිහට වැඩ සිදු වෙන්නත් ඕනා.ඒ නිසා මන්ත්‍රීවරියගෙන් සමාව භජනය කරලා මේ වැඩේ ඉවර කර ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඇඩ්වටයිසින් ආයතනය මොකක් වුණත් මේ සභාවේ මන්ත්‍රීවරුන්ට එහෙම කතා කරනවා නම් බලපෑම් කරනවා නම් ඒ ආයතනය පිළිබඳ තීරණයක් ගන්න වගකීම අපි ගන්න ඕනා.ඒ නිසා ඔයාගේ වැඩේ දිගටම කරගෙන යන්න.නැවත වාරයක් මෙ වැනි දේ සිදු වෙන්න දෙන්න එපා.නීත්‍යානුකූල විදිහට සල්ලි හදලා දිගට ම ව්‍යාපාරය කරගෙන යන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය

ඔයා නීත්‍යානුකූල ව ලිපියක් අරගෙන ක්‍රමවේදයකට කරන්න.අපිත් සහයෝගය දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මැතිතුමා

කරවිට මන්ත්‍රීතුමා කිව්ව විදිහට වසන්ත මහතා පිළිගත්තා වරදක් වුණා කියලා.සමාව ඉල්ලා ඒක එතනින් ඉවත් කර ගන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ආදායම් පරීක්ෂක ලා අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවධර්න මහතා

බෝඩ්වල සල්ලි ටික එකතු කර ගත්තේ නැති නම් මොකක් ද මේ සභාව.මේවා තමයි ප්‍රශ්න.ප්‍රාදේශීය සභාවක පළමු අරමුණ තමයි වරිපනම් බදු සහ අනිත් බදු එකතු කර ගන්න එක.ඒකවත් කරලා නෑ.වසන්ත මහතා කියන විදිහට එතුමාගෙන් පසුගිය අවුරුද්දේ බෝඩ්වලට සල්ලි අරන් නෑ.ඒක එයාගේ වරදක් නෙමේ.දැන් ඒ මහත්තයා මෙතනට ඇවිත් ඒක කිව්වා.දැන් එහෙම සල්ලි එකතු නොකළ කී දෙනෙක් මේ සභාව ඇතුලේ ඇද්ද.මේකේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන්න.නිලධාරීන් විසින් බදු අයකරගන්න ඒවා කරන්න.

ඒ.කේ.පී වසන්ත මහතා

තවත් මන්ත්‍රීවරු මේ ගැටළුව සම්බන්ධ ව කතා කළා කියලා මම දන්නවා.මින් ඉදිරියට මෙහෙම දෙයක් වෙන්නේ නෑ.මේ වුණ සිදුවීම සම්බන්ධ ව මම කණගාටුව ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

දැන්වීම් පුවරු ගැන අපි නැවත කමිටු වාතර්ාවේ තොරතුරු ලැබුණ පසු ඉදිරි සභා වාරයේ දී සාකච්ඡා කරමු.ඒ වගේම සභාවේ සේවිකාවක් අත්තනෝමතික ලෙස අත්සන් කරලා වැටුප් ලබාගෙන තියෙනවා.සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී වශයෙන් කටයුතු කරන නිකේෂලා කියන සේවිකාව අත්සන් ලේඛනයේ **(214)** අතරමැදින් දාලා අත්සන් කරලා තියෙනවා.රුල්වලට පිටින් දාලා අත්සන් කරලා තියෙනවා.ඊට අමතර ව ලේකම් මිස් **8.30** දාලා ඉර ගහලා අත්සන් කළාට පස්සේ එයා ඊට යටින් **8.05** දාලා අත්සන් කරනවා.එතකොට ඒ දත්ත ලේකම්තුමිය ද කවුරු වෙනස් කළා ද කියලා දන්නේ නෑ.ඒ වෙනස් කරපු දත්තත් මං ගාව තියෙනවා.එතකොට මේ සම්බන්ධයෙන් විමසීමක් කළා ද? මේවට කවුරු හරි වගකියන්න ඕනා. ඇවිල්ලා මාස ගාණකින් එයාට මේ සභාව ඇතුලේ ආදේශක පත්වීමකුත් ගහලා තියෙනවා.ඒ සම්බන්ධ ව මේ සේවිකාව ගෙනත් අහන්න.ඊට එහා මේ සම්බන්ධ ව ගත්ත ක්‍රියාමාගර්ය මොකක් ද?පඩි හැදුවේ කොහොම ද?කියලා කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

ලේකම්තුමිය උත්තර දෙන්න.

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය

මන්ත්‍රීතුමා ඒක මට එදා කිව්වාට පස්සේ මම ලිඛිත ව මගේ ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරීතුමියට ඒ වරද සිදු වූ කාලයේ දී ොතාරතුරු වාතර්ා කරන්න දැනුම් දුන්නා.එම නිවාඩු විෂය රාජකාරි තනතුරේ හිටපු නිලධාරිනිය නෙමේ දැන් වෙනත් නිලධාරිනියක් ඒ රාජකාරිය ඉටු කරන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඇයි ඒ?මේ සිදුවීම ආරංචි වුණාට පස්සේ එයාව මාරු කළා ද?

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය

නෑ,විෂය අවශ්‍යතාවය මත ඒ නිලධාරිනිය පුලිවල මාරු කළේ.ප්‍රීතිකා මිස් හිටියේ නිවාඩු විෂයේ.චින්ද්‍යා මිස් ආවාට පස්සේ ප්‍රීතිකා මිස් ව මිශ්‍ර ආදායම් එකට දැම්මා.එතකොට ප්‍රධාන කළමනාකරන සේවා නිලධාරීතුමිය හරහා නිවාඩු විෂය සම්බන්ධ නිලධාරිනියට භාර දුන්නා.ඒ අය නිවාඩු ලේඛන පරීක්ෂා කරලා වාතර්‍ාවක් දුන්නා.අපේ ඒ ක්‍රියා පිළිවෙල අනුව මුලින් ම ඇයගෙන් අපි නිදහසට කරුණු අහනවා.එතනට වෙනකන් දැන් ඇවිත් තියෙන්නේ.ඊට පස්සේ තමයි අභ්‍යන්තර විගණන නිලධාරී හරහා ඉතුරු ක්‍රියාමාගර්වලට යන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා

නිලධාරීන්ගේ අත්සන් ලේඛනය සම්බන්ධ ව නවක නිලධාරිනියක් නිසා විෂය නිලධාරිනියට යුතුකමක් තියෙනවා ඒ වරද කරන්න එපා කියලා ඒ බව දැනුවත් කරන්න.ඊට පස්සේත් මේක කරනවා නම් ලිඛිත දැනුවත් කිරීමක් ඕනා. එහෙම අදාළ විෂය නිලධාරිනිය දැනුම් දීලා තියෙනවා ද?

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය

එහෙම කරලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා

එහෙනම් සම්පූණර්යෙන් ම නිලධාරිනියගේ වරදක් තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

එතකොට ලේකම්තුමිය ව  දැනුවත් කරලාත් නෑ. මහෙමෙ වංචාවක් කරනවා අත්සන් කරද්දි කියලා.දැන් ඔබතුමිය මේ කියන සේවිකාවගේ පෞද්ගලික ලිපි ගොනුවට ලියුමක් දාලා තියෙනවාද මෙයා මෙහෙම අත්සන් කරනවා කියලා.

ගරු ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් ලේකම්තුමිය

ප්‍රධාන කළමනාකරන සේවා නිලධාරීතුමිය හරහා විෂය නිලධාරියා ෙගන් ඒ ප්‍රකාශය ගන්න දීලා තියෙන්නේ. අපි ඒ ගැන විමශර්නයක් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මේකේ විමශර්නය කරන්න දෙයක් නෑ.මේකේ අත්සන් ලේඛනය බැලුවාම ඕන කෙනෙක්ට පේනවා අතරින්  අත්සන් දාලා තියෙන ඒවා.ඔබතුමියට හැම දෙයක් ම මම හොයලා දෙන්න ඕනනේ. ලබන සභාව වෙනකම් උත්තරයක් දෙන්න ඉන්න බෑ.මේ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල්වලින් ගත්ත සල්ලි මේ සේවකයෝ එකතුවෙලා ගෙවල්වලට ගෙනියන්නේ. මම කියන් නෑ හැම සේවකයෙක් ම ඔහොමයි කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මේකෙ කොච්චර හොරකම් හෙව්වත් වැඩක් නෑ,මේකේ යන්නේ මේ පාලනය නම්.මේ පාලනය යන තාක්කල් මේ හොරකම් වැහෙනවා.මේකේ අපි හැමදාම ප්‍රශ්න ගැන කතා කරනවා.ඒවාට උත්තර හොයන්න සති ගණන් ඉල්ලනවා හැමදාම.මේ සභාවේ අපේ කාලේ ඉවර වෙන කම් මේක යනවා.මම නම් කියන්නේ සභාපතිතුමා ඉල්ලා අස්වෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මේ සභාවේ දෙන්නෙක් මේ වැඩේ කරලා තියෙනවා.2022 මැයි මාසේ මේ වැඩේ වෙලා තියෙන්නේ.මේ සේවිකාව වංචා කරලා ලබා ගත්ත වැඩි මුදල් අය කරගන්න කටයුතු කරන්න.මෙයා ඇවිත් මාස තුනෙන් ම ආදේශක පත්වීමක් ගහලා.අවුරුදු 7,8 ඉන්න අය ඉන්නවා මේ පත්වීමක් ගන්න බැරි ව.මේවා හරි අසාධාරණ වැඩ.අර විදුලි අංශෙ අවදානම් වැඩ කරන අය ඉන්නවා ඒ අය තාම ඉන්නේ රු.700,800 දෛනික වැටුපට.අනිත් කාරණය මේ සේවිකාව ලිපියක් දීලා තියෙනවා.ඒකේ කියලා තියෙන්නේ වැටුප් මදි කියලා.මේ වැරදි වැඩවලට අනුබල දෙන්න එපා.සතියක් ඇතුලත මේකට වාතර්ාවක් හදලා දෙන්න.මේකට අපි ගන්න පුළුවන් ඉදිරි ක්‍රියාමාගර් ටික ගන්නවා.

ඒ වගේම තව දුරටත් න්‍යාය පත්‍රයේ 12 ඉඳන් 19 වෙනකන් තියෙන ගෙවීම්වලට සේවකයන් කවදාද ආවේ,කොහේට ද අනුයුක්ත කරලා තියෙන්නේ,කී දෙනෙක් ඉන්නවාද ආදී වශයෙන් ලැයිස්තුවක් අවශ්‍ය කරනවා.ඒක අපිට ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දශර්න ජයසේකර මහතා

දැන් මේ සභාවේ මෙච්චර වෙලා කතා කරපු හැම කාරණාවකට ම වැරදිකාරයෝ ලෙස අපට වැටහෙන්නේ සභාපතිතුමාත්,ලේකම්තුමියත් සහ ඔවුන්ගේ අදූරදශර්ී පාලනයයි.ඒ වගේ ම ඔබ දෙපලගේ මුදල් පාලනය පිළිබඳ ව අපට විශ්වාසයක් නැහැ.දැන් මේ කැබ් රථයේ පින්තාරු කිරීම් සහ අනෙකුත් සභා කටයුතු සම්බන්ධයෙන් අවිශ්වාස නිසා ගරු ලලිත් සිරිවධර්න මැතිතුමා බෙදීමක් යෝජනා කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒකට අපි අමාත්‍යාංශයට යවනවා මේකට පරීක්ෂණයක් ඉල්ලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දශර්න ජයසේකර මහතා

නෑ අපි බෙදීමක් යෝජනා කරන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සීයට අසූවක් විතර මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු දැන් සභාපතිට,ලේකම්ට විරුද්ධයිනේ.මේකට මම අපේ කණ්ඩායමත් එක්ක සාකච්ඡාවක් කැඳවන්නම්.ඒ වගේ ම ලලිත් මන්ත්‍රීතුමා ගෙනාව යෝජනාව අමාත්‍යාංශයට යවන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දශර්න ජයසේකර මහතා

හරි බෙදීමකට යන්නැතුව මේ යෝජනාව යවනවා නම් ඒක යවන දිනය අපට දෙන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සතියක් ඇතුළත යවන්න පුළුවන්.

..................................................කාරක සභාව අවසානයි...........................................

**6.2** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම් රම්සාන් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

**6.2.1.** දැනට මේ රටේ පවතින ආර්ථික අබර්දය හේතුවෙන් සභාව මඟින් ජනතාවට ලබා දෙන පහසුකම් අඩු වී ඇති බැවින් මතුගම පොදු වෙළඳපොළ තුළ පිහිටි දැනට වසා දමා ඇති එළහරක් මස් කඩය ටෙන්ඩර් කර බදු දී එයින් ලැබෙන ආදායම සභාව හරහා ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා

මස් කඬේ වහපු වෙලාවේ කිව්වේ ඒ ආදායම වෙන ආදායම් මාගර්යකින් ලබා ගන්නවා කියලා.නමුත් ඒක සභාවට ඉටු කරගන්න බැරි වුණා.ඒ වගේ ම සභාවකින් ජනතාවට දෙන පහසුකම් ටිකත් ලබා දෙන්න අපට බැරි වුණා.ඒ නිසා මෙතනින් ජනතාවට විශාල මුදලක් අය කරගන්න පුළුවන්.ඒකෙන් ලොකු ආදායමක් ලබා ගන්නත් පුළුවන්.එහෙම තියෙන ආදායම නැති කරගෙන මහජනතාවට පහසුකම් දෙන්න බැරි වුණා ම සභාව අපහසුතාවයට පත් වෙනවා.එනිසා මේක විවෘත කරලා ලැබෙන ආදායම අරගෙන අපි ජනතාවට පහසුකම් දෙමු කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවධර්න මහතා

මතුගම පොදු වෙළඳපොළ තුළ පිහිටි එළහරක් මස් කඩය ටෙන්ඩර් කර බදු දීමෙන් ආදායමක් ලබාගන්නයි රම්සාන් මැතිතුමා යෝජනා කර තිබෙන්නේ.මේක ටෙන්ඩර් කරලා බදු දෙන්නේ නැවතත් එළහරක් මස් කඩයක් සඳහාම ද කියන එක මේ යෝජනාවේ මට පැහැදිලි නෑ.කොහොම නමුත් මේ එළහරක් මස් කඩය වහන වෙලාවේ ඒක වහන්න එපා කියපු තැන මම හිටියේ.ඒ වෙලාවේ මට මෙතන නොයෙක් දේශන දුන්නා.මම ඇත්තටම මේකට විරුද්ධ ව අධිකරණ ක්‍රියාමාගර්යකට යන්නත් කතා කළා.මම නම් හැම මස් ජාතියම කන කෙනෙක්.එදා විරුද්ධ වූ අය මේ වෙනුවෙන් අද දරණ මතය මොකක්ද කියන එක මම දැනගන්න කැමති.එදා කිව්වනේ අපි ඔය හරක් මස් විකුණලා ආදායම් හොයන් නෑ කියලා.හැම අයවැය විවාදයක දී ම මම කිව්වා මේ සභාවේ ආදායම මේ ඉන්න මන්ත්‍රීවරු විශාල වශයෙන් අඩු කරගත්තා කියලා.මේ එවට අපි ගෙනාපු යෝජනා.එ නිසා මම අහන්නේ එදා එළහරක් මස් කඩය එපා කියපු අය අද මොකද කියන්නේ.මම අහන්නේ එච්චරයි.මම එළහරක් මස් කඩයට කොයි අවස්ථාවකවත් විරුද්ධ වුණ කෙනෙක් නෙමෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

මම මගේ පෞද්ගලික අදහස ප්‍රකාශ කරන්නේ.දැන් මේ මස් කඩය ආපසු සදාකාලිකවම අරින්න බැරි විදිහට එදා යෝජනාව සම්මත කළේ.එහෙම එකක් සම්මත කරලා තියෙද්දී කොහොමද මේවා දාන්නේ කියලා මම දැනගන්න කැමතියි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සදාකාලික කියලා එකක් යෝජනා වුණේ නෑ.මස් කඩය වසා දැමීමේ යෝජනාව විතරයි ආවේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ අතුල මහතා

මාස හයකට පස්සේ ආපසු පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

මාස හයකට පස්සේ දාන්න ඕන එහෙනම් ඒක.දැන් අවුරුදු කීයක්ද සභාවට දාලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා

මම ඇත්තෙන්ම රම්සාන් මන්ත්‍රීතුමාටත් මේ යෝජනාව සම්මත කරපු හැමෝටමත් ගොඩක් පිං දෙනවා.අපි ඉන්නේ 21වන සියවසේ.දණගස්සලා බෙල්ල කැපුවත්,අපිට සල්ලි දුන්නත් අපි මේ යෝජනාවට විරුද්ධයි.අපට ආගමක්,දහමක් තියෙනවා.එදා අපේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු මේ යෝජනාව ප්‍රතික්ෂේප කළා.නැත් නම් අපේ මතයෙන් සම්මත කර ගත්තා මේ ගව මස් කඩය සදාකාලිකව සභාව පවතින තුරු ටෙන්ඩර් කරන්නේ නෑ කියලා.දැන් මේකේ දාලා තියෙන," දැනට මේ රටේ පවතින ආර්ථික අබර්ුදය හේතුවෙන් සභාව මඟින් ජනතාවට ලබා දෙන පහසුකම් අඩු වී ඇති බැවින් මතුගම පොදු වෙළඳපොළ තුළ පිහිටි දැනට වසා දමා ඇති එළහරක් මස් කඩය ටෙන්ඩර් කර බදු දී එයින් ලැබෙන ආදායම සභාව හරහා ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට පුළුවන් කියලා.දැන් එතකොට ජනතාවගේ ආර්ථික අබර්ුදය නිසා මේ එළහරක් මස් කඩය විවෘත කරන්න කියන්නේ.මම දකිනවා මෙහෙම.මම බෞද්ධයෙක්.එතකොට මතුගම ප්‍රදේශය බෞද්ධ පුරවරයක්.දැන් අපට ආර්ථික අබර්ුදය විසඳගන්න පුළුවන්ද මේ හරක් මස් කඩය ටෙන්ඩර් කරලා.අපි ගිහා කැවත් සත්තු මරලා මස් විකුණලා සභාවක් තියා ජනතාවටවත් කන්න බොන්න දෙන එක මම හිතන් නෑ සුභ දෙයක් කියලා.මම එදත් කිව්වා,අදත් කියනවා,හෙටත් කියනවා මම මේකට පෞද්ගලිකව විරුද්ධයි කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය

මමත් බෞද්ධයෙක් තමයි.එහෙමනම් අර කාගිල්ස් එක,කීල්ස් එක වහන්න ඕන එහෙමනම්.මම එදත් කිව්වේ ඒ කතාව.අදත් කියන්නේ ඒක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය

මේ යෝජනාවට අපි කළින් විරුද්ධ වුණා.ඇත්තටම එදා මතයම තමයි අපි අදත් ඉන්නේ.මම කියන්නේ මේ මස් කඩය දාලා මතුගම ප්‍රාදේශීය සභාවට මුදල් හොයන්න පුළුවන්නම් ඊට වඩා දෙගුණයක් ආදායම හොයන්න පුළුවන්නේ මෙහෙට බාර් එකක් දැම්මොත්.සල්ලි හොයන මාගර් මේකේ ඕන තරම් හැංගිලා තියෙනවා.වංචා දූෂණ වෙලා මේකේ ආදායම් ඇහිරිලා තියෙද්දි

ඒවා නිවැරදි කරලා ඒකෙන් ම ආදායම හොයා ගන්න තිබුණනේ.ඇයි මේ මස් කඩයක් ආයේ දාගන්න හදන්නේ.මේ ගෙනාපු ප්‍රතිපත්ති තීරණය වෙනස් කරනවාට පෞද්ගලිකව මම නම් විරුද්ධයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දශර්න ජයසේකර මහතා

රම්සාන් මැතිතුමා මෙම යෝජනාව නැවතත් කල්යල් බලලා හරිම කාලෙදි යෝජනා කරලා තියෙන්නේ.තියෙන සහයෝගයෙන් ඒක පේනවා.මම එදත් අදත් මේකට විරුද්ධයි.විරුද්ධ වෙන්න හේතු අපි කිව්වා,යෝජනාත් කරා.මස් කඩයට විකල්ප යෝජනා ගෙනත් සභාවේ ආදායම් වැඩි කරගත හැකි ක්‍රියා මාගර් අපි යෝජනා කළා.ඒවා ක්‍රියාත්මක කළේ නෑ.ඒවාට වැඩ පිළිවෙල නොහදා ආපසු මේ යෝජනාව රම්සාන් මන්ත්‍රීවරයා හරහා සභාවට ගේනවා.අපි එදත් අදත් හෙටත් මේකට විරුද්ධයි.ඒකට අපිට සදාචාරාත්මක අයිතියක් තියෙනවා.මගේ පෞද්ගලික විරුද්ධතාවය මම ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා

ප්‍රාදේශීය සභාවක මෙතෙක් නැති වී ඇති ආදායම හරක් මස් කඩයක් දාලා,හරක් මස් කෑල්ලක් කාලා තවත් පාපයකට උර දීලා හොයා ගන්න පුළුවන් ද.ඔයිට වැඩිය අපට බැරි ද මේ සභාව ක්‍රමවත් පරිපාලන රටාවකට ගිහිල්ලා මේ නැති වෙන ආදායම හොයන්න.අපි මේ යෝජනාව මුලින් ගෙනාව දවසේ මේ සභාවේ ආයෙත් මස් කඩ අරින් නෑ කිව්වා.අද ඒ යෝජනාවම ආයේ දානවා.ඒක වැරදියි.එහෙම දානවා නම් ඒකට හේතු ඉදිරිපත් කරන්න ඕනා.එහෙම මොකුත් නැතුව ආපහු මේ යෝජනාව ගෙනත් මන්ත්‍රීවරු අතර බෙදීම් ඇති කරලා අනවශ්‍ය ප්‍රශ්නයක් මේ ඇති කරන්නේ.මම එදා වගේ ම හෙටත් විරුද්ධයි.ඒ වගේ ම කවදාවත් ම මේ මස් කඩය මතුගම දාන්න නොලැබේවා කියා ප්‍රාථර්නා කරමින් මම නිහඬ වනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා

මම හිතන්නේ මස් කඩය සම්බන්ධව එදත් මම විරුද්ධ ව කතා කළා.අර ප්‍රතිපත්තියක් වශයෙන් අපේ බුදු හාමුදුරුවෝ කියලා තියෙනවා නොකළ යුතු වෙළදාම් පහෙන් එකක් වශයෙන් මේ මස් මාංශ වෙළඳාම.ඒ නිසා මේ මස් කඩය සම්බන්ධව මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා

මම මේ රම්සාන් මන්ත්‍රීතුමාගේ යෝජනාවට විරුද්ධව එදත්(2018) ඡන්දය දුන්නා. ඒ ප්‍රතිපත්තිය, ඒ ස්ථාවරත්වය තුළ ඉඳලා නැවත වතාවක් මේ මස් කඩය මතුගමට ගේනවට මගේ විරුද්ධතාවය මම ප්‍රකාශ කරනවා.ඒ වගේ ම 2020 වෂර්යේ සභාවට යෝජනාවක් ගෙනාවා මතකයි,නැවත එළහරක් මස් කඩය සභාවට යෝජනාවක් වශයෙන් එකතු කරන් නෑ

කියලා.එහෙම තියෙද්දී අද මේ යෝජනාව ඇතුළු කිරීම අනවශ්‍ය ලෙස කාලය කා දැමීමක් කියමින් මම එදා වගේම අදත් විරුද්ධ බව ප්‍රකාශ කරමින් නිහඬ වනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

ඇත්තටම මේ යෝජනාව සම්බන්ධව නාමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ යෝජනාවක් වශයෙන් ගේන්නේ නෑ කියන ප්‍රතිපත්තියේ ම සභාව හිටියා.ඒ වගේම තමයි මේකේ පාඩුව ලක්ෂ 25,ලක්ෂ 30ක් පමණ වන බව සඳහන් කරනවා,නමුත් මම අද සතුටු වනවා ඒ මුදල් සභාවට නොලැබීම සම්බන්ධව.මොකද මේ වුණ වංචාවල හැටියට ඒ මුදල් ලැබුණත් මේ සභාවේ අපට හොයන්න බෑ.ඒ නිසා අදත් පසුගිය ස්ථාවරයේ ම ඉන්නවා.මම මේකට විරුද්ධයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

ගරු රම්සාන් මන්ත්‍රීතුමා ගෙනත් තියෙන යෝජනාව ගෙනත් තියෙන විදියම හරිම පරස්පරයි.එතකොට මේකෙන් අදහස් කරන්නේ ම රටේ තියෙන ගැටළුව මේ මස් කඩේ හරහා විසඳන්න පුළුවන් කියන එක.මේ යෝජනාව ගෙන ඒමේ ගැටළුවක් තියෙනවා.අපි පිළිගන්නවා මේ මස් කඩේ වැහුවට යාබද කඩවල හරක් මස් විකුණනවා.ඒක මම පිළිගන්නවා.ඒ නිසා අපට මේවාට කැමැත්තක් ප්‍රකාශ කරන්න බෑ.මේක අපි බෙදීමකට යන්නේ නැතුව මේ සභාවේ යෝජනාවක් ආවා මේක ආපහු සදාකාලිකවම ඕනා නෑ කියලා.ඒ සදාකාලිකවම ඕනා නෑ කිව්ව යෝජනාව ම ආපහු ගෙනැල්ලා තියෙනවා.ඒක කෙහොම ආවද කියන එක ප්‍රශ්නයක්.මේක සම්මත වෙනවා ද නැද්ද මම දන් නෑ,බෙදීමක් යනවාද කියලත් මම දන්නෑ.මේකට අපි මුලින් විරුද්ධ වුණා.දැනුත් හෙටත් විරුද්ධ වෙනවා.ඒකයි මම සභාවන් පිට වෙනකොට කියලා ගියේ සටහන් කර ගන්න කියලා.බැරි වෙලාවත් මේ යෝජනාව සම්මත වුණොත් මාවත් ඒකට අහුවෙන නිසා.මම මේකට එදත් අදත් හෙටත් විරුද්ධයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

මේකේ කෙළින් ම කියන්නේ අපි හරක් මස් ටික විකුණලා සල්ලි අරන් ජනතාවට සහන දෙන්න ඕන කියන එක.මේ යෝජනාව පවා කැතයි.ඔයාට සහයෝගය දක්වන්න පුළුවන් විදිහට යෝජනාව දාන්න.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

හරක් මස් නවත්තන්න.හැබැයි හරක් මස් නැවත්තුවා නෙමේ.මේ පෞද්ගලිකව හම්බ කරගන්න දුන්නා.මේ නගරයේ වෙන කඩවල ඇති තරම් හරක් මස් තියෙනවා.ඒක අපි දන්නවා.එතකොට දැන් මම අහන්නේ අපේ පරමාර්ථය ඉටු වුණාද.නැනේ.මේ අපට එන ආදායමට විකුණන්න දෙන් නෑ.හරක් මස් නොකන එක හරි.මෙහේ ඉන්න හරක් මස් කන ජනතාවට මේකෙන් ලොකු අසාධාරණයක් වෙනවා.මමත් මේ යෝජනාවට මුල දී සද්භාවයෙන් ම විරුද්ධ වුණා.හැබැයි මමත් රම්සාන් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ එක කෑල්ලකට විරුද්ධයි.මම දන් නෑ භාෂාවේ විරුද්ධත්වයක් ද කියලා.නමුත් මම මේකට සහයෝගය දෙනවා.හොරට විකුණනවාට වඩා මෙහෙම විකුණන එක හොඳ නිසා මම මේ යෝජනාවට සහය දෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

දැන් මොකක්ද කරන්නේ?අපි තීරණයක් ගමු.ඡන්දයක් තියන්න දෙයක් නැනේ.අපි නිශේධ කරලා දාමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

ඡන්දයක් විමසනවා නම් වෙන වෙන ම මන්ත්‍රීවරුන්ගෙන් විමසන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව එක් එක් මන්ත්‍රීවරයාගෙන් වෙන වෙන ම ඡන්දය විමසීම සිදු කරන ලදී..එහි දී මස්කඩ යෝජනාවට පක්ෂ ව 7 දෙනෙකු ඡන්දය ප්‍රකාශ කල අතර විපක්ෂ ව මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් 15දෙනෙකු ඡන්දය ප්‍රකාශ කර ඇති අතර මන්ත්‍රීවරුන් 3 දෙනෙකු ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර එදින නොපැමිණි මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් 8 දෙනෙකි.එම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නාම ලේඛනය පහත පරිදි ඉදිරිපත් කරමි.

පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු

| | | |
|---|---|---|
| 01.ආර්.ඒ.ඩී.ලලිත් රණසිංහ මහතා | - | ගරු උප සභාපති |
| 02.මද්දුමගේ දොන් අතුල මහතා | - | ගරු ප්‍රාදේශීය සහ මන්ත්‍රී |
| 03.මද්දගේ හින්ටන් ගුණසිරි මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04.මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05.ජේ.කේ.ඩී.පුබුදු මධුරංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06.අයි.එච්.ඩී.ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.සීතා ඩයස් ජයසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරු

| | | |
|---|---|---|
| 01.එල්.එල්. මෙරිල් මුණසිංහ මහතා | - | ගරු සභාපති |
| 02.පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03.කාලංචිදුරගේ මිත්‍රානන්ද මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04.විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05.කසුන් හිරෝෂණ මුණසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06.සංජේ එරංග කරවිට මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.කේ.කේ.ඩී.ලලිත් නිශාන්ත කුලතුංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08.ධම්මික නිමර්ල් විජේසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09.එච්.ඩී.සුරේෂ් දශර්න ජයසේකර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10.දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11.එච්.ඩී.නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12.සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13.කේ.ඩබ්.නිලූකා දශර්නී සිල්වා මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සමන්ත්‍රිනී |

**14.**කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**15.**චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු

**01.**සූරියආරච්චිගේ සුජීව නිමර්ාණ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**02.**හෙලබගේ නිමාලක සුරංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**03.**පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

නොපැමිණි මන්ත්‍රීවරු -
**01.** වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**02.**අධිකාරිවත්තගේ ප්‍රියන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**03.**දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**04.** කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**05.**ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**06.**සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**07.**තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**08.**මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා

දැන් මස් කඩ සම්බන්ධයෙන් ඒ දවස්වල ස්වාමීන් වහන්සේ ගෙන්නලා යෝජනා කළා.ඒ එන ආදායම වෙන මාගර්යකින් හොයලා සභාවට ගේනවා කියලා කිව්වා.මම දාලා තියෙන ආථර්ික අබර්ුදය කියන එකට හැමදේම අයිතියි.ඒතකොට ඒ දවස්වල මස් කඩ වහලා කමර්ාන්ත හදනවා කියලාත් කිව්වා.සත්තු කියලානේ කිව්වේ.එතකොට සභාව යටතේ තියෙන මස්කඩ **2018**වෙනකන් අවුරුදු **30**ක් **35**ක් විවෘත කරලා තිබුණේ.සමහරු මෙතන වුනත් මේ ප්‍රශ්නය **"**ජාතිවාදය**"**වගේ වෙනම තැනකට තමයි ගන්න යන්නේ.අපි හදවතින් කතා කරන්නේ,එක එක්කෙනාගේ වාසිවලට මේ මස්කඩ වහලා දැම්මා කිව්වාට අපි හදවතින් ම කතා කරනවා නම් අයිස්,කුඩු,ගංජා වැනි මත්ද්‍රව්‍ය වගේ මස් කාලා මත් වෙන්නේ නෑ.මේ මස්කඩ රට තුළ තියෙන දේවල්.එතකොට රට,ජනතාව ගැන දෙයක් හිතලා කරනකොට මොකක් ද කරන්නේ කියලා අපි හිතනවා.මේකත් සභාව තුළ තිබෙන කඩයක් වශයෙන් තමයි මම ගත්තේ.ආථර්ික අබර්ුදය වගේ ගැටළුවක් ආවාම ඒක හදාගෙන ඉදිරියට යන්න පුළුවන්.ඒ නිසා ලංකාව පුරා මස්කඩ වහලා මත්ද්‍රව්‍යත් නැතිවෙනවා නම් මම සන්තෝසයි.

**6.3** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**:**

**6.3.1** කමිටුවේ අදහස් සැලකිල්ලට ගනිමින් කසළ කළමනාකරණය සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාන මහතා විසින් කරන ලද යෝජනාව ගරු

ප්‍රදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ගොඩක් දේවල් දීසර් වශයෙන් කතා කරන්න අවශ්‍ය නැහැ.මම ඉල්ලන්නේ ඒකට කඩිනමින් ප්‍රයෝජනවත් වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා. ඒ වගේම අපි දැන් උදේ වැලිමානාන ඉඳලා මතුගමට එනකොට පාර දිගේ ම කුණුබෑග් දාලා. එතකොට ඇත්තෙන් ම මේ රටේ මිනිස්සුන්ගේ විනයක් නැතිකම තියෙන්නේ.මේ වාහනවල එන අය කුණුදාලා,අපේ ට්‍රැක්ටර්ල යන අයට එකතුකර ගන්නත් බැහැ.මේ මිනිස්සුන් ව අල්ලලා දඬුවම් කරන්න ඕනා.එක මනුස්සයෙක්ව හරි අල්ලලා උසාවි දැම්මා නම් හරි.මොකද පාරේ යන්නවත් බැහැ.ඒ තරම් කුණු බෑග් දාලා පාර දිගටම.එතනින් එහාට අනිත් පැතිවලත් ඒ වගේ තත්වයක් මට හිතෙන්නේ තියෙන්නේ.ඒ නිසා මේ සතිය ඇතුළත වැඩ පිළිවෙලක් සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**6.3.2** පොදු වෙළඳපොළ ගැටළු ගැන වෙළඳ සංගමය සහ වෙළඳ මහතුන් සමඟ සාකච්ඡා කර පොදු වෙළඳපොළ නගා සිටු වීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

ඇත්තටම දැන් පොදු වෙළඳ පොළේ ආදායම රුපියල් ලක්ෂයකට විතර බැහැලා තියෙනවා.ආදායම් මාගර් ගොඩාක් ඇහිරිලා.සමහර අය දැන් පොළට එන්නේ නෑ.වටේම එළවළු කඩ වැටිලා.මම කියන්නේත් මේ අය එක්ක සාකච්ඡා කරලා අපි ආදායම් ගන්න වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා.ඒ වාගේ ම දින පොළක් සඳහා යම් කිසි කොටසක් වෙන් කරලා ඒ ටිකේ දවස ගානේ පොළ කරගෙන යන්න පිරිසක් තෝර ගන්න.ඒකෙන් අපේ සභාවට ආදායමක් ගන්න පුළුවන්.

**6.3.3** මතුගම-අළුත්ගම පාරේ උඩගෙපළ ටයර් වෙළඳසැල ආසන්නයට පදික මාරුවක් ලබා දෙන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

ඒ වගේ ම මතුගම උසාවිය ළඟ හැරුණාම ශාන්ත මේරි පාසල ළඟ තමා කහඉරක් තියෙන්නේ.එතන ළමා උද්‍යානයක් තියෙනවා,ප්‍රාදේශීය ලේකම් කායර්ාලය තියෙනවා.ටියුෂන් යන ළමයි මාරු වෙනවා.තැපැල් කන්තෝරුව පාරටත් වාහන හරවනවා.ඒ නිසා ගොඩාක් අනාරක්ෂිතයි.මේ නිසාවෙන් මං තීරුවක් සකසා දෙන මෙන් අපි ඉල්ලා සිටිනවා.

**6.4** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-

**6.4.1** පාරිභෝගික සේවා අධිකාරී නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සභාවේ ආදායම් නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වෙළඳසැල්වල ඇති අත්‍යවශ්‍ය භාණ්ඩයන්ගේ මිළ පරීක්ෂාවකට ලක් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න

මහත්මිය විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

පළමු යෝජනාව පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අපේ සභාවේ නිලධාරීන් ව මැදිහත් කරගෙන මෙම ආර්ථික අවපාතයට ලක් වී ඇති මොහොතේ වෙළඳ සැල්වලින් භාණ්ඩ අධික මිළට විකිණීමට එරෙහි ව ගරු සභාවේ මැදිහත්වීම හරහා පාරිභෝගික සේවා අධිකාරියේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් වැටලීම් ක්‍රමයක් සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.මොකද මම ජීවත් වන ගල්මත්ත උප නගරයක්.නගරයේ එකම ද්‍රව්‍ය, කඩ කිහිපයක වෙන වෙන ම මිළ ගණන්වලට තමයි අලෙවි වෙන්නේ.ආර්ථික වශයෙන් මිනිසුන් බොහෝ පීඩනයට ලක් වී ඇති මොහොතේ මෙය ඉතාමත් අසාධාරණ තත්වයක්.මේ ආයතන සම්බන්ධීකරණය කරලා මේ ගැන හොයා බලන එක මේ සභාවේ වගකීමක් වනවා.ඒ යෝජනාව සම්බන්ධීකරණය කරලා ඉදිරියට ගෙන යන මෙන් ඉල්ලා සිටිනවා.

**6.4.2** මීගම කමර්ාන්ත පුරයට අයත් කමර්ාන්තශාලාවලින් නිකුත් වන පරිසරයට අහිතකර දුම හා අධික ශබ්දය පාලනය කිරීමට සභාව මැදිහත් වී කටයුතු කරන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

මේ යෝජනාව මම මීට පෙරත් සභාවට ඉදිරිපත් කරනු ලැබුවා.කමර්ාන්තපුරය ඇත්තටම තියෙන්නේ ජ්‍යෙෂ්ඨ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී. මිත්‍රානන්ද මහතාගේ බල ප්‍රදේශයේයි.මමත් ඒ ආසන්නයේ ඉන්නේ.අපිත් දැඩි ලෙස අපහසුතාවයට පත් වෙනවා.ඒ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මිත්‍රානන්ද මන්ත්‍රීතුමාගේ කලාපයට අයත් බෝලකැල්ල ජනපදය,රිටිකැටිය,ඉදිගස්තුඩුව ප්‍රදේශයට මේ දුම නිකුත් වෙනවා.මේවා දුම් කවුළු මඟින් තමයි මුලින් උඩු ගුවනට යැව්වේ. අපි දිගින් දිගටම බලපෑම් කරපු නිසා තත්වය වුණේ.නමුත් දැන් දුම් කවුළු පාවිච්චි නොකර ඊට පසුපස වෙල් ආශ්‍රිත ප්‍රදේශයට කෙළින් ම දුම පිට කරනවා.මේ නිසා දැඩි ලෙස ප්‍රදේශයට අනතුරක් සිදු වනවා.රාත්‍රී කාලයේ දී නින්දට බාධා වන අයුරින් ශබ්දය පිට ෙවනවා.ඒ පිළිබඳ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**6.4.3** අප සභා බල ප්‍රදේශය තුළ තිබෙන වී ගොවිතැන කිරීමට නොහැකි පුරන් කුඹුරු වෙනත් වගාවන් සඳහා දිරි ගැන්වීමට අවශ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

මගේ අවසන් යෝජනාව, මම ගිය සභා වාරයේ දීත් පුරන් කුඹුරු පිළිබඳ ව කතා කරා.වගාවට අවශ්‍ය කරන නිලධාරීන් ව සම්බන්ධ කරගෙන,සෑම ග්‍රාමසේවා වසමක ම කෘෂිකමර් සංවධර්න උපදේශක නිලධාරීවරයෙක් ඉන්නවා.වසර ගණනාවක් තිස්සේ කිසි ම වැඩකට ගන්නේ නැතිව මේ පුරන් කුඹුරු විනාශයට පත්වෙලා තියෙනවා.මීට ආදේශක වගාවන් වශයෙන් සහ පවතින ආර්ථික අපහසුතාවයන් නිසා මේ බිම් අපතේ යාමට නොදී ප්‍රයෝජනයක් ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ගරු සභාපතිතුමාගේ සහ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ මැදිහත් වීමෙන්,අවශ්‍ය

නිලධාරීන් සම්බන්ධ කරගෙන අතුරු භෝග වගා කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් සැකසීමට මැදිහත් වන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී මිත්‍රානන්ද මහතා

**6.4.2,** මේ සම්බන්ධයෙන් කතා කරන විට මේක කමර්ාන්ත පුරයක්.අපි කීප වතාවක් ම මේ සම්බන්ධයෙන් ඇතිවෙච්ච ප්‍රශ්නවලදී අපි මැදිහත් වෙලා මේක නවත්තන්න ගියා.පරිසර අධිකාරියෙනුත් ඇවිත් ඒ සියලුම දේවල් කරනවා.අපි මොනවා කළත් මේක නවත්තන්න පුළුවන් තත්වයක් නෑ.ඉතින් ඒක අපට ලොකු ගැටළුවක්.දැන් මේ රටේ තත්වයත් එක්ක බැලුවාම මේ කරන නිෂ්පාදන අපේ රටේ නිෂ්පාදන.මේක විශේෂයෙන් බලපවත්වන්නේ මෙල්වා කමර්ාන්තශාලාව සඳහායි.ඒක යකඩ උණු කරන කමර්ාන්ත ශාලාවක්.පරණ යකඩ නිසා තමයි මෙතන ගැටලුව වෙලා තියෙන්නෙ. මේ කමර්ාන්ත ශාලාවේ දුම යන්න උඩට දාලා තියෙන දුම් කවුළු නෙමෙයි මේගොල්ලො ක්‍රියාත්මක කරන්නේ. හිටපු ගමන් පහළින් දුම යවනව. එතකොට තියෙන ගෙවල් වලට වදිනවා. ඒකටත් අපි වැඩ පිළිවෙළක් යෙදුවා. නමුත් පරිසර අධිකාරිය ඒක්ක අපිට තකර් කරන්න වෙලා තියෙන්නේ. එහෙනම් මේ කමර්ාන්තපුරය වහලාදාන්න ඕනා. ඒකට අපිට ශක්තිය නෑ. ඒක මහා ආණ්ඩුවෙන් කරන්න ඕනා දෙයක්. අපි කණගාටු වෙනවා ඇත්තටම. කමර්ාන්තපුරය දැම්මෙ ප්‍රදේශයේ කමර්ාන්ත දියුණු කරල ප්‍රදේශයට යහපතක් වෙන්න ඒක දැම්මේ. නමුත් අපිට මෙතන ලොකු ගැටළුවක් වෙලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා

විශේෂයෙන්ම මේ වනවිට හොරවල ප්‍රදේශයෙත් මේ කළු කඩ මිළ ක්‍රියාත්මක වෙනවා.මොකද කිසි ම මිළ පාලනයක් නෑ.ඒ වගේ ම සෑම භාණ්ඩයක ම මිළ අද වන විට කඩ හිමියාගේ අවශ්‍යතාවය මත තමයි විකිණෙන්නේ.රටේ තියෙන ආර්ථික අබර්ුදයට මුහුණ දෙන මිනිසුන්ට කඩ මාපියාව තුළ සිදු වන වංචනික ව්‍යාපාරය නවත්තන්න මේ සභාව සහ පාරිභෝගික සේවා අධිකාරිය දැනුවත් කර ඉතා ඉක්මනින් කඩිනම් වැඩ පිළිවෙලක් සලසන්න කියන ඉල්ලීම කරමින් මේ කාලීන යෝජනාව කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතාට ස්තූතිය පුද කරමින් මම නිහඬ වනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

ඇත්තට ම පාරිභෝගික සේවා අධිකාරියක් මේ රටේ නෑ වගේ තමයි හැසිරෙන්නේ.මේක සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනා අත්සන් කරලා මේක පාරිභෝගික සේවා අධිකාරියට යවන්න ඕනා හරිනම්.මේක හොඳ යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා

අපේ කරවිට මන්ත්‍රීතුමාගේ යෝජනාව ඇත්තෙන් ම කාලෝචිත යෝජනාවක්.මම හිතන්නේ ඒ ගැන හැමෝම වැඩිදුර අදහස් දැක් වූ නිසා මම කතා කරන්න යන්නේ නෑ.අපේ ප්‍රදේශවලත් ඒ වගේම තමයි.මේ පාරිභෝගික සේවා අධිකාරියේ අය නිකන් වැටුප් අරගෙන ජනතාවට සේවයක් නොකර ඉන්නවා.ඒ නිසා අපි ඒ ගැන කණගාටු වෙනවා.අනිත් එක තමයි මීගම කමර්ාන්ත

පුරයට අයත් කමර්ාන්තශාලාවලින් නිකුත් වන පරිසරයට අහිතකර දුම සහ අධික ශබ්දය පාලනය කිරීමේ යෝජනාව. මම හිතන්නේ 2012 දිත් යෝජනාවක් ගෙනාවා.ඊට පස්සේ ඔය ප්‍රදේශවල නිරීක්ෂණ කටයුතුවලට පවා ගියා.අවසානයේ දී මේකට විසඳුමක් ලැබුණේ නැහැ.අන්තිමේ දී මම ගම් කිහිපයක් රැස් කරලා ලොකු පිකටින් එකක් කළා.

එවකට අපේ පිකටින් එක සහ ගම්වාසීන්ගේ විරුද්ධත්වය පුවත් පත් වල පල වුණේ නෑ.මේක තව කළත් මම හිතන් නෑ පල වෙයි කියලා.හේතුව තමයි එයාලගේ දැන්වීම් රූපවාහිනී මාධ්‍යට ලොකු ආදායමක් ගේන එක.එ නිසා මේ සම්බන්ධ ව එදා මම පියවර කිහිපයක් ගත්තා.ඒ නිසා රැම්කෝ,මෙල්වා කියන ආයතන පරිසරය දූෂණයට ලක්වෙන පරණ යකඩ දාලා තමයි ක්‍රියා කරවන්නේ.එදා අපි ගියාට පස්සේ ඒ වෙනදාට දාන පරණ යකඩ වෙනුවට හොඳ යකඩ දැම්මා.එතකොට දුම අඩුයි.අද මතුගම ජනතාවට නොමිලේ දෙන හුස්ම ටිකවත් ගන්න බැරි වෙලා තියෙනවා.ඒ වගේ ම තමයි මේකට කඩිනම් විසඳුමක් අවශ්‍ය වනවා. ඔබතුමාගේ යෝජනාව කාලෝචිතයි.

6.4.3 යෝජනාව ගැන කථා කරන කොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තිබෙන වී ගොවිතැන කරපු ඉඩම් වල හිටපු ජනපතිතුමාගේ සංකල්පයක් යටතේ කෙසෙල් පැළ වගා කිරීම,හා සුළු බෝග වගාවක් බවට පත්වෙලා තියෙනවා.ඔබතුමා කියපු විදිහට අතුරු වගාවන් සකසා ගෙන තමයි ආවේ.ඒ යෝජනාවත් ක්‍රියාත්මක වුණා.දැනට නම් ඒ යෝජනාව ක්‍රියාත්මක වෙන්ෙන් නෑ.හැබැයි මේ පුරන් කුඹුරු ගත්තාම සමහරක් වෙලාවට පොල් පැළ ඉන්දලා තියෙනවා.ස්ථිර භෝගත් සමහර තැන්වල ඉන්දලා තියෙනවා.ඒ නිසා මේක දීම තුළ දී මම හිතනවා මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කරලා මිනිස්සු දැනුවත් කරලා කරනවා නම් හොඳයි කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා

6.4.2 යෝජනාව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබුණා.යකඩ,අබලි ද්‍රව්‍ය ගේන කොට ඊට පිටින් ආවරණය කරන ලද ප්ලාස්ටික් එනවා.ඒවායින් විෂ දුමාරයක් එනවා.අපි මුලින් ම ඒ ස්ථානයන් පරීක්ෂාවට ලක් කරලා බලන්න ඕනා.මේ දුම් පිටවන එක දකින පිරිස අඩුයි. මේවා බොහෝ වේලාවට උණු කරන්නේ රෑට.ඇත්තටම අපේ රටේ කමර්ාන්තශාලා නැති එක ගැටළුවක් බවට පත්වෙලා තියෙනවා.මේක ඩොලර් උපයන ආයතනයක් වශයෙන් මහජනතාවට පීඩාවක් නොවන ලෙස සකසන්න ඕනා.ඒ නිසා මම යෝජනා කරනවා මන්ත්‍රීවරු සියලු දෙනාම හරි කමක් නැහැ,ගිහින් බලලා උපදෙස් දෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

ඉහත 6.4.2 යෝජනාව සම්බන්ධයෙන් කමර්ාන්ත පුරය ගැන කතා කරනකොට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මද්දුමාගේ මහතා කරපු ප්‍රකශනයක් එක්ක මම අදහස් දක්වන්නේ.කමර්ාන්තශාලා බිහිවෙන්න ඕනා.නමුත් ඒවා ක්‍රමවත් ව පවත්වා ගෙන යනවාද කියලා ඒවාට අදාළ පාශර්වයන් නිරන්තරයෙන් සොයා බලන්න ඕනා.මොකද පරිසර අධිකාරියක් තියෙනවා,පරිසර නිලධාරියෙක් ඉන්නවා.අපි හැමෝටම වගකීමක් තියෙනවා මේ කමර්ාන්තශාලාවලින් ඒ ක්‍රමානුකූල අයුරින් වැඩ කටයුතු සිදු කරනවාද පිළිබඳ ව සොයා බලන්න.මොකද මේවා හරියට කෙරෙනවාද කියලා අපි පරීක්ෂණ කරන්නැනේ.මේවගේ

**කමර්ාන්ත ශාලාවක් පටන් ගද්දි තියෙන්න ඕනා තත්වයන් ටික දෙනවා.ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කරනවාද යන්න පිළිබඳ ව සොයා බැලීම සිදු කරන්න ඕනා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

**මේ දාපු යෝජනා සම්බන්ධයෙන් වචන මම කතා කරන්න ඕනා.පරිසර හානිය සම්බන්ධයෙන් කතා කරපු ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක මහතා ඇතුළු පිරිසට බෙහෙවින් ම ස්තූතියි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මිත්‍රානන්ද මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මද්දුමාගේ මහතා ඩොලර් පිළිබඳ ප්‍රශ්නයක් මතුකළා.අපේ බලය ප්‍රයෝජනයට අරගෙන වැරදි දේට පියවරක් ගන්න එකයි කරන්න ඕනා.මේක පොදුවේ සමස්ත ජනතාවටම තියෙන ප්‍රශ්නයක්.ඒ නිසා මේක පහසුවෙන් තකන්න එපා කියලා මම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.අපේ පරිසර කමිටුව සක්‍රීය කරන මෙන් හෝ මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් මේ වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා. සභාවෙන් ක්‍රියාත්මක නොකරනවා නම් තනි පුද්ගලයෙකු වශයෙන් අධිකරණයට යාමට පවා සූදානම් බව මම ප්‍රකාශ කරමින් මගේ අදහස ඉදිරිපත් කිරීම අවසන් කරනවා.**

**6.5** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් ලක්මාල් ජයවධර්න මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා-**

**6.5.1** **අප මතුගම ප්‍රාදේශීය සභාව තුළ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරු සහ වැඩකම්කරු තනතුරු සඳහා ආදේශ පත්වීම් ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් ලක්මාල් මහතා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**6.5.2** **අප මතුගම ප්‍රාදේශීය සභාව තුළ සියලුම මෝටර් රථ සහ යන්ත්‍රවල ඉන්ධන දහනය නැවත පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් ලක්මාල් මහතා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**මේ යෝජනා දෙක ඇත්තටම සභාවට දැම්මේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා සහ මම කතා කරලා. මේ සම්බන්ධයෙන් අපට ලැබුණු තොරතුරක් මත ඇත්තටම අපි සොයා බැලීමක් කරා. එහිදී ඇත්තටම අපට සභාවේ දෛනික වැටුප් ගන්න සේවකයෝ අවුරුදු 6/7 සේවය කරන අයත් ඉන්නවා.ඒ වගේම 2020 මේ සභාවට දෛනික පත්වීම් මත ඇවිල්ලා ආදේශ පත්වීම් ලබා ගත්ත අයත් මේ සභාව තුළ සේවෙය් ඉන්නවා. නමුත් අපිට අපේ මේ සභා කාලය තුළ වැඩකම්කරු සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර කම්කරු පුරප්පාඩු 10ක පුරප්පාඩු තියෙනවා. ඒකට අවශ්‍ය කරන සේවා අවශ්‍යතාවය සපුරපු සේවකයෝ සභාව තුළ ඉන්නවා. ඒ අය වෙනුවෙන් අපට කළ හැකි දෙයක් තියෙනවා නම් මම මේ සභාවට යෝජනා කරන්නේ මේ සේවකයින්ට ඒ බඳවා ගැනීම් කාලය මත එම සේවා පුරප්පාඩු 10 පියවන්න අවශ්‍ය කටයුතු කරන්න කියන යෝජනාවයි. ඒකට මේ මන්ත්‍රීවරු සියල්ල එකඟ වෙයි කියලා හිතනවා.**

අනික තමයි සභාව තුළ තියෙන සියලුම යන්ත්‍ර සූත්‍ර වල තෙල් සම්බන්ධයෙන් නොයෙක් කතා එලියෙන් ආරංචි වෙනවා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතායි මායි ඇවිත් ට්‍රැක්ටරයක් සම්බන්ධයෙන් සොයා බලද්දි ඒ ට්‍රැක්ටරයට 25 L තෙල් ගහලා කිලෝ මීටර් 2යි ගිහිල්ලා තියෙන්නේ.මේවා නිරාකරණයට උත්සාහ කරන්නේ මේ සභාවේ හැම අංශයකම අපට ලැබෙන්නේ නරක තොරතුරු නිසා. ඒ හින්දා සභාව විධිමත් තැනකට ගේන්න මේ යෝජනාවල් දාලා තියෙන්නේ. ඒ නිසා ඒකටත් අවශ්‍ය කරන සහයෝගය ඉන්ධන සම්බන්ධයෙන් සොයා බැලීම සිදු කර නැවත ඒ ධාවන සටහන් නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය

ඉල්ලීමක් කරනවා අපේ සහෝදර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න නාකන්දල මහතා අසනීප වෙලා ඉන්නවා.සියලු දෙනාටම පුලුවන් සහයෝගය දක්වන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

6.5.1 යෝජනාව සම්බන්ධයෙන් කතා කරන්න ඕනා. ඇත්තටම ස්ථිර නැති අඩුම අවුරුදු 6කට වැඩි සේවකයන් (2014 ඉඳන්) ඔවුන් කොපමණ කලක සිට ඉන්නවාද මොකක්ද දැනට තියෙන තනතුර කියලා වාතර්‍ාවක් හදල දෙන්න. දැනට ලැබිලා තියෙන තොරතුරු අනුව ආදේශක පත්වීම් වලට ගහන්න පුලුවන් පුරප්පාඩු තියෙනවා සභාව සතුව. ඒකට තාම කාවවත් අනුයුක්ත කරලා නෑ. ඊළඟ සභා වාරයට කලින් නිවැරදි තොරතුරු ලබා දෙන්න කියන එක කියනවා. මේ මිනිස්සු පව්, ඔවුන් වෙනුවෙන් සාධාරණයක් ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය

තව එක ඉල්ලීමක් තියෙනවා සභාව හරහා කරන්න. පසුගිය දවසක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ ස්වාමීන් වහන්සේ විදේශගත වෙලා ඉන්න අවස්ථාවේ උන්වහන්සේගේ කොට්ඨාශේ “මැණිකේ සබන්” නිෂ්පාදන ආයතනයේ අධිපතිතුමා මට කතා කරලා කිව්වා, එතුමාගේ ආයතනයේ මාසෙක ලාභයෙන් ගැබිණි මව්වරු 10 දෙනෙක්ට බඩු පාසර්ලයක් දෙන්න කැමති කියලා. මම දවසක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායර්ාලයට ගත්තා. නමුත් දුරකථන ඇමතුම ගත්තේ නෑ. ඒ නිසා මන්ත්‍රීතුමිය පුලුවන් නම් ඒ යෝජනාව දාලා මට 10 දෙනෙක් හොයලා දෙන්න කිව්වා මාසෙ අන්තිමට. ඊට පස්සෙ මම ඒක කතා කරලා ඒ අදාළ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියට කිව්වා ඉන්නවානම් 10 දෙනෙක් හොයලා දෙන්න කියලා.

ඒ 10 දෙනා හොයලා ඒක බෙදන්න ඉස්සෙල්ලා මැණිකේ සබන් ආයතනයේ අධිපතිතුමා කිව්වලු මේක මම මන්ත්‍රීවරිය හරහා ගත්තේ. මන්ත්‍රීතුමියටයි හාමුදුරුවන්ටයි මම මේක බෙදනවා කියලා දැනුවත් කරන්න ඕන කියලා. ඒ වෙලාවෙ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායර්ාලයෙන් දැඩි ලෙස විරුද්ධ වුනාලු දේශපාලන අධිකාරිය ගාව ගන්නවා නම් අපි නම් දෙන්නෙත් නෑ, අපි මේකට එන්නෙත් නෑ කියලා. ඒ සම්බන්ධව මම දැඩි ලෙස විරුද්ධත්වය ප්‍රකාශ කරනවා මෙම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායර්ාලයට. මේක හෙලා දැකලා ලියුමක් ගහන්න කියලා මම ඉල්ලීමක්

**කරනවා. මොනම හේතුවකටවත් ඒගොල්ලන්ගේ වැඩසටහනකට ප්‍රාදේශීය සභාවෙන් සහයෝගය දෙන්න එපා. අප්‍රසාදය පළකරලා යවන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා

**ආයතන සම්බන්ධයෙන් කතා කරපු නිසා මම මේ කතා කරන්නේ. මොකද JCB එක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. සෙනොක් ආයතනයට දීලා ලක්ෂ 10ක මුදලක් යනවා කියලා තිබුණා.ඒක අපි කමිටුවට දාලා ඒක හදන්න මම භාර ගත්තනේ. ඒ මැෂින් එක ලක්ෂ 5කට අඩු මුදලකින් කරගෙන යනවා. එතකොට ලක්ෂ 5ක් ඉතුරු කරලා දීලා තියෙනවා. ඒ දීලා තියෙන වොරන්ටි එකට වඩා වොරන්ටි එකක් අරන් දෙනවා ඒ ආයතනය සම්බන්ධයෙන්. එතකොට මේ කම්පැණි කියන එක නිකන් නමට තියෙන ඒවා විතරයි. මීට වඩා දක්ෂ ආයෝජකයෝ ඉන්නවා එළියේ. ඒක නිසා මේ සඳහා අවධානය යොමු කරන්න කියන එක ඉල්ලා සිටිනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාන මහතා

**මේ සභාවේ වාහනයක් කැඩුනාම හදන්නැතුව මාස ගාණක් තියලා තියෙනවා. අද කැඩුනොත් අදම හදන්න ඕනි. ඒ වගේම කියන්න ඕන වතර්මාන ජනාධිපතිට සහ බලශක්ති අමාත්‍යවරයාට ස්තූතිවන්ත වනවා මේ QR ක්‍රමය හඳුන්වා දීම පිළිබඳව.**

**න්‍යාය පත්‍රානුකූලව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව. 4.00 ට පමණ අවසන් විය.**